# දෙසතිය

පුවත් සඟරාව

2026 ජූනි



## සොබාදහමේ ඉකිබිඳුම



# අනුරපුරේ නව රක්ෂිත

2025 වසරේදී ආරම්භ කරන ලද 'වනස්පති' ජාතික වැඩසටහන යටතේ තවත් වනාන්තර 05ක් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කෙරෙනවා. ජූනි මස 05 දිනට යෙදෙන ජගත් පරිසර දිනයට සමගාමී ව මෙලෙස රක්ෂිත ලෙස නම් කරන්නේ රිටිගල, අලියාවැටුණු වැව, බුලාගල, කෝන් කැටියාව. කල්ලංචිය යන වනාන්තර. මේ වනාන්තර 05 ම පිහිටා තිබෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ. මේ වනාන්තර 05හේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2169ක්.

මෙසේ වනාන්තර රක්ෂිත ලෙස නම් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වනාන්තර නිසි ලෙස කළමනාකරණය කරමින්, අලි මිනිස් ගැටුම අවම කරමින් වනාන්තරවල පවතින ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම.

'වනස්පති' ජාතික වැඩසටහන යටතේ 2025 වසරේ වනාන්තර 29ක් රක්ෂිත ලෙස නම් කර ඇති අතර ප්‍රකාශයට පත් කරන මේ වනාන්තර 05 සමඟ වනාන්තර 86ක් 'රක්ෂිත වනාන්තර' ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. 'වනස්පති' ජාතික වැඩසටහනෙන් පසු මේ දක්වා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා අක්කර 170,000ක්.

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**

# දෙසතිය
පුවත් සඟරාව


වෙළුම 48, කලාපය 06,
2026 ජූනි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**ආර්. එස්. ප්‍රින්ටෙක් (පුද්) සමාගම**
නො. 765/2, වඩුවේගම පාර, මල්වාන

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**
48 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව




25 සොබාදහමේ ඉකිබිඳුම



20 නළුකම හා දේශපාලනය



03 වියට්නාමයේ සංවර්ධන උපායමාර්ග




34 නිහඬ අරගලයක කාව්‍යමය සිනමා ප්‍රකාශනය



13 සෙලවෙන රුපියල



40 මතක හිටින පරිවර්තනයක්

# දෙසතිය
පුවත් සඟරාව


**දෙසතිය** සඟරා දයකත්වය

වාර්ෂික දයකත්වය රු. 1920.00
අර්ධ වාර්ෂික දයකත්වය රු. 960.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දයකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ........................................

Address ........................................

........................................

........................................

........................................

ID Number ........................ Tel / Mobile ........................

Signature ........................ Date........................


## සොබාදහමේ ඉකිබිඳුමට සවන් දෙන්න

සොබාදහමට එරෙහි වීමේ ප්‍රතිවිපාක වරින් වර පෙන්වා දෙනු ලැබුවත් සමස්ත ලෝ වැසියා ජීවයේ පවතින බියකරු බව තවමත් වටහා ගත් බවක් පෙනෙන්නට නැහැ. ජීවීන්ගේ හුස්ම රැක දෙන කැලෑ විනාශය, ජල මූලාශ්‍ර අපවිත්‍ර කිරීම, අහිතකර ප්ලාස්ටික් ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම, ෆොසිල දහනයෙන් අහිතකර විෂ වායු පරිසරයට නිකුත් කිරීම ආදී ක්‍රියාකාරම්වල නිරත වෙමින් සිදු කරන පාරිසරික විනාශය හේතුවෙන් අද අප අත්විඳින භයානක ප්‍රතිඵල නුදුරේ ම උග්‍ර වීමේ අවදානමක් පවතිනවා.

දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය සභාව (IPCC) තහවුරු කරන ආකාරයට ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හරිතාගාර වායු අධික ලෙස වායුගෝලයට මුදා හැරීමේ ඍජු ප්‍රතිඵලයක්. දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය ප්‍රකාශ කර තිබෙන්නේ ඉදිරියේදී හරිතාගාර වායු විමෝචනය සැලකිය යුතු ප්‍රතිශතයකින් අඩු නොවුණහොත් මේ සියවසේ ගෝලීය උෂ්ණත්වය 2.9°Cකට ඉක්මවිය හැකි බව. එය පෘථිවිවාසී සියලු ජීවීන්ට අහිතකර ප්‍රතිවිපාක ඇති කරන බවට අනතුරු ඇඟවෙනවා.

ඇතැම් රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද පරිසරයේ උෂ්ණත්වය ඉහළ යාම නිසා දැඩි උණුසුමකින් පීඩා විඳින්නට අපට කලින් කලට සිදු වෙනවා. දෛනික ක්‍රියා පවත්වාගෙන යාමට නොහැකි තරමට සෞඛ්‍යයට බලපාන එම අහිතකර තත්ත්ව නිසා සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරන්නටයි වෛද්‍ය උපදෙස් ලැබෙන්නේ. ලෝක කාලගුණ සංවිධානය පෙන්වා දෙන්නේ කාර්මික විප්ලවයෙන් පසු ගෝලීය උෂ්ණත්වය 1.43°Cකින් ඉහළ ගොස් ඇති බව. මේ පාරිසරික තත්ත්වයේ උණුසුම තවමත් මැකී ගොස් නොමැති මොහොතක ලෝක පරිසර දිනය (ජූනි 05) යෙදී තිබෙනවා.

ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන රාමුව තුළ සහ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ මූලධර්මවලට අනුකූල ව හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමේ ගෝලීය ප්‍රයත්නයට සක්‍රිය ව දායක වෙමින් සිටින නිසා ලෝක පරිසර දින සැමරුමේදී ක්‍රියා කරන්නේ එහි සුවිශේෂ හවුල්කරුවෙකු ලෙස. Urgent Climate Action යන ගෝලීය තේමාවට අනුව පැවැත්වෙන මෙවර ජගත් පරිසර දින සැමරුමේදී 'දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමට ක්‍රියාත්මක වෙමු' යන දේශීය තේමාව යටතේ ශ්‍රී ලංකාවේ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

එම දිනයට සමගාමී ව 'ජගත් පරිසර සතියක්' ප්‍රකාශයට පත් කිරීමට රජය තීරණය කළේ දේශගුණික විපර්යාස, ජෛව විධත්ව හානිය සහ පරිසර දූෂණය යන ත්‍රිත්ව අර්බුදවල (Triple Planetary Crisis) අයහපත් ප්‍රතිඵල සමස්ත මානව ප්‍රජාව ම අත්විඳිමින් සිටින මොහොතක එම බලපෑම අවම කිරීමේ ගෝලීය ප්‍රයත්නයට ශ්‍රී ලංකාවේ මැදිහත්වීම ලබා දීම සඳහා. ඒ අනුව 2026 මැයි 30 සිට ජූනි 05 දක්වා පරිසර සතිය ක්‍රියාත්මක වෙනවා. මෙහිදී පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප වර්ධනය, පරිසර පවිත්‍රතාව, ජෛව විවිධත්ව සංරක්ෂණය, ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණය, රුක් රෝපණය ආදී ක්‍රියාකාරකම් සිදු වනු ඇති.

කෙසේ වෙතත් මේ සියලු ක්‍රියාකාරකම් දිනයකට, සතියකට, මාසයකට, වර්ෂයකට සීමා කරන්නට බැහැ. දිනෙන් සිදු වන දේශගුණික විපර්යාස අවම කිරීම සහ ඊට අනුවර්තනය වීමයි අප කළ යුතු වන්නේ. එනම් සොබාදහමට අවනත ව ක්‍රියා කිරීම පමණයි අපට කළ හැක්කේ. එසේ නොමැති ව සුපුරුදු ලෙස තවදුරටත් හානිකර ක්‍රියාවල යෙදෙමින් සොබාදහමට එරෙහි ව යාමට උත්සාහ කළහොත් එහි ප්‍රතිවිපාක නුදුරේදී ම අත්විඳින්නට වීම වැළැක්විය නොහැකි වේවි.

\- සංස්කාරක -



# වියට්නාමයේ සංවර්ධන උපායමාර්ග

ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න

වියට්නාම් සමාජවාදී ජනරජයේ ජනාධිපති ටෝ ලාම් (**To Lam**) 2026 මැයි 07 දින ශ්‍රී ලංකාවට පැමිණි අතර මැයි 09 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කළා. විදෙස් නායකයෙකු මෙරට පාර්ලිමේන්තුව අමතන ලද්දේ වසර 11කට පසුව. දෙරට අතර සහයෝගිතා ගිවිසුම් ගණනාවක් ද අත්සන් කෙරුණු අතර නායකයන් දෙපළ අතර පැවැතියේ සුවිශේෂ හමුවක් ද පැවැත්වුණා. වියට්නාමය යනු නව සංවර්ධන ගමනේ දශක පහක අත්දැකීම් බහුල රටක් නිසා ශ්‍රීලංකාවට වියට්නාමයෙන් උගෙනීමට බොහෝ දේ තිබෙනවා.

වර්තමානයේ ලෝක ධනවාදය පවතින්නේ අධිරාජ්‍යවාදී යුගයේ. එය වත්මන් ලෝකය දැවැන්ත ඒකාධිකාරි සිය ගණනක බලය හා මෙහෙයුමට යටත් කොටගෙන අවසන්. ගෝලීය වශයෙන් ලෝකය අත්විඳිමින් සිටින්නේ මේ යථාර්ථය. නිෂ්පාදන බලවේගවල වර්ධනයේ ප්‍රතිඵලයක් වන කෘත්‍රිම බුද්ධිය ඔස්සේ අධිරාජ්‍යවාදය විසින් ලෝකය තමන්ට තව තවත් නතුකර ගනිමින් සිටිනවා. එහෙත් ඔවුන් ලෝකයේ සමස්ත සම්පත් හා ධනය අවසන් ලක්ෂ්‍යයකට ගොනු කර ඇති අතර සූරාකෑම හා කොල්ලකාරිත්වය විසින් යුද්ධ බිහි කරනු ලැබුවා. ඔවුන් අවි අලෙවි කළා. යුද්ධ ව්‍යාප්ත කළා. ඉන්ධන අර්බුද බිහි කළා. මිල ඉහළ නැංවූවා, රෝග ව්‍යාප්තියට රුකුල් දුන්නා. ඖෂධ ජාවාරම පුළුල් කළා. කෘත්‍රිම ව අවශ්‍යතා නිර්මාණය කළා. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ අලෙවි කළා. සාමූහික සමාජ සතුට උදුරාගෙන හුදෙකලා පරිගණක ක්‍රීඩා තුළ කොටු කළා. මානව ප්‍රේමය, ආදරය පවා අලෙවි කළා. මිනිසාට යහපත් ලෝකයක් වෙනුවට ලබා දුන්නේ තරගකාරි ලෝකයක්. එහෙත් මිනිස් සමාජයට අවශ්‍ය ව ඇත්තේ නිදහස. ඒ සඳහා තාක්ෂණයේ උපකාරය. මේ දැවැන්ත ගෝලීය කෲරත්වය, හිංසනය හා ගසාකෑම තුළ නූතන සමාජවාදයට උපායමාර්ගික ගමන් මාර්ග සොයාගත යුතු වුණා.

මාක්ස් එංගල්ස් සමාජවාදය ආකෘතිගත කොට තිබුණේ නැහැ. ලොව පළමු සමාජවාදී රාජ්‍යය වන රුසියාවට උපාය මාර්ග සොයා ගැනීමේ අවශ්‍යතාව පැන නැග්ගා. යුරෝපය සමාජවාදය අත්හැර යද්දී රුසියාවට එය අල්ලා සිටින්නට සිදු වුණා. ලෙනින් නම් න්‍යාය ප්‍රායෝගිකත්වයට ගළපා ගත් බුද්ධිමත් නායකයා රුසියාව පළමු සමාජවාදී රට වීමේ වාසි අවාසි, එහි ඓතිහාසික තත්ත්වය හා සලකා ගළපා ගත්තා. ලෙනින් 'නව ආර්ථික ප්‍රතිපත්තිය', 'සමස්ත රුසියාව විද්‍යුත්කරණය' වැනි උපායමාර්ගවල රුසියාව අත්හදා බැලුවා. ලෙනින්ගෙන් පසු රුසියාවට සිදු වූයේ සමාජවාදය ආකෘතිගත වීම ඔස්සේ එය සාම්ප්‍රදායික රාමුවකට කොටු කිරීම. එයින් බැහැර වෙනත් අත්හදාබැලීම් සුළුවෙන් පැවැතුණ ද වඩා පුළුල් ලෙස දුටුවේ ආකෘතිගත වීම. එය කෙතරම් ද යත් සමාජවාදය නිෂ්පාදන ආර්ථිකය වෙත උනන්දු වන අතර තිරසර පරිසර සංවර්ධනය බරපතළ ව සැලකුවේ නැහැ. ධනවාදය ඉක්මවන සමාජය ඇරඹෙන්නේ සමාජවාදී පරිවර්තන අවධියෙන් බව සත්‍යය වුවත් එක් එක් රටක සමාජවාදී උපායමාර්ග නිර්ණය වන්නේ එහි ඓතිහාසික ගමන්මඟ හා වත්මනේ නම් ගෝලීය සන්දර්භයේ. ඒ නිසා තම මාවත ආකෘති තුළ සනිහුත කර නොග නිමින් යන්නට ඒ ඒ අදාළ රට මාවත් තෝරාගත යුතු වෙනවා. ඍකගත යුත්තේ සමාජවාදයේ හරය. වියට්නාම් සමාජවාදී ජනරජයේ උපායමාර්ග කියවා ගත යුතු වන්නේ මේ කාරණය අවධාරණයට ගනිමින්.

1930-1975 නිදහස සහ සමාජවාදය දිනාගත් යුගය, 1975-2025 රට එක්සත් කිරීම සහ 1986 ඩෝයි මෝයි ආර්ථික ප්‍රතිසංස්කරණ, 2026 - 2045 ජාතිය නැඟී සිටීමේ යුගය වශයෙන් වියට්නාම් කොමියුනිස්ට් පක්ෂය තම පසු කළ ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථාන තුනක් දක්වනවා. 'ඩෝයි මෝයි' යනු 'නවීකරණය' යන තේරුම. ඩෝයි මෝයි ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වූ හේතු සාධක කිහිපයක් තිබෙනවා. ඒවා නම් 1970-1980 කාල වකවානුවේ වියට්නාම් ආර්ථිකය කඩා වැටීම, සෝවියට් සංගමය දුර්වල වීමෙන් එහි ආධාර අඩුවීම, ඇමරිකාව ප්‍රමුඛ ජාත්‍යන්තර සම්බාධක ආදිය.

රජයට පමණක් සීමා වී තිබූ ව්‍යාපාරික ක්ෂේත්‍ර පෞද්ගලික අංශයට විවෘත කිරීම, එතෙක් පැවැති සාමූහික ගොවිපොළ ක්‍රමය අහෝසි කොට ගොවියන්ට තම අස්වැන්න නිදහස් වෙළෙඳපොළේ අලෙවි කිරීමේ අවස්ථාව විවර කිරීම, විදේශීය සමාගම්වලට වියට්නාමයේ ආයෝජනය කිරීමට අවශ්‍ය නීති සකස්කර දීම, මිල පාලනය ඉවත් කර වෙළෙඳපොළ ඉල්ලුම සැපයුම මත තීරණය වීමට ඉඩ දීම ඩෝයි මෝයි ප්‍රතිසංස්කරණවල ලක්ෂණ. ඩෝයි මෝයි ප්‍රතිසංස්කරණ ඔස්සේ 1990 මුල පැවැති 70%ක දිළිඳුකම වර්තමානයේ 5% දක්වා අඩු කර තිබෙනවා. සැම්සුන්, ඇපල් (ෆොක්සකෝන්), ඉන්ටෙල් වැනි ලොව

ප්‍රමුඛ සමාගම් තම කර්මාන්ත වියට්නාමයේ පිහිටුවීම ඔස්සේ රට ගෝලීය නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් වුණා. අතීතයේ ආහාර හිඟයෙන් පිරි වියට්නාමය දැන් සහල්, කෝපි, ගම්මිරිස් අපනයනය කරන රටක්. ලොව කෝපි අපනයනයෙන් දෙවැනි ස්ථානය වියට්නාමය. සිව් වැනි ජයග්‍රහණය නම් වාර්ෂික ආර්ථික වර්ධන වේගය සියයට 6-7 අතර තබාගැනීමට හැකිවීම. වියට්නාමය වර්තමානයේ ලෝක වෙළෙඳ සංගමයේ සාමාජික රටක්.

ශ්‍රී ලංකා ජනාධිපතිවරයා හා කොමියුනිස්ට් පක්ෂ ලේකම්වරයා වන ටෝ ලාම් ජාතික පිබිදීමේ යුගය (era of national rise) සංකල්පය ඉදිරිපත් කළා. වියට්නාම් කොමියුනිස්ට් පක්ෂයට වසර 100 පිරෙන 2030 වසර වන විට නවීන කර්මාන්තවලින් යුත් ඉහළ මැද ආදායම් ලබන රටක් බවට පත්කිරීමත් වියට්නාමය විදේශ ආධිපත්‍යයෙන් මිදී නිදහස් රටක් බවට පත්වූ සිය වන සැමරුම පවත්වන 2045 වසර වන විට ඉහළ ආදායම් ලබන දියුණු සමාජවාදී රටක් යන ඉලක්කය සැපිරීමත් ඊට ඇතුළත්. මේ සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම කාරණා 06කින් ඉදිරිපත් කර තිබෙනවා.

එහි පළමු වැන්න වන්නේ උපායමාර්ගික ස්වාධීනත්වය හා බලශක්ති විප්ලවය සඳහා චීන ගල් අඟුරු සහ තෙල් මත යැපීම වෙනුවට හරිත බලශක්ති මධ්‍යස්ථානයක් බවට රට පත් කිරීම සඳහා ලොව විශාලතම සූර්ය සහ සුළං බලශක්ති කලාප ආරම්භ කිරීම. දෙවැන්න රාජ්‍ය ව්‍යුහය අඩක් අඩු කිරීමෙන් පළාත් ඒකාබද්ධ කිරීම ඔස්සේ දිස්ත්‍රික්ක 63ක් 34ක් දක්වා ඒකාබද්ධ කරමින් අත්‍යවශ්‍ය නඩත්තු වියදම් අඩු කර ඒවා අධ්‍යාපනයට හා තාක්ෂණයට ආයෝජනය. ජාතික පිබිදීමේ යුගය සංකල්පය යටතේ දේශීය සමාගම්වලට ලෝකය ජයගැනීමට රජයේ සහය ලබා දීම ක්‍රියාකාරී සැලැස්මේ තෙවැනි කරුණ. උදාහරණ ලෙස FPT තාක්ෂණ සමාගම, VIETELL සන්නිවේදන සමාගම රජයේ පූර්ණ අනුග්‍රහයෙන් ජපානය, ඇමරිකාව, අප්‍රිකානු රටවලට මෘදුකාංග සහ 5G තාක්ෂණ සේවා සැපයීම දක්වන්න පුළුවන්. ගෝලීය සැපයුම් ජාලයට ඇතුළු වීම සිව් වැනි කරුණ යි. එහිදී චීනයෙන් ඉවත්වන කර්මාන්තශාලා තමන් වෙත ආකර්ෂණය කරගැනීමට සහ භාණ්ඩ ප්‍රවාහනය ඉතා වේගවත් කිරීමට කටයුතු කරන අතර ගැඹුරු පුළුල් වාරය ජාලයක් ගොඩනැඟීම, මුහුදු ප්‍රවාහනය නවීකරණය, කාලය සහ පිරිවැය අවම කරමින් ඇමරිකාවට සහ යුරෝපයට භාණ්ඩ ප්‍රවාහනය පිණිස විශාල නැව් එන වරාය ගොඩනැඟීම. සැලැස්මේ පස් වැනි කරුණ වන්නේ ගෝලීය දේශපාලනයේ මධ්‍යස්ථ බව තබාගැනීම. දැනට සුපිරි බලවතුන්ගේ ගැටුම් සමථයකට පත්කරන, ජාත්‍යන්තර සම්මුති අත්සන් කරන මධ්‍යස්ථානයක් බවට වියට්නාමය පත් කර ඇති අතර එක්සත් ජාතීන්ගේ සයිබර් අපරාධ පිළිබඳ නව ජාත්‍යන්තර සම්මුතිය අත්සන් කළේ හැනෝයිවල. සංස්කෘතික අනන්‍යතාව සුරකිමින් නවීකරණය. අධ්‍යාපනය තුළ ඉතිහාසය, සාම්ප්‍රදායික කලාවන් හා ජාතික අනන්‍යතා ඉගැන්වීම සැලැස්මේ හය වැනි කරුණ වෙනවා.

> සැම්සුන්, ඇපල් (ෆොක්සකෝන්), ඉන්ටෙල් වැනි ලොව ප්‍රමුඛ සමාගම් තම කර්මාන්ත වියට්නාමයේ පිහිටුවීම ඔස්සේ රට ගෝලීය නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් වුණා. අතීතයේ ආහාර හිඟයෙන් පිරි වියට්නාමය දැන් සහල්, කෝපි, ගම්මිරිස් අපනයනය කරන රටක්. ලොව කෝපි අපනයනයෙන් දෙවැනි ස්ථානය වියට්නාමය. සිව් වැනි ජයග්‍රහණය නම් වාර්ෂික ආර්ථික වර්ධන වේගය සියයට 6-7 අතර තබාගැනීමට හැකිවීම. වියට්නාමය වර්තමානයේ ලෝක වෙළෙඳ සංගමයේ සාමාජික රටක්.

පොලිස් පුහුණුව සහ විද්‍යාත්මක පර්යේෂණ, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගිතාව, සංස්කෘතික සහයෝගිතාව ශක්තිමත් කිරීම, ආගමික හා සම්ප්‍රදාය ප්‍රවර්ධනය, තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ සහයෝගිතාව යන ගිවිසුම් ජනපතිවරුන් දෙදෙනාගේ හමුවට පසුව අත්සන් කළ ද්විපාර්ශ්වික ගිවිසුම් අතරට අයත්. මෙයට අමතර ව ද්විපාර්ශ්වික එකඟතා 04ක් ද වුණා. ඒ, දෙරට අතර වාර්ෂික ද්විපාර්ශ්වික වෙළෙඳ පිරිවැටුම 2030 වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන 1 දක්වා ඉහළ නැංවීම සහ ඉදිරි ආයෝජන ගිවිසුමකට අත්සන් කිරීම; සංචාරක හා ගුවන්සේවා යටතේ කොළඹ සහ හෝචිමිං ප්‍රදේශ යා කරමින් සෘජු ගුවන් සේවා ආරම්භ කිරීම; කෘෂිකාර්මික වර්ධනය වෙනුවෙන් වියට්නාමය ශ්‍රී ලංකාවට යූරියා සහ සුපර්පොස්පේට් පොහොර මෙට්‍රික් ටොන් 100ක් ලබාදීම; ආයෝජන අවස්ථා විවර කරමින් පුනර්ජනනීය බලශක්තිය, තොරතුරු තාක්ෂණය, සමුද්‍රීය කටයුතු සහ යටිතල පහසුකම් ක්ෂේත්‍රවල වියට්නාම් ආයෝජකයන්ට ආයෝජනය සඳහා ඇරයුම් කිරීම වශයෙන්.

ශ්‍රී ලංකාවේ ඓතිහාසික පරිණාමයත් ඉන් අප අත්පත් කරගත් සංස්කෘතික තත්ත්වයත් රටේ විශාලත්වයේ තරමත් එහි සම්පත්වල ශක්‍යතාවත් රටේ පිහිටීමේ හූ දේශපාලන අනන්‍යතාවත් රට පවතින තත්ත්වයත් සලකා බලා අපගේ සංවර්ධන ඉලක්ක සකසා ගත යුතු වෙනවා. ජනතා බලය බිම් මට්ටම දක්වා තහවුරු කරමින් ජනසහභාගිත්ව ඉලක්ක හා ක්‍රියාමාර්ග නොමැති ව ආණ්ඩුවට පමණක් පෙරට යා නොහැකි යි. සාර්ථකත්වය පවතින්නේ ජනතා බලය උපයෝගි කර ගැනීමෙන්. බලය තහවුරු කර ගනිමින් ගෝලීය ලෝක රටාව තුළ තරගකාරි ඉලක්ක හඹා යනවා මිස අතාත්වික මනෝරාජ්‍යයකට යා යුතු නැහැ.



# පලක් ඇති යලක්



**සඳුනි අරුමප්පෙරුමාච්චි**

කෘෂිකර්මාන්තය යන්න හුදෙක් බීජයක් වැපිරීම නොව එය පුද්ගලයෙකුගේ බලාපොරොත්තු පොළොවට බාර දෙන මොහොතක්. අතේ ඇති කුඩා බීජය ඇතුළේ තිබෙන්නේ ආහාරයක් පමණක් නොව පවුලකට බත් පිඟානක්, දරුවෙකුගේ අනාගතයක්, රටකට ආහාර සුරක්ෂිතතාවක්. මේ අනුව රටක ආහාර සුරක්ෂිතතාව සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරමින් ජනතාවට ඉසුරු සලසන ප්‍රාථමික කර්මාන්තයක් ලෙස කෘෂිකර්මාන්තය හඳුන්වන්නට පුළුවන්.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් යල සහ මහ කන්නය වශයෙන් කන්න දෙකකට වගා කරනවා. යල කන්නය නිරිත දිග මෝසම් වර්ෂාවත් සමඟ ආරම්භ වන අතර මහ කන්නය ආරම්භ වන්නේ ඊසාන දිග මෝසම් වර්ෂාවත් සමඟ. පසුගිය වර්ෂවල යල කන්නයේ හෙක්ටයාර් ලක්ෂ 5ක් ද මහ කන්නයේ හෙක්ටයාර් ලක්ෂ 8ක් ද කුඹුරු ඉඩම් වගා කර තිබෙනවා. මේ වගා කරන ප්‍රමාණය වරින් වර වෙනස් වන්නේ ලැබෙන වර්ෂාපතනය සහ අනෙකුත් සම්පත් මත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) ජී. ජී. වී ශ්‍යාමලී පෙන්වා දෙන ආකාරයට 2025 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ සමස්ත දායකත්වය 8.4%ක්. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණයේ සඳහන් ආකාරයට කෘෂිකර්මාන්තය සඳහා ශ්‍රම දායකත්වය පවතින්නේ 25.7%ක අගයක.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට පසුගිය කාලය එතරම් සුබදායී වුණේ නැහැ. දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් පසු ජනතාව නැවත සාමාන්‍ය ජීවිතයට හැඩ ගැසෙමින් සිටියදී මැදපෙරදිග යුද ගැටුම් ආරම්භ විමත් සමඟ පොහොර, ඉන්ධන සහ අනෙකුත් කෘෂි යෙදවුම්වල මිල ගණන් ඉහළ යාමෙන් ගොවි ජනතාවට මුහුණදීමට සිදු වුණේ යම් යම් අසීරුතාවලට. මෙවැනි පසුබිමක කෘෂිකර්ම ක්ෂේත්‍රය ජයගැනීම රට හමුවේ තිබෙන අභියෝගයක්.

2026 මැයි 14 දින හම්බන්තොට ලුනම, හාතාගල, බෝලටියායේදී 'ඉසුරු ගෙනෙන යලක්' නමින් සමාරම්භය සනිටුහන් කළ කෘෂිකර්ම ප්‍රවර්ධන ජාතික වැඩසටහන මෙවැනි මොහොතක රජය ගත් සාධනීය පියවරක්. නිල වශයෙන් හම්බන්තොට ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් මෙය ආරම්භ වුව ද ඊට පෙර සිට ම අම්පාර වැනි දිස්ත්‍රික්කවල යල කන්නය වගා කිරීම ආරම්භ කර තිබුණා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරි මාර්ග හා වාරි කළමනාකරණ අංශ හා ගොවි ජනතාවගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක මේ වැඩසටහන හුදෙක් වගා ව්‍යාපෘතියක් පමණක් නොව ගොවි ජනතාව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් ද වනවා.

දිට්වා සුළි කුණාටුව සමඟ පසුගිය මහ කන්නයේ වගා බිම් ගණනාවක් හානි වුවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් හා ආපදාවෙන් හානි නොවූ බිම්වල නැවත වගා කිරීමෙන් ආහාර හිඟයක් ඇති නොවන ආකාරයෙන් කෘෂි බෝග කළමනාකරණ කර ගැනීමට හැකි වූ බවත් නිරන්තරයෙන් අභියෝගවලට මුහුණපාන කෘෂිකර්මාන්තයේ හෙට දවස වෙනුවෙන් 'ඉසුරු ගෙනෙන යලක්' වැඩසටහන රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීමට ගොවියාට නව මාවතක් විවෘත කර දෙන බවත් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) ජී. ජී. වී ශ්‍යාමලී පවසනවා.

අදහස් දක්වන ඇය: "වී, අතිරේක ආහාර බෝග හා එළවලු වගාවේ අස්වනු ප්‍රවර්ධනය 'ඉසුරු ගෙනෙන යලක්' වැඩසටහනේ එක් අරමුණක්. අඩු පිරිවැයකින් වැඩි නිෂ්පාදන ධාරිතාවක් ලබා ගැනීමට අවශ්‍ය සැලසුම් පිළිබඳ ගොවියන් දැනුවත් කිරීමත් මෙහිදී සිදු කරනවා. ඒ අනුව මෙවර යල කන්නයේ වගා කිරීමට අපේක්ෂා කරන්නේ හෙක්ටයාර් ලක්ෂ 5ක්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් වී වගාව ඉලක්ක කර ගත්තත් අතිරේක ආහාර භෝග සහ පලතුරු වගාවටත් අවධානය යොමු කරනවා. විශේෂයෙන් බඩඉරිඟු, මුං, කව්පි, උඳු, රටකජු, සෝයා බෝංචි, මිරිස්, රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, තල, කුරක්කන් යන අතිරේක බෝග 13ක් දේශීය ව වගා කිරීමෙන් ඒ සඳහා වැය වන ආනයන වියදම අඩු කර ගැනීමත් දැනට වගා නොකරන කුඹුරු ඉඩම්වල අතිරේක බෝග වගාව ප්‍රචලිත කිරීමත් මෙහිදී අපේක්ෂාවක්. එසේ ම පිදුරු ගිනි තැබීම වැළැක්වීම, දහයියා අගුරු හා කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම, අතුරු කන්නයේ මුං වගා කර පාංශු පෝෂකත්වය දියුණු කිරීම, ඒකාබද්ධ පලිබෝධ පාලනයෙන් පලිබෝධ නාශක භාවිතය අවම කිරීම සඳහා ගොවියන්ට අප මග පෙන්වනවා."

සුහුරු තාක්ෂණය ගෙවත්තට රැගෙන ඒමත් මේ වැඩසටහනේ තවත් අරමුණක්. මේ යටතේ ගෙවතු වගාව දිරිමත් කරමින් කුඩා ඉඩම් සඳහා ගැළපෙන නවීන වගා තාක්ෂණය හඳුන්වා දෙන අතර කුඩා කණ්ඩායම්ගත ව්‍යාපෘතිවලින්

පවුලේ පෝෂණයට අත්වැලක් සැපයීම, අතිරික්ත ආහාර කල් තබා ගැනීම, ආහාර සංරක්ෂණය, අගය එකතු කළ නිෂ්පාදන ලෙස අලෙවි කිරීම සිදු කෙරෙනවා.

මේ වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැර ව තාක්ෂණික ක්‍රියාකාරකම් මාලාවක් ආරම්භ කර තිබෙන නිසාත් එළඹෙන යල කන්නය සාර්ථක කර ගැනීමට එය දායක වනු ඇති. දේශගුණ සහ කාලගුණ අභියෝගවලට ඔරොත්තු දෙන නවීන කෘෂි තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම, බීජ හා පැළ නිෂ්පාදනය, ජල කළමනාකරණය හා වගා ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වීම ඊට අයත්.

අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරිය පෙන්වා දෙන ආකාරයට ආහාර අපතේ යාමට පිළියමක් ලෙස පසු අස්වනු තාක්ෂණය මගින් කෘෂි නිෂ්පාදනවලට අගය එකතු කිරීම පිළිබඳවත් මේ වැඩසටහනෙන් ගොවියන් දැනුවත් කරනවා. එහිදී අස්වනු නෙළීමේ සිට වෙළෙඳපොළට ළඟා වන තෙක් 20%-40%ක පමණ මට්ටමේ පවතින එළවළු හා පලතුරු අපතේ යාම අවම කෙරෙන අතර ආහාර, බෝග ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බෙදා හැරීමේදී සිදු වන හානිය පිළිබඳවත් ගොවියන් දැනුවත් වීම ඉතා වැදගත්.

තරුණ පිරිස් අතීතයේ පැවති සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට වැඩි රුචියක් නැති නිසා වර්තමානයේ ඔවුන් කෘෂිකර්මාන්තයෙන් ඈත් වෙමින් සිටිනවා. මීට පිළියම් වශයෙන් ආහාර සැකසුම්, ඇසුරුම්කරණය වැනි යන්ත්‍රසූත්‍ර ආධාරයෙන් සිදු කෙරෙන කර්මාන්ත සඳහා තරුණ පිරිස එකතු කර ගැනීම ඵලදායී වනු ඇති. තරුණ ප්‍රජාව තුළ ව්‍යවසායකත්වය ගොඩනැංවීමෙන් ඔවුන් නැවත කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමත් මෙහිදී වැදගත්. අනාගතයේ ශ්‍රම හිඟය වැඩි වෙමින් පවතින පසුබිමක සීමිත මිනිස් ශ්‍රමය වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක්. මේ නිසා වන්නේ නිෂ්පාදන වියදම ඉහළ යාම. එබැවින් මේ වැඩසටහන යටතේ වගා කිරීමට අවශ්‍ය බිම් සකස් කිරීමේ සිට සියලු කාර්ය යන්ත්‍ර භාවිතයෙන් සිදු කිරීමට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කරමින් තිබෙන අතර නව ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව ගැන ගොවියන් දැනුවත් කරන බවත් ඇය පවසනවා. ආරක්ෂිත ගෘහවලින් ස්වාභාවික උවදුරු, කෘමි උවදුරු සහ පාරිසරික වෙනස්කම්වලින් ආරක්ෂා වෙන්නට පුළුවන්. ඒ හේතුවෙන් පලිබෝධ නාශක සඳහා වැය වන වියදම අඩු කර ගැනීමත් මේ වැඩසටහනේ අරමුණක්.






2026 යල කන්නයට අලුත් බලාපොරොත්තු එක් කළ මේ දීප ව්‍යාප්ත වැඩසටහනෙන් ගොවි ප්‍රජාවට සැලසෙන සෙත ඉමහත්. ගොවි සමිති සවිබල ගැන්වීම මෙහි ප්‍රමුඛ කාර්යයක්. ගොවියන් කණ්ඩායම් ලෙස එකතු වීමෙන් තමන්ට මුහුණ පෑමට සිදුවන ගැටලු අවම කර ගන්නට පුළුවන්. ගොවියා තුළ සාමූහිකත්ව ආකල්ප වර්ධනය වී සියල්ලන් එක් අරමුණකට එකතු වී ක්‍රියා කිරීම ඵලදායී වනවා. රටක තිරසර සංවර්ධනයට සාමූහිකත්වය ඉතා වැදගත්. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම, කෘෂි යන්ත්‍රසූත්‍ර හා යෙදවුම්, කෘෂිකාර්මික ණය පහසුකම්, රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා වූ සම්බන්ධීකරණය මේ වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සිදු කරන හෙයින් එය ද ගොවියන්ට ගෙන දෙන්නේ ඉතා පහසුවක්.

කෘෂිකාර්මික අභිවෘද්ධිය උදෙසා කෙතරම් වැඩසටහන් තිබුණ ද වී වගාවට මෙන් ම අනෙකුත් වගා කටයුතුවලට තාක්ෂණ භාවිත කිරීමට තවමත් ගොවියා මැළිකමක් දක්වනවා. කෘෂි බෝගවලින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට සහ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට තාක්ෂණ භාවිතය අත්‍යවශ්‍ය වූවක්. මේ නිසා තාක්ෂණය භාවිත කර අස්වැන්න වැඩි කිරීම ගොවියාගේ වගකීමක් වන අතර ආහාර නාස්ති නොකර පරිභෝජනය කිරීම පාරිභෝගිකයාගේ වගකීමක්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගුවන්විදුලිය, රූපවාහිනිය, 'කෘෂි ගොවියා' ජංගම දුරකතන යෙදුම සහ ජාතික කෘෂිකර්ම තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය ඔස්සේ නිරන්තරයෙන් නවීන තාක්ෂණය ගොවියන් වෙත ලබා දෙන නිසාත් ගොවියන්ට තිබෙන ගැටලු සහ අවශ්‍ය දැනුම සතියේ දිනවල රාජකාරි වෙලාවේ 1920 දුරකතන සේවාවෙන් ලබා ගැනීමට අවස්ථාව උදාකර දී තිබෙන නිසාත් එය ද මේ වැඩසටහනේදී ඵලදායී ව යොදා ගැනීමට හැකි වනු ඇති.

මේ සියල්ල ක්‍රියාත්මක වන පසුබිමක ගොවි ජනතාවට තමන්ගේ නිවසේ තමන්ට හැකි පරිදි බෝග වගා කර තිරසර සංවර්ධනයට දායක විය හැකි නම් එමගින් 'ඉසුරු ගෙනෙන යලක්' නිර්මාණය කර ගැනීම අපහසු නැහැ.



# ගල් මලේ ශෝකාන්තය

**රංගිකා අබේසේකර**

මුහුදු වෙරළ ආශ්‍රිත ව සුන්දරත්වය විඳින සංචාරකයන්ගේ නෙත ගැටෙන විශේෂ පරිසර පද්ධතියක් ලෙස කොරල්පර හඳුන්වන්න පුළුවන්. මීට දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාව වටා පිහිටා තිබූ සුන්දර කොරල්පර පද්ධතිය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය නොමඳ ව දිනා ගත්තා. එහෙත් කාලයත් සමඟ ස්වාභාවික හේතු සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඒවා ක්‍රමයෙන් විනාශ වී යන ආකාරයයි දක්නට ලැබෙන්නේ.

එලෙස විනාශ වී යන කොරල්පර අනාගත පරපුර වෙනුවෙන් සුරැකීමත් ඒවා නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමත් කාලීන අවශ්‍යතාවක්. එය යථාර්ථයක් බවට පත් කරන්නට වෙර දරන ආයතනයක් වන්නේ ශ්‍රී ලංකාවේ මුහුදින් පරිබාහිර ව පිහිටි කොරල්පර සංරක්ෂණය හා නැවත රෝපණය කිරීමේ පර්යේෂණ මධ්‍යස්ථානය. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති Progreen මධ්‍යස්ථානයයි ඒ. මෙය ඉංජිනේරු විද්‍යාවට පමණක් සීමා නොවී පරිසරය හා බැඳුණු තිරසර සංවර්ධනයට, පාරිසරික තිරසාරත්වයට, නව නිර්මාණ හා පර්යේෂණයට යොදා ගැනෙනවා. මෙහි සුවිශේෂත්වය වන්නේ සිදු කරන පර්යේෂණ පොතට පමණක් සීමා නොකර ප්‍රායෝගික ව සමාජයට එළදායී ලෙස දායාද කිරීම. ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නෛතික අවසරය ලැබී තිබෙනවා. මේ පර්යේෂණ මධ්‍යස්ථානය ආරම්භ කර තිබෙන්නේ 2018 වසරේ. මෙහි පර්යේෂණ කාර්යය ජාතික හා අන්තර්ජාතික විශ්වවිද්‍යාලවල ආචාර්ය මහාචාර්යවරුන්ගේ සහ විද්‍යාර්ථීන්ගේ සහභාගිත්වයෙන් සිදු වෙනවා.

මෙහි කොරල් වැවීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මහාචාර්ය රංගික හල්වතුර; "ලෝකයේ කොරල් ප්‍රතිෂ්ඨාපන ක්‍රමවේද තිබෙනවා ගණනාවක්. ඒ ක්‍රමවේද අනුකරණය කරමින් ලංකාවට ගැළපෙන ක්‍රමවේද අත්හදා බලමින් සිටිනවා. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කැඩී යන කොරල් කුඩා අංශු බවට පත් කර, අවශ්‍ය පරිසර තත්ත්ව යටතේ තහඩුවක කොරල් මාස හයක් පමණ වර්ධනය වීමට සලසනවා. ජල ටැංකිවල (Nurseries) එම කොටස් අඟල් භාගයේ සිට අඟලක් වන තෙක් වර්ධනය කර ඒවා මුහුදට අනුගතවීමට ඉඩ සැලසීමේ ක්‍රියාවලියක් තිබෙනවා. මෙහිදී වතුර ටැංකිවල තත්ත්වය පවත්වා ගැනීම, රෝග පාලනය, දෛනික ව ඒවාට අවශ්‍ය ආහාර ලබාදීම හා රැකබලා ගැනීම වැදගත් ම සාධක. පර්යේෂණ මධ්‍යස්ථානයේ පරිසර තත්ත්වයට වඩා මුහුදේ පාරිසරික තත්ත්වය වෙනස්. ඒ නිසා සෑම සතියක ම මුහුදේ රෝපණය කළ කොරල් සම්බන්ධයෙන් ප්‍රගතිය සොයා බලනවා".

මේ කොරල්පරවල පැවැත්ම හා අවශ්‍යතාව පිළිබඳ දැනුවත් කිරීමට ජාතික සහ ජාත්‍යන්තර ආයතන කිහිපයක් ම මොරටුව විශ්වවිද්‍යාලය සමඟ එක් වී සිටිනවා. ඒ, බේරුවල සිනමන් බේ හෝටලය සහ වරාය අධිකාරියේ බස්නාහිර පර්යන්තය මූල්‍ය අනුග්‍රහය ලබාදෙමින්.

වසර දහස් ගණනක සිට බුහුබාවන්ගේ කොලනියකින් සෑදෙන ඉතා ඝනකම් සැකිල්ල කොරල්පරයක් ලෙසින් හඳුන්වනවා. කොරල්පරයක් නිර්මාණය වන්නේ අපෘෂ්ඨ වංශික ගණයට අයත් වන කුඩා, මෘදු විනිවිද පෙනෙන සතෙකු වන බුහුබාවා සාගර ජලයේ ඇති කැල්සියම් කාබනේට් අවශෝෂණය කරගෙන තම ශරීරයට පිටින් සැකිල්ලක් නිර්මාණය කර ගැනීමෙන්.

ශ්‍රී ලංකාවේ කොරල්පර සංරක්ෂණය හා කළමනාකරණය සඳහා පනත් 2ක් යටතේ නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ අතර ප්‍රධාන වන්නේ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (Fauna and Flora Protection Ordinance). මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ සියලු ම කොරල් විශේෂ ආරක්ෂිත ජීවීන් ලෙස නම් කර තිබෙනවා. එහිදී කොරල්පර එකතු කිරීම, හානි කිරීම, විනාශ කිරීම හා කොරල්පර ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් පරිසර පද්ධතියට බාධා කිරීම සපුරා තහනම්. වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ පනත (Coast Conservation and Coastal Resource Management Act) යටතේ වෙරළ කලාපයේ (සාගරය දෙසට 2kmක් දක්වා) සිදු වන සියලු ම සංවර්ධන කාර්ය පාලනය කෙරෙන අතර වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොර ව කොරල්පර හෝ වෙරළ කලාපය ආශ්‍රිත ව හෝ එවැනි ක්‍රියා සිදු කිරීම නීති විරෝධී වනවා. කොරල්පර කැණීම සහ හුණු නිෂ්පාදනය සඳහා කොරල් යොදා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම්. මේ පනත් දෙකට අමතර ව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරී පනතෙන් (Marine Environment Protection Authority Act) සිදු වන්නේ කොරල්පර ආශ්‍රිත ව සිදු වන සාගර දූෂණය පාලනය හා සමුද්‍රීය පරිසර පද්ධති ආරක්ෂා කිරීම.

මත්ස්‍ය වර්ග මෙන් ම වෙනත් ජලජ ජීවීන් රැසකට වාසස්ථාන සහ ආහාර සපයන පරිසර පද්ධතියක් වන කොරල්පරවල මුහුදු ජීවීන්ගේ අභිජනනයට සුදුසු

පරිසරයක් පවතිනවා. ධීවර කර්මාන්තයට වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය වීම, වෙරළට ආසන්න ව බැම්මක් ආකාරයෙන් නිර්මාණය වී තිබීම නිසා වෙරළ ඛාදනය වළක්වන බාධකයක් ලෙස ක්‍රියාත්මක වෙමින් මුහුදු රළේ වේගය අඩු කිරීම කොරල්පරවලින් ලැබෙන වාසි.

මහාචාර්ය රංගික හල්වතුර සඳහන් කරන ආකාරයට ශ්‍රී ලංකාවේ දෘඪ කොරල්පර ප්‍රභේද 168-170ක් පමණ තිබෙනවා. කොරල්පර සැදෙන්නේ විශේෂිත උෂ්ණත්ව යටතේ නිසා උෂ්ණත්ව විපර්යාස කොරල්පරවල වර්ධනය කෙරෙහි බලපානවා. සාගර උෂ්ණත්වය ඉහළ යාම සහ සාගර රසායන විද්‍යාව වෙනස් වීම කොරල් පරිසර පද්ධතිවලට ඇති විශාලතම ගෝලීය තර්ජනය. මේ තර්ජන ඇති වන්නේ වායුගෝලීය උෂ්ණත්වය සහ මුහුදු ජලයේ දිය වී ඇති කාබන් ඩයොක්සයිඩ් මට්ටම වැඩි වීම හේතුවෙන්. වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යන විට මුහුදු ජල උෂ්ණත්වය ද ඉහළ යාම සිදු වනවා. එයයි ස්වාභාවික ව කොරල්පර විනාශ වීම කෙරෙහි බලපෑම් ඇති කරන්නේ.

මිනිස් ක්‍රියාකාරකම් නිසා කොරල්පර විනාශ වීම ප්‍රබල ව සිදුවන්නක්. එහිදී ඩයිනමයිට් යොදා සිදු කරන නීත්‍යානුකූල නොවන මාළු ඇල්ලීමේ ක්‍රම කොරල්පරවලට සිදු කරන්නේ දැඩි හානියක් බවයි මහාචාර්ය රංගික හල්වතුර සඳහන් කරන්නේ. එලෙස ඩයිනමයිට් භාවිත කිරීමේදී ඇති වන කම්පනය නිසා කොරල්පර දෙදරා ගොස් විනාශ වනවා. යාන්ත්‍රික බෝට්ටු නතර කිරීමට නැංගුරම් භාවිත කිරීමේ දී ද නැංගුරම් මුහුදු පත්ලට බැස්සවීම නිසා කොරල්පර සීරියාම සහ කැඩීයාම සිදු වනවා. ප්ලාස්ටික්, පොලිතීන්, කැළිකසළ මුහුදට යෙදීම නිසා කොරල්පරවලට සිදුවන හානිය වැඩියි. සංචාරකයන්ට අලෙවි කිරීම සඳහා ඇතැම් පිරිස් අනවසරයෙන් කොරල් කැඩීම සිදු කරනවා. මෙලෙස කොරල්පර විනාශ වීම පරිසර පද්ධතියට මෙන් ම ආර්ථික වශයෙන් ද ඇති කරන්නේ අහිතකර බලපෑම්. වෙරළ ඛාදනය වීම හේතුවෙන් වෙරළ සංරක්ෂණය සඳහා රජයට අධික වියදමක් දැරීමට සිදු වීම, ආහාර දාමවල අසමතුලිතතාව ඇති වී ධීවර කර්මාන්තය අකර්මණ්‍ය වීම, සංචාරක පැමිණීම අඩු වීම හේතුවෙන් වෙරළාසන්නයේ තිබෙන ස්වයං රැකියා සම්පූර්ණයෙන් නතර වීම ඉන් කිහිපයක්.

මහාචාර්ය රංගික හල්වතුර පවසන පරිදි කතාබහට ලක් වන්නේ නොගැඹුරු මුහුදේ කොරල්පර පිළිබඳ ව. ඊට අමතර ව ගැඹුරු මුහුදේ ද කොරල්පර තිබෙනවා. බේරුවල (මොරගල්ල), හික්කඩුව, ගාල්ල, පොල්හේන, තංගල්ල (පරවිවැල්ල), ත්‍රිකුණාමලය (පරවි දූපත්), මන්නාරම හා පුත්තලම වැනි ප්‍රදේශ මෙරට නොගැඹුරු මුහුදේ කොරල් සහිත ප්‍රදේශ. ඒවායින් හික්කඩුව කොරල්පරය 90%-95%ක් පමණ මියගොස් ඇති බවත් බේරුවල මොරගල්ල කොරල්පරය සම්පූර්ණයෙන් ම මියගොස් ඇති බවත් මහාචාර්ය රංගික හල්වතුර පෙන්වා දෙනවා. මෙරට කොරල්පරවල නීතිමය අයිතිය ඇත්තේ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. මුහුද සහ වෙරළ ආරක්ෂාවට වගකිව යුතු ආයතන තිබුණත් ඒවායෙහි සංවිධානාත්මක ඒකාබද්ධ වැඩපිළිවෙළක් දක්නට නොලැබෙන බවයි ඔහුගේ අවධාරණය.

**මුහුදු වෙරළ ආශ්‍රිත ව සුන්දරත්වය විඳින සංචාරකයන්ගේ නෙත ගැටෙන විශේෂ පරිසර පද්ධතියක් ලෙස කොරල්පර හඳුන්වන්න පුළුවන්. මීට දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාව වටා පිහිටා තිබූ සුන්දර කොරල්පර පද්ධතිය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය නොමඳ ව දිනා ගත්තා. එහෙත් කාලයත් සමඟ ස්වාභාවික හේතූ සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඒවා ක්‍රමයෙන් විනාශ වී යන ආකාරයයි දක්නට ලැබෙන්නේ.**

කොරල්පර විනාශ වීම වැළැක්වීම සඳහා ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වන්නේ මේවායෙහි ඇති වැදගත්කම සම්බන්ධයෙන් රටේ ජනතාව දැනුවත් කිරීම. ඔවුන්ට මේ සම්බන්ධයෙන් ඇත්තේ අල්ප අවබෝධයක්. ජනතාවගේ සාක්ෂරතාව නොමැතිකම නිසා නිවැරදි ක්‍රමවලින් ඔබ්බට ගොස් අනීතික ධීවර ක්‍රම සඳහා ඔවුන් යොමු ව තිබෙන බවත් මේ නිසා නීතියෙන් පමණක් මෙවැනි පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීමට සිදු ව තිබෙන බවත් මහාචාර්යවරයා පවසනවා.

කොරල්පරවල පැවැත්ම සඳහා ඒ පිළිබඳ පර්යේෂණ සහ සංරක්ෂණය ඉතා වැදගත්. ශ්‍රී ලංකාවේ තවමත් ඒ සඳහා විධිමත් වැඩපිළිවෙළක් සැකසී නැහැ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය රංගික හල්වතුර; "ඒ ඒ රටවලට පර්යේෂණ සිදු කිරීමට නොහැකිනම් මුහුද ආශ්‍රිත රටකට හෝ පැමිණ පර්යේෂණ සිදු කරනවා. ඒ නිසයි කොරල් ආශ්‍රිත ව රටේ කර්මාන්තයක් නිර්මාණය වීම වැදගත් වන්නේ. බොහෝ රටවල් ඒ තත්ත්වයට ගොස් අවසන්. කොරල් පිළිබඳ නිරන්තරයෙන් පර්යේෂණ කරන මාලදිවයින කොරල් සංරක්ෂණයටත් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයටත් මහත් ආයාසයක් දරනවා. මෙපමණ මුහුදු තීරයක් සහ විවිධ ප්‍රභේදවල කොරල්පර මෙරට තිබුණත් අපට එවැනි සංරක්ෂණ ක්‍රියාවලියකට යාමට හැකි වී නැහැ. එය ඛේදවාචකයක්. ශ්‍රී ලංකාවේ එවැනි පර්යේෂණ සිදු නොවන තරම්. කොරල් හෝ පර්යේෂණ අවශ්‍යතාව ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් හෝ පර්යේෂණ සිදු කරන්නේ ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ දැනුමක් සහිත සුළුතර පිරිසක් පමණයි. එහිදී ලැබෙන ඵලදායිතාව අවමයි. එහෙත් ලෝකයේ ගැඹුරු පර්යේෂණ සිදු කරනවා. ශ්‍රී ලංකාවේ එවැනි පර්යේෂණ සමාජගත වී නැහැ. කොපමණ ආයතන සහ විශ්වවිද්‍යාල මෙරට පැවතියත් කොරල් සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කළ හැකි පර්යේෂණාගාරයක් ලංකාවේ නිර්මාණය වෙලා නැහැ".

ශ්‍රී ලංකාවේ කොරල් පිළිබඳ පර්යේෂණ සහ සංරක්ෂණ අවශ්‍යතාව වෙනුවෙන් ප්‍රථම වරට පර්යේෂණාගාරයක් නිර්මාණය කිරීමට පියවර ගෙන තිබීම සතුටට කරුණක්. මහාචාර්ය රංගික හල්වතුර සඳහන් කරන පරිදි එහි අවශ්‍ය නීතිමය පසුබිම සිදුකර අවසන් අතර ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හික්කඩුව ප්‍රදේශයේ ඉඩමක් මොරටුව විශ්වවිද්‍යාලය වෙත පවරා දී තිබෙනවා.

එම පර්යේෂණාගාරය ඇඹෙන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති Progreen මධ්‍යස්ථානය කොරල් පිළිබඳ පර්යේෂණ සහ සංරක්ෂණ කාර්යය වෙනුවෙන් දරන උත්සාහය මෙහිදී ඇගයීමට ලක් කළ යුතුයි.



# ඉවත් වීමේ වරම

නුවන් කුමාර කටුගම්පල

රටේ බන්ධනාගාරගත වන පිරිසෙන් වැඩි සංඛ්‍යාවක් විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට හසු වූ අය බවත් තරුණ පිරිස මේ උවදුරට ගොදුරු වන ප්‍රධානතම කණ්ඩායම බවත් සමීක්ෂණවලින් හෙළි ව තිබෙනවා. පසුගිය කාලවකවානුවල පළ වූ මාධ්‍ය වාර්තා අනුව බන්ධනාගාරය සහ පොලිසිය ඇතුළු රාජ්‍ය ආයතන රැසක ඇතැම් දූෂිත නිලධාරීන් අතළොස්සක් ද මේ ජාවාරමේ ගොදුරු බවට හෝ කොටස්කරුවන් බවට හෝ පත් වූ අවස්ථා තිබුණා.

විෂ මත්ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීම සඳහා 'රට ම එකට ජාතික මෙහෙයුම' වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ යෝජනාව 2025 ඔක්තෝබර් මස 13 දින ජනාධිපතිවරයා කැබිනට් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළා. ඊට අනුමැතිය ලැබී ක්‍රියාත්මක වීමත් සමඟ මත්ද්‍රව්‍ය ජාවාරම හා බැඳුණු රටේ අභ්‍යන්තර හා ජාත්‍යන්තර ජාවාරම් ජාලයට රජය පෙනෙන්නට පටන් ගත්තේ 'නයාට අඳු කොළ වගේ'. එම පාර්ශ්වවල අභියෝගාත්මක මැදිහත්වීම්වලට යටත් නොවී සටන තවදුරටත් ශක්තිමත් කිරීමට රජය ස්ථාවර තීරණයකට එළැඹුණේ එවැනි තත්ත්වයක. මෙසේ 'හදිසි හා කඩිනම් ජාතික වැඩසටහනක්' ඉලක්කගත කාල රාමුවකදී මත්ද්‍රව්‍ය ජාවාරමට සහ ඇබ්බැහියට එරෙහිව සමාජය බලගැන්වීමටත් විධිමත් ඔත්තු සේවා, වැටලීම්, අත්අඩංගුවට ගැනීම්, නීතිය හමුවට පැමිණවීම් සහ පුනරුත්ථාපන ක්‍රියාවලියක් දියත් කිරීමටත් රජයට හැකි වීමේ ප්‍රතිඵලය වන්නේ ජාවාරම්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය ක්‍රමක්‍රමයෙන් අඩාල වීම.

රටේ විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ජාතික උපද්‍රවයක් තරමට ඔඩු දුවා ඊට කේන්ද්‍රීය ව අපරාධ හා දූෂණ රැල්ලක් වර්ධනය වන වාතාවරණයකුයි රටේ පැවතුණේ. වත්මන් දේශපාලන නායකත්වය, කාර්යක්ෂම තීරණ ගැනීමේ රාජ්‍ය යාන්ත්‍රණය සහ පුළුල් මහජන සහභාගිත්වය සහිත ජාතික මට්ටමේ වැඩසටහනක් ලෙස මේ වැඩසටහන ක්‍රියාත්මක කරමින් ඉදිරියට යන්නේ එම වාතාවරණයට එරෙහි ව. ඊට ලැබුණු මහජන ප්‍රසාදයේ ආශීර්වාදය ඇති ව පුළුල් ප්‍රචාරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් සමාජය දැනුවත් කිරීම, විෂ මත්ද්‍රව්‍ය ජාවාරම හා බැඳුණු සමස්ත ජාලය බිඳ දැමීම, පුනරුත්ථාපන අවස්ථා බලගැන්වීම, භාවිතයෙන් ඉවත් වීමට කැමති අය ඒ සඳහා දිරිගැන්වීම මේ යටතේ සිදු කෙරෙනවා.

වැඩසටහන ක්‍රියාවට නැංවෙන්නේ ඒ උදෙසා ම ස්ථාපිත කළ, ජනපති සභාපතිත්වයෙන් යුත් ජාතික මෙහෙයුම් සභාවෙන්. එහි සංයුතිය ආගමික නායකත්වය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා, ජනාධිපති ලේකම් ප්‍රමුඛ විෂයට සෘජු ව ම අදාළ වන අමාත්‍යාංශ රැසක ලේකම්වරු, පොලිස්පති, ත්‍රිවිධ හමුදාපතිවරු, රාජ්‍ය දෙපාර්තමේන්තු රැසක අධ්‍යක්ෂ ජනරාල්වරු, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්, රජයේ ප්‍රධාන රස පරීක්ෂක, මාධ්‍ය ආයතන ප්‍රධානීන්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති, සිවිල් සංවිධාන සහ අදාළ වෙනත් විවිධ ක්ෂේත්‍රවල නියෝජිතයන් යන අයගෙන් සමන්විත වෙනවා. ජාතික මෙහෙයුමට නායකත්වය සැපයීම සහ මගපෙන්වීම, එහි ඒකීය දිශානතිය තහවුරු කිරීම, වැඩසටහන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය ස්ථාපිත කිරීම, මහජන සහාය යාන්ත්‍රණය නිර්මාණය කිරීම, ප්‍රාදේශීය ව්‍යුහය පිහිටුවීම, නෛතික රාමුව සහ මූල්‍යමය තත්ත්වය ශක්තිමත් කිරීම මේ සභාවේ කාර්යභාරයට අයත්.

'රට ම එකට ජාතික මෙහෙයුම' ආරම්භ වුණේ 2025-10-30 දින පෙ. ව. 10.00ට සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ පැවැති සමාරම්භක වැඩසටහනෙන්. එහිදී ජනාධිපතිවරයා අවධාරණය

කළේ වෙනත් ඕනෑ ම කාරණයක් සම්බන්ධයෙන් වාද විවාද, සංවාද විසංවාද මතු කර ගනිමින් කල් ගත කළ හැකි නමුත් විෂ මත්ද්‍රව්‍ය උවදුර රටින් තුරන් කර දැමීමේ ජාතික වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් තවදුරටත් කිසිදු වාදයකට විවාදයකට ඉඩක් නොමැති බව සහ විෂ මත්ද්‍රව්‍ය ජාවාරම සමඟ බැඳුණු අපරාධ කල්ලිවල මූල්‍ය බලය විසින් රටේ ආර්ථිකය, සමාජ දේහය, රාජ්‍ය යාන්ත්‍රණය සහ නීතියේ විධානයේ ආධිපත්‍යය බිඳ වට්ටමින් රටත් සමාජයත් විනාශ කරමින් තිබෙන තත්ත්වය වහා නතර කළ යුතු බව.

රටේ බන්ධනාගාරගත වන පිරිසෙන් වැඩි සංඛ්‍යාවක් විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට හසු වූ අය බවත් තරුණ පිරිස මේ උවදුරට ගොදුරු වන ප්‍රධානතම කණ්ඩායම බවත් සමීක්ෂණවලින් හෙළි ව තිබෙනවා. පසුගිය කාලවකවානුවල පළ වූ මාධ්‍ය වාර්තා අනුව බන්ධනාගාරය සහ පොලිසිය ඇතුළු රාජ්‍ය ආයතන රැසක ඇතැම් දූෂිත නිලධාරීන් අතළොස්සක් ද මේ ජාවාරමේ ගොදුරු බවට හෝ කොටස්කරුවන් බවට හෝ පත් වූ අවස්ථා තිබුණා. මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා කෝටි සංඛ්‍යාත ධනය රාජ්‍ය යාන්ත්‍රණය මෙහෙයවන්නන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකත්වය ලබා දීමට යොදවා එමගින් අපරාධ සහ ජාවාරම් සඳහා ආවරණය සහ රැකවරණය ලබාගෙන ඇති බවට ද මත පළවුණා. විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ සහ සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ක්‍රියාකාරකම්වලට බලවන්තයන්ගේ රැකවරණ ලැබෙන මර්දනකාරී සමාජ වටාපිටාවක් පැවතීම නිසා මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජයට සාමාන්‍ය ජනතාවගේ සහයෝගය ලබා ගැනීම ගැටලුකාරීවයි පැවතියේ. එය ද මත්ද්‍රව්‍ය විරෝධී වැඩසටහන්වලට බාධාවක් වුණා. මේ වැඩසටහන පිළිබඳ මහජන විශ්වාසය වැඩි වීමත් සමඟ පොලිසිය ඇතුළු ආරක්ෂක අංශවලට ලැබෙන ජනතා සහයෝගය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වී ඇති බව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එච්.එම්.සී.පී. හේරත් ප්‍රකාශ කරනවා.

මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහි ව ක්‍රියාත්මක වන පොලිස්, බන්ධනාගාර සහ වෙනත් රාජ්‍ය නිලධාරීන්, සිවිල් ක්‍රියාකාරීන් සහ සාමාන්‍ය ජනතාව ජාවාරම්කාර අපරාධකරුවන්ගේ සතුරන් බවට පත් ව ජීවිතයෙන් පවා වන්දි ගෙවූ අවස්ථා ද පැවතියා. කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර වැනි දිස්ත්‍රික්කවල වැඩි ව්‍යාප්තියක් පැවතීම, අත්අඩංගුවට පත් වන බොහෝ මත්ලෝලීන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නනන් වීම යනාදිය ද මේ උවදුරේ ප්‍රමාණය පෙන්වන නිදසුන්. ශ්‍රම බලකායේ අනාගත පංගුව වන යොවුන් පරපුරේ අධ්‍යාපනය බිඳවැටීම, පවුල් සංස්ථාව දෙදරා යාම, සමාජ සංස්කෘතික හර පද්ධතියට හානි වීම, තාර්කික බුද්ධියකින් හෝ ශ්‍රම ශක්තියකින් හෝ තොර ප්‍රජාවක් සමාජගත වීම වැනි ඉතා බරපතළ ඛේදවාචක රැසක් රට ඉදිරියේ පවතින්නටත් විෂ මත්ද්‍රව්‍ය හේතුවක්.

'රට ම එකට' මෙහෙයුමට අවශ්‍ය මහජන යාන්ත්‍රණය සැකසී ඇත්තේ දිස්ත්‍රික් මෙහෙයුම් සභා, ප්‍රාදේශීය මෙහෙයුම් සභා සහ ග්‍රාමීය මට්ටමේ මෙහෙයුම් සභා මෙන් ම සෑම ග්‍රාම සේවා කොට්ඨාසයක ම ක්‍රියාත්මක වන මහජන ආරක්ෂක කමිටුවලින් සමන්විත විධිමත් ව්‍යුහයකින්. ඒ නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම පහසු බවත් මහජනයා පෙරට වඩා උනන්දුවෙන් සහ ස්වකැමැත්තෙන් අත්වැල් බැඳගෙන සිටින ආකාරය පොලිස් ස්ථානවලින් ලැබෙන තොරතුරු අනුව පෙනී යන බවත් මේ වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී ඒ ඒ ප්‍රදේශවල බලය පතුරුවාගෙන සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ භාවිත කරන්නන් ආරක්ෂා කිරීමට හෝ මෙතෙක් කල් සිදු කළා සේ මත්ද්‍රව්‍ය සම්බන්ධ කාරණාවලදී කරබාගෙන සිටීමට මහජනයා පෙළඹීමේ ප්‍රතිශතය අඩු වී ඇති බවත් පවසන්නේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ පුහුණු අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.සී.සී හේරත්. විෂ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් විශේෂ රාජකාරිවල යෙදවීමට අලුතින් පොලිස් නිලධාරීන් බඳවා ගන්නා තුරු එදිනෙදා සාමාන්‍ය රාජකාරි ඉටුකරන දැනට සිටින නිලධාරීන්ගෙන් යැපීමට පොලිස් ස්ථානාධිපතිවරුන්ට සිදුවීම, සාක්ෂිකරුවන් වශයෙන් අවශ්‍ය විට මහජනයා ඉදිරිපත් නොවීම නිසා නීතිය ඉදිරියේ සැකකරුවන් වරදකරුවන් බව ඔප්පු කිරීමට අපහසු අවස්ථා එළැඹීම, ඇතැම් පොලිස් ස්ථානවල සේවය කරන සියයට දශම ගණනක් වන ඇතැම් දූෂිත නිලධාරියකු දෙදෙනකු නිසා සියයට අනූනවයක් පමණ වන යහපත් නිලධාරීන්ට ද තම සේවාව නීත්‍යානුකූල ව සිදු කිරීමට යාමේදී



මහජන පිළිගැනීම අඩු වීම වැනි අභියෝගවලට මුහුණදෙමින් ශ්‍රී ලංකා පොලිසිය මේ වැඩසටහන සමඟ සක්‍රිය කාර්යක්ෂමතාවෙන් එකතු වී වැඩ කරන බව ද ඔහු සඳහන් කරනවා.

මේ ජාතික වැඩසටහන සමාජගත කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා පොලිසියේ මැදිහත්වීමෙන් මුලින්ම සිදු කෙරුණේ ත්‍රී රෝද රථ ඇතුළු වෙනත් වාහනවල දැනුවත් කිරීමේ ස්ටිකර ඇලවීමේ ප්‍රචාරණ ව්‍යාපෘතිය. පාසල් දරුවන් මේ උවදුරට ගොදුරු වීම වැළැක්වීම අරමුණු කරගෙන සෝදිසි පරීක්ෂා සිදු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කෙරුණේ ද පොලිසියේ සහයෝගය ඇති ව. බොහෝ පාසල්වල විදුහල්පතිවරු සහ ආචාර්ය මණ්ඩල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් කලින් සිට ක්‍රියාත්මක කරමින් සිටියත් ඒවායේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව අපේක්ෂිත ඉලක්ක සපිරීමට ප්‍රමාණවත් නොවන නිසා නව වැඩසටහන යටතේ ඒවාට පොලිසියෙන් ලබාදෙන සහයෝගය වැඩි කෙරුණා.

මෙහෙයුමේ ප්‍රධානතම අංගයක් වන්නේ 'විකුණන - ලොල් වුණු - සැම ඉවත් වෙනු' තේමාව යටතේ ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ. එහිදී මත්ද්‍රව්‍ය මෙරටට ගෙන්වන, රට තුළ බෙදාහරින, විකුණන සහ භාවිත කරන අය පූර්ව දැනුම් දීමෙන් එකී ක්‍රියාවලින් ස්ව කැමැත්තෙන් ඉවත් වීමට අවස්ථාව ලබා දෙනවා. එසේ ඉවත් නොවී දිගින් දිගට ම එම වැරදි ක්‍රියාවල යෙදෙන්නේ නම් එබඳු ස්ථාන වැටලීම සහ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමත් වරදකරුවන් නීතිය හමුවට යොමු කර දඬුවම් ලබා දීමෙන් හෝ පුනරුත්ථාපනයට සහ උපදේශනයට යොමු කිරීමෙන් හෝ විෂ මත්ද්‍රව්‍ය සැපයුම සහ ඉල්ලුම පාලනය කෙරෙනවා.

මේ මෙහෙයුමේ ප්‍රධානතම අංගයක් වන්නේ 'විකුණන - ලොල් වුණු - සැම ඉවත් වෙනු' තේමාව යටතේ ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ. එහිදී මත්ද්‍රව්‍ය මෙරටට ගෙන්වන, රට තුළ බෙදාහරින, විකුණන සහ භාවිත කරන අය පූර්ව දැනුම් දීමෙන් එකී ක්‍රියාවලින් ස්ව කැමැත්තෙන් ඉවත් වීමට අවස්ථාව ලබා දෙනවා. එසේ ඉවත් නොවී දිගින් දිගට ම එම වැරදි ක්‍රියාවල යෙදෙන්නේ නම් එබඳු ස්ථාන වැටලීම සහ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමත් වරදකරුවන් නීතිය හමුවට යොමු කර දඬුවම් ලබා දීමෙන් හෝ පුනරුත්ථාපනයට සහ උපදේශනයට යොමු කිරීමෙන් හෝ විෂ මත්ද්‍රව්‍ය සැපයුම සහ ඉල්ලුම පාලනය කෙරෙනවා. ජාවාරම්කරුවන්ට ඉන් බැහැර වන ලෙස අවසාන අවවාදය ලබා දීමත් භාවිත කරන්නන්ට ස්වකැමැත්තෙන් ඉන් මිදීමට හැකි අවසන් අවස්ථාව පිළිබඳ පණිවිඩය නිකුත් කිරීමත් ඔවුන්ට පුනරුත්ථාපනයට යොමු වීමේ අවශ්‍යතාව අවධාරණය කරවීමත් විෂ මත්ද්‍රව්‍ය ජාලය මුලිනුපුටා දැමීම සඳහා මහජන තෙරපුමක් ඇති කරවීමත් 'ඉවත් වෙනු' වැඩසටහනේ කාර්යභාරයට අයත්.

මේ ව්‍යසනය සමාජයෙන් තුරන් කිරීමට පසුගිය වසර ගණනාව තිස්සේ පාලන බලය ඉසිලූ කිසිදු රජයක් සමත් වුණේ නැහැ. කාලයක් තිස්සේ සිදු වුණේ මත්ද්‍රව්‍ය මර්දනය වෙනුවට වර්ධනය. ඒ සමඟ සැසඳූ විට අද ක්‍රියාත්මක වන මෙහෙයුම මත්ද්‍රව්‍ය සැපයුම් සහ ඉල්ලුම් ජාල දෙක ම එකවර අඩාල කිරීමට පුළුල් ප්‍රායෝගික වැඩපිළිවෙළක් සහිත සාධනීය එළැඹුමක්. ශ්‍රී ලංකා අමද්‍යප මහා සභාවේ මහලේකම්, හෙල්දි ලංකා ආයතනයේ සභාපති, මත්ද්‍රව්‍ය නිවාරණ සහ මනෝවිද්‍යා උපදේශක මහේන්ද්‍ර ජයසිංහ ප්‍රකාශ කරන්නේ භාවිතය සහ ජාවාරම යන පැතිකඩ දෙකට ම එකවර 'ඉවත් වෙනු' යන විධානය ලබා දීමත් මෙතරම් දැඩි ව ඒ විධාන ක්‍රියාත්මක කිරීමත් සිදු වන්නේ ලංකා ඉතිහාසයේ ප්‍රථමවරට බව. ඊට සමාජයේ සැම පුරවැසියකු ම නියෝජනය වන පුළුල් මහජන සම්බන්ධතා ජාලයක් නිර්මාණය



කර තිබීම ඉතා වැදගත් බව පෙන්වා දෙන ඔහු යෝජනා කරන්නේ අරක්කු, බියර්, කසිප්පු වැනි ඇල්කොහොල් ආශ්‍රිත නිෂ්පාදනත් සිගරැට්, දුම්වැටි, බුලත්විට වැනි දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනත් මේ වැඩසටහනට ඇතුළත් කළ යුතු බව. ඔහු එසේ යෝජනා කරන්නේ ඒවායින් ආර්ථිකයට එකතු වන බදු ආදායම සහ සාමාජීය, සංස්කෘතික, මානව, සෞඛ්‍යමය යනාදී අංශ කෙරෙහි මේවායින් වන හානිදායක බලපෑම්වලට ප්‍රතිකාර කිරීම සහ උපදේශනය, පුනරුත්ථාපනය වැනි දිගුකාලීන ප්‍රතිචාරාත්මක ක්‍රියා සඳහා ජාතික ආර්ථිකයෙන් දැරීමට සිදුවන වැය බර අතර පරතරය දෙගුණයකටත් වැඩි බවත් බහුතරයක් විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තරුණ තරුණියන් ඒ සඳහා මූලික අත්හදාබැලීම හෝ පෙළඹවීම හෝ ලබා ඇත්තේ අරක්කු, බියර්, සිගරැට් නිසා බවත් ඕනෑ ම මත් වන ද්‍රව්‍යයක විෂ අඩංගු වන බවත් පෙන්වා දෙමින්.

'මතින් තොර රටක් - සතුටින් පිරි හෙටක්' දැක්ම අනුව මේ වැඩසටහන සම්බන්ධයෙන් ලබා දී ඇති අමප/25/1937/801/026 අංක දරන 2025-10-13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ එය ක්‍රියාවට නංවමින් ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සංවිධාන කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සඳහන් කරමින් ජනාධිපති ලේකම් නිකුත් කළ අංක PS/ADA/Circular/13/2025 හා 2025-11-14 දිනැති චක්‍රලේඛයෙන් දන්වා ඇති පරිදි සිය ආයතනවල සාමූහික (Collectives)/කව (Circles) පිහිටුවමින් රාජ්‍ය නිලධාරීන් ද මේ වැඩසටහනට සක්‍රිය දායකත්වය සපයනවා. මේ වැඩසටහනේ පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ සමාරම්භක වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරුණේ ඊට ජනතා ආකර්ශනය තවදුරටත් වැඩි කර ගැනීමේ අපේක්ෂාවෙන්. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2026ට අදළ ව මේ යටතේ 'විෂ මත් ද්‍රව්‍ය නිවාරණ සතිය' වැඩසටහන ද ජාතික සහ පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කෙරුණා. ආගමික, ක්‍රීඩා, කලා හා සංස්කෘතික වැනි විවිධ ක්ෂේත්‍රවල ද දායකත්වය ඇති ව ක්‍රියාත්මක කෙරෙන 'රට ම එකට ජාතික මෙහෙයුම' මේ මායාකාරී මත්ද්‍රව්‍ය කුණාටුවෙන් ජාතිය ගලවා ගැනීමට තරම් ප්‍රබල යාන්ත්‍රණයක්.

## පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිකුත් කරන දෛනික මාධ්‍ය වාර්තාව අනුව 'විකුණන - ලොල් වුණු - සැම ඉවත් වෙනු' වැඩසටහනේ ප්‍රගතිය

| කාරණය | 2026.05.31 දිනට අදාළ ව | වැටලීම් සංඛ්‍යාව | 2025.10.30 සිට 2026.05.31 දින දක්වා සමස්තය | වැටලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| • අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව | 646 | 648 | 191720 | 192830 |
| • නීතිවිරෝධී වත්කම් විමර්ශන ඇරඹූ සංඛ්‍යාව | - | " | 332 | " |
| • රැඳවුම් නියෝග ලබාගත් සැකකරුවන් සංඛ්‍යාව | 1 | " | 2933 | " |
| • පුනරුත්ථාපනයට යොමු කළ සංඛ්‍යාව | - | " | 2103 | " |
| • මුහුදු වැටලීම් සංඛ්‍යාව | - | - | 11 | 11 |
| • අත්අඩංගුවට ගත් බෝට්ටු සංඛ්‍යාව | - | - | " | " |
| • මුහුදේදී අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව | - | - | 61 | " |
| අත්අඩංගුවට ගත් ප්‍රමාණ- • හෙරොයින් | ග්‍රෑ. 302 | 225 | කි.ග්‍රෑ.1950 ග්‍රෑ. 511 | 63056 |
| • අයිස් | ග්‍රෑ. 375 | 251 | කි.ග්‍රෑ.2070 ග්‍රෑ. 172 | 73208 |
| • කොකේන් | - | - | කි.ග්‍රෑ. 228 ග්‍රෑ. 641 | 163 |
| • ගංජා | ග්‍රෑ. 448 | 135 | කි.ග්‍රෑ.5516 ග්‍රෑ. 106 | 43170 |
| • ගංජා පැළ | 85005 | - | 9597971 | 3956 |
| • හෂීෂ් | ග්‍රෑ. 1 | - | කි.ග්‍රෑ. 224 ග්‍රෑ. 714 | 3101 |
| • මත් පෙති | 174 | - | 1608901 | 4951 |
| • මාවා | ග්‍රෑ. 12 | - | කි.ග්‍රෑ. 301 ග්‍රෑ. 621 | 1261 |
| • මදන මෝදක | ග්‍රෑ. 45 | - | කි.ග්‍රෑ. 645 ග්‍රෑ. 849 | 1857 |




# සෙලවෙන රුපියල

නිවැරදි තොරතුරු ජනගත නොවීම නිසා වත්මන් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සමාජය මතු කරන ගැටලුවල විකෘතියක් ඇතැමුන් තුළ දක්නට ලැබෙනවා. විශේෂයෙන් රුපියලේ අගය අවප්‍රමාණය පිළිබඳ හා වාහන ආනයනය සඳහා බදු පැනවීම පිළිබඳ ජනගත ව තිබෙන තොරතුරු නිවැරදි නැහැ. ආර්ථිකයේ සියල්ල සිදුවන්නේ විනිමය අනුපාතිකය මත වැනි අදහසක් ජනගත කිරීමටත් ඒ නිසා ම නැවතත් රට අර්බුදකාරී තත්ත්වයකට යනු ඇතැයි ජනතාව තුළ බියක් ඇති කිරීමටත් ඇතැම් පිරිස් උත්සාහ දරමින් සිටිනවා. 2022 වසරේදී රට බංකොලොත්භාවයට පත්වීම නිසා ඩොලරයේ අගය රුපියල් 370/= තරම් ඉහළ යාම සහ අද වන විට රුපියලේ අවප්‍රමාණය වීම සසඳමින් ඇතැම් පිරිස් උත්සාහ කරන්නේ රුපියලේ අගය පෙර පැවති ප්‍රමාණයට අවප්‍රමාණය වුවහොත් නැවතත් රට පෙර පැවති අර්බුදකාරී තත්ත්වයට පත්විය හැකි බවට අනාවැකි පළ කිරීමට. සැබෑ වශයෙන් ම එය මානසික වශයෙන් ජනතාව වෙනස් කිරීමට දරන උත්සාහයක් පමණයි. 2022 වසරේදී රට බංකොලොත්භාවයට පත්වීම නිසා රුපියල අවප්‍රමාණය වීම සහ වර්තමානයේ රුපියල අවප්‍රමාණය වීමේ හේතු වෙනස්. එහෙත් අද රුපියල අවප්‍රමාණය වන්නේ අභ්‍යන්තරික හේතු නිසා නොවෙයි.

2025 වර්ෂය ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරත්වයට පත් වූ වර්ෂය ලෙස ඉතිහාසගත වුණා. ඉන්පසුව සාර්ව ආර්ථික විචල්‍ය සියල්ල ම පාහේ හිතකර තත්ත්වයක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණා. එවැනි පසුබිමකයි ගෝලීය දේශපාලනික ආර්ථික තත්ත්වය අනපේක්ෂිත ලෙස වෙනස් වූයේ. මැදපෙරදිග යුදමය වාතාවරණය හමුවේ ඉන්ධන මිල ඉහළ යාම අපට වළක්වන්නට බැහැ. පොහොර, නාවික ගාස්තු හා රක්ෂණ ගාස්තු ආදියෙහි මිලත් ඉහළ ගියා.

2025 වර්ෂය ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරත්වයට පත් වූ වර්ෂය ලෙස ඉතිහාසගත වුණා. ඉන්පසුව සාර්ව ආර්ථික විචල්‍ය සියල්ල ම පාහේ හිතකර තත්ත්වයක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණා. එවැනි පසුබිමකයි ගෝලීය දේශපාලනික ආර්ථික තත්ත්වය අනපේක්ෂිත ලෙස වෙනස් වූයේ. මැදපෙරදිග යුදමය වාතාවරණය හමුවේ ඉන්ධන මිල ඉහළ යාම අපට වළක්වන්නට බැහැ. පොහොර, නාවික ගාස්තු හා රක්ෂණ ගාස්තු ආදියෙහි මිලත් ඉහළ ගියා.



ආචාර්ය
**අනිල් ජයන්ත ප්‍රනාන්දු**
කම්කරු අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය

සමස්තයක් වශයෙන් ගතහොත් සියලු ම ආනයනික භාණ්ඩ මිල ගණන් මේ යුදමය වාතාවරණය හමුවේ ඉහළ ගොස් තිබෙනවා. එයට සාපේක්ෂ ව අපනයන භාණ්ඩවල මිල ඉහළ යාම අවම මට්ටමකයි පවතින්නේ. මිල ඉහළ ගියත් මේ ආනයනය කරන භාණ්ඩ අප ආනයනය කළ යුතුයි මේ සියල්ල ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය භාණ්ඩ නිසා. මීට අමතර ව යුදමය වාතාවරණය තුළ පවා ක්‍රියාත්මක වන භූ දේශපාලන තත්ත්වය වැනි හේතු මත ඩොලරයට ලැබෙන ප්‍රතිලාභ (Average Yield) ඉහළ දමා ගැනීමට ඒ ඒ රටවල් ක්‍රියා කිරීම නිසා ඩොලරයට ඇති ඉල්ලුම ඉහළ යාමෙන් ආයෝජන ඩොලරය දෙසට ගලා යාම ද ඉහළ ගියා.

මේ තත්ත්ව නිසයි දේශීය මුදල් අවප්‍රමාණය සිදු වූයේ. එය ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණ නිසාවත් වංචා දූෂණ හෝ වෙනත් අක්‍රමිකතාවක් නිසාවත් සිදු වූ දෙයක් නොවෙයි. කලාපයේ අනෙකුත් රටවල ද ඔවුන්ගේ දේශීය මුදල් ඒකකය ඉතිහාසයේ වැඩි ම අවප්‍රමාණය වීමකට ලක් ව

තිබෙනවා. ඉන්දියාව, ඉන්දුනීසියාව වැනි රටවල දේශීය මුදල් ඒකකයේ පිරිහීම ඉතිහාසයේ පළමු වතාවට ඉහළ ම අවප්‍රමාණය වීම ලෙසිනුයි වාර්තා වුණේ. ඒ අනුව මේ අවප්‍රමාණය ශ්‍රී ලංකා ආර්ථිකයට ආවේණික වූවක් නොවන බව පැහැදිලි වෙනවා.

ඉදිරියේදී ආනයන තහනම් කරාවි යැයි අපේක්ෂා කිරීමෙන් ආනයනයවලට වැඩි පෙළඹුමක් ඇති වූ අතර ම ඩොලරය තවත් ඉහළ යාවි යැයි අපේක්ෂා කිරීම නිසා ඩොලරයට ඇති ඉල්ලුමත් ඉහළ ගියා. ඉන්ධන මිල දී ගැනීමට ඉහළ ඩොලර් ප්‍රමාණයක් අවශ්‍ය වුණා. විශේෂයෙන් මාර්තු සහ අප්‍රේල් මාසවල ඉන්ධන මිල ගණන් ඉහළ ගියා. මැයි මාසයේදී ඒ සඳහා ගෙවීම් කළ යුතු ව තිබෙනවා. මේ නිසා පෙට්‍රෝලියම් කෝපරේෂන් (CPC) 2026 මැයි මාසය වන විට ඉන්ධන මිල දී ගැනීම සඳහා වැය කළ සාමාන්‍ය පිරිවැය වන ඩොලර් මිලියන 150-200 පරාසය ඩොලර් මිලියන 521 දක්වා ඉහළ ගියා. මෙහි ප්‍රතිඵලය වන්නේ ඩොලරය සඳහා සමස්ත ඉල්ලුමේ ඉහළ යාම. බාහිර කම්පනයක් හේතුවෙන් ඉතා කෙටි කාලයකදී ඇති වූ මේ ඉල්ලුමේ ඉහළ යාමට සාපේක්ෂ ව සැපයුම ඉහළ දැමීම අසීරු තත්ත්වයක්. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව මේ ගැටලුවට මුහුණ දෙන්නේ විදේශ සංචිත ප්‍රමාණය ද ඉහළ මට්ටමක ස්ථාවර ව පවත්වා ගත යුතු වටපිටාවක. රුපියල අවප්‍රමාණය වීමෙන් ඩොලරයේ අගය රුපියල් 350ක් දක්වා ඉහළ ගිය අවස්ථා ද තිබුණා. රුපියලේ අවප්‍රමාණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ සැබෑ තත්ත්වය මෙයයි.

මේ බාහිර කම්පනය නිසා හටගත් ගැටලුකාරී තත්ත්වය අවම කරගෙන, ජනතාවගේ ජීවන තත්ත්වයට මෙයින් සිදුවන බලපෑම අවම කර ගැනීමයි රටක් විදිහට අපේක්ෂාව. එසේ වුවත් ඉතා සුළු පිරිසකගේ අපේක්ෂාව වූයේ ඩොලරයේ අගය ඉතා ඉහළ මට්ටමක් දක්වා ළඟා වීමක්. එයින් දේශපාලන වාසි ලබා ගැනීමටත් ඇතැම්විට වෙනත් ආකාරයේ ලාභ ලබා ගැනීමත් ඔවුන්ගේ අපේක්ෂාව වන්නට ඇති. මේ නිසා සෑම අවස්ථාවක ම අප ප්‍රකාශ කළේ තොරතුරු නිවැරදි ව දැන නොගෙන, ඒවා නිවැරදි ව විශ්ලේෂණය නොකර තීරණ ගැනීමට නොයන ලෙස. එසේ වුවහොත් ආනයන වෙළෙඳපොළේදී පමණක් නොව විදේශ විනිමය වෙළෙඳපොළේදී බරපතළ අලාභදායි තත්ත්ව සඳහා මුහුණදීමට සිදුවිය හැකියි. එහෙත් සුබදායී පණිවිඩයක් තිබෙනවා. ඒ, අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළේ (Inter Bank Foreign E·change Market) මැදි අගය රුපියල් 330 දක්වා අඩු වීම. එහිදී ගැනුම්කරුවන්ගේ මිල රුපියල් 327ක්. විකුණුම්කරුවන්ගේ මිල රුපියල් 332ක්.

ශ්‍රී ලංකාවට සාමාන්‍ය විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ග වන්නේ අපනයන ආදායම්, විදේශ ප්‍රේෂණ හා සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම්. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාව කැපී පෙනෙන අපනයන ආදායම් තත්ත්වයක් පවත්වා ගත්තා. 2026 වර්ෂයේදීත් එම තත්ත්වය පවත්වා ගනිමින් සැලසුම් කළ පරිදි ම අපනයන ආදායම් තත්ත්වය පවත්වා ගැනීමට හැකි වී තිබෙනවා. අප්‍රේල් මාසයේදී පමණක් ඉතා සුළු පහළ යාමක් වාර්තා වුණත් අපනයන විවිධාංගීකරණ වැඩපිළිවෙළ යටතේ එම තත්ත්වය ද ඉදිරියේදී ආවරණය කර ගන්නට පුළුවන්. ඒ අතර ම මැදපෙරදිග යුදමය වාතාවරණයත් ක්‍රමක්‍රමයෙන් පහ ව යමින් පවතින නිසා අපනයන ආදායම් පිළිබඳ යහපත් බලාපොරොත්තු ඇති කර ගැනීමේ හැකියාව තිබෙනවා.

ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ සත්‍ය පසුබිම එය වුවත් තොරතුරු නිවැරදි ව විශ්ලේෂණය නොකර සාකච්ඡාවට බඳුන් කිරීම නිසා සමාජයේ අනියත බියක් හටගෙන තිබෙනවා නැවතත් රට අර්බුදකාරී තත්ත්වයකට ගමන් කිරීමෙන් ආනයන තහනම් කිරීමක්, භාණ්ඩ හිඟයක් වැනි තත්ත්වයක් ඇතිවේ යැයි කියා. එහෙත් ආණ්ඩුව කිසි ම ආකාරයකින් ආර්ථිකය හකුළුවා දැමීමට හෝ ආනයන තහනම් කිරීමට හෝ තීරණය කර නැහැ. අපට



අවශ්‍ය වන්නේ බාහිරින් ඇති ව තිබෙන කම්පනය නිසා රටේ ආර්ථිකයට වන බලපෑම අවම කිරීම. ඒ සඳහා ආර්ථිකය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කරන අතරතුර ම බාහිරින් පැමිණි කම්පන තත්ත්වය සඳහා නිවැරදි විශ්ලේෂණයක් සිදු කරමින් මේ ගැටලුවට නිවැරදි විද්‍යාත්මක පිළිතුරක් සොයා ගැනීමයි ආණ්ඩුවේ අරමුණ.

ශ්‍රී ලංකා ආණ්ඩුව තීන්දු ගන්නේ තොරතුරු නිවැරදි ව විශ්ලේෂණයෙන් පසුව. ශ්‍රී ලංකා මහබැංකුව රටේ මූල්‍ය ස්ථාවරත්වය ඇති කරලීම සඳහා ඔවුන් සතු මූල්‍ය උපකරණ භාවිත කරමින් සිටිනවා. අප ඇති කර ගත් සාර්ව ආර්ථික ස්ථායිතාව හේතුවෙන් මේ තත්ත්වයට සාර්ථක ව මුහුණදීමට ශ්‍රී ලංකාවට හැකියි. 2026 මැයි 27 වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් මිලියන 700ක මුදලක් (වාරික දෙකක්) එකවර ලබා ගැනීමට එහි විධායක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර තිබෙනවා. එයට ධනාත්මක ප්‍රතිචාර ලැබේවි. ආසියානු සංවර්ධන බැංකුව සමඟ ඩොලර් මිලියන 480ක වැඩපිළිවෙළක් 2026 වසරේ ක්‍රියාත්මක කිරීම අපේක්ෂාවක්. ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 150ක් 2026 ජූනි මාසය අවසන් වන විට ලැබීමට නියමිත ව තිබෙනවා. ඒ හා සම්බන්ධ තවත් ආයතනයකින් ඩොලර් මිලියන 50ක වැඩපිළිවෙළක් පවතිනවා. ඒ අනුව ඩොලර් බිලියනයකට වඩා වැඩි ප්‍රමාණයක් අතිරේක වශයෙන් වෙළෙඳපොළට පැමිණේවි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ පාවෙන විනිමය අනුපාත ක්‍රමය. එහිදී ඉල්ලුම් සැපයුම් බලවේග අනුවයි විනිමය අනුපාතිකය (ඩොලරයේ රුපියල් වටිනාකම) තීරණය වන්නේ.




ශ්‍රී ලංකාවට සාමාන්‍ය විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ග වන්නේ අපනයන ආදායම්, විදේශ ප්‍රේෂණ හා සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම්. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාව කැපී පෙනෙන අපනයන ආදායම් තත්ත්වයක් පවත්වා ගත්තා. 2026 වර්ෂයේදීත් එම තත්ත්වය පවත්වා ගනිමින් සැලසුම් කළ පරිදි ම අපනයන ආදායම් තත්ත්වය පවත්වා ගැනීමට හැකි වී තිබෙනවා. අප්‍රේල් මාසයේදී පමණක් ඉතා සුළු පහළ යාමක් වාර්තා වුණත් අපනයන විවිධාංගීකරණ වැඩපිළිවෙළ යටතේ එම තත්ත්වය ද ඉදිරියේදී ආවරණය කර ගන්නට පුළුවන්. ඒ අතර ම මැදපෙරදිග යුද්මය වාතාවරණයත් ක්‍රමක්‍රමයෙන් පහ ව යමින් පවතින නිසා අපනයන ආදායම් පිළිබඳ යහපත් බලාපොරොත්තු ඇති කර ගැනීමේ හැකියාව තිබෙනවා. මේ ගෙවී යන්නේ සංචාරක කර්මාන්තයේ අවාරය (Off season) නිසා සංචාරක පැමිණීම් යම් පහළ යාමක් වාර්තා කළත් 2025 වර්ෂයට සාපේක්ෂ ව 2026 වර්ෂයේ එය ඉහළ මට්ටමක පවතිනවා. ඒ අතර ප්‍රධාන ම විදේශ විනිමය ලැබීම් මාර්ගය වශයෙන් විදේශ ප්‍රේෂණ 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 08 ඉක්මවා ලැබුණා. 2026 අප්‍රේල් මාසය වන විටත් ඩොලර් බිලියන 03ක් ලැබී තිබෙනවා. එම තීව්‍රතාවෙන් ම ලැබීම් සිදුවුවත් 2026 වර්ෂය අවසාන වන විට විදේශ ප්‍රේෂණ වශයෙන් ඩොලර් බිලියන 09ක් පමණ ලැබීමේ හැකියාව තිබෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවේ ප්‍රධානී Ivan Papargiaou විසින් Linkedin සඳහා ඉදිරිපත් කරන ලද පණිවුඩයේ සඳහන් කරනවා **"පසුගිය කාලයේ බලධාරීන් සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම, සංචිත නැවත ගොඩනැගීම සහ විශ්වාසය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මෙම උත්සාහයන් මහජනතාව, ආයෝජකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් හඳුනාගෙන ඇති අතර ආර්ථිකය වඩාත් ශක්තිමත් පදනමක් මත තැබීමට එය උපකාරී වී ඇත. අභියෝගාත්මක බාහිර පරිසරයකදී බොහෝ ආර්ථිකවල සිදු වන පරිදි මෑතකාලීන ව ගෝලීය තත්ත්වයන් නව පීඩන ගෙනැවිත් ඇත. මෙම කම්පන මඟ හැරීම කිසි විටෙකත් සරල නැත. නමුත් අද ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව අතීතයට වඩා සැලකිය යුතු ලෙස ශක්තිමත් ය."** යනුවෙන්. මේ අනුව පෙනී යනවා අභ්‍යන්තරික ගැටලුවකදී මෙන් බාහිර ගැටලුකදී මුහුණ දීම වෙනස් තත්ත්වයක් බව.

එසේ නම් අප සියල්ලන්ගේ ම කාර්යභාරය විය යුත්තේ කුමක් ද? ආණ්ඩුවේ කාර්යභාරය නම් ජනතාවගේ සිතුම් පැතුම්, ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා ගැටුම්වලින් හා පෞද්ගලික ඇලීමෙන් තොර ව ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමත් නිවැරදි විසඳුම් කරා ඉක්මනින් එළඹීමත්. සෑම පුරවැසියෙක් ම බලාපොරොත්තු වන්නේ ඖෂධ හිඟයක් නැති, භාණ්ඩ සඳහා පෝලිම් නැති ශක්තිමත් ආර්ථිකයක් සහිත රටක්. මේ නිසා මාධ්‍ය සෑම විටෙක ම සත්‍ය තොරතුරු ජනගත කළ යුතු අතර සමාජ මාධ්‍යවල නිර්මාණය කරන පුවත්වල සත්‍යාසත්‍යතාව පිළිබඳ තොරතුරු සොයා තාර්කික පදනමකින් සහ සාක්ෂි සහිත, මූලාශ්‍ර සහිත නිවැරදි තොරතුරු පමණක් ලබා ගැනීම එම පරිශීලකයන්ගේ ද වගකීමක්.

**දීප්ත කුමාර බටගොඩ**

(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරින්)



# බුද්ධිමය කතිකාවකට එළඹුමක්

**සිසිර කුමාර මහගම**

'පොසොන් පොහොය' නමැති සංසිද්ධිය මෙරට ජන සමාජයේ, සංස්කෘතික ලෝකයේ වඩාත් බලපෑම්සහගත වූවක්. කිසියම් ජන සමාජයක එම සමාජ සංස්කෘතිය සතු වංශකතා සාහිත්‍යයේ එන ඓතිහාසික මොහොතක් සමඟ එම සමාජය අඛණ්ඩ ව සම්බන්ධ වීම මෙන් ම එම ඉතිහාසමය මොහොත ජීව අවකාශමය ලෙස වර්තමානයට ගළපා ගැනීමේ අවස්ථාවක් ලෙසටත් එය දැකිය හැකියි. මිහින්තලා පව්ව නමැති භූමි සලකුණ, එල පිරි අඹ ගසක් හා තනි වූ තැති ගත් මුව පොව්වෙක් යන ස්වාභාවික පාරිසරිකමය රූපික අංග ත්‍රිත්වයක් සහිත පසුතල අවස්ථාවක් සමඟ දුනු හී දරා ගත් රජු සහ පව්ව මත මිහිඳු හිමි ඇතුළු පිරිවර සහිත රූපික සංඥා ලෝකයක් ජන සමාජයේ සාමූහික මනස තුළ 'පොසොන්' යන්නෙන් ගොඩනැගෙනවා.

හැඟවුම්කාරකයක් ලෙස 'පොසොන්' නමැති වචනය භූමි, සත්ත්ව, ශාක, මානව හා දිව්‍යමය යන සංඥා සංරචනය ඔස්සේ මෙරට ජන සමාජයේ පොදු හැඟවුම්කරණයක් බවට පත් ව තිබෙනවා. එය බෞද්ධ ජන මනස තුළ පමණක් නොව පොදු සමාජයේ ම සමීප ව පිළිගැනෙන රූපික සංරචනයක් බවටයි පත් ව තිබෙන්නේ.

කුඩා දරුවෙකු තම කුරුටුගෑම ඉක්මවා සමාජ සංසිද්ධි නිරූපණයට එළඹෙත් ම ප්‍රකාශන චිත්‍ර ඇඳීමට ආසක්ත වන විට මේ 'පොසොන්' සිදුවීම නිරූපණය වෙත නිතැතින් ම යොමු වන ආකාරය දැකිය හැකියි. ළමා ප්‍රකාශන චිත්‍රවල සිට 18 වැනි සියවසේ දඹුලු ලෙන් විහාර සිත්තරා දක්වාත් 20 වැනි සියවස මුල් අවදියේ එම්. සාර්ලිස් සිත්තරාගේ සිතුවම්වලදීත් වස්තු විෂය වූ මේ සිදුවීමේ රූපික පිහිටුවීම පොසොන් සැමරුම් ස්ථාපනමය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ලෙසින් ද සමාජයේ ප්‍රතිනිර්මාණය වන ආකාරය දැකිය හැකියි. එම ඓතිහාසික මොහොත දෘශ්‍ය ස්ථාපනවලට යොදා ගැනීමේදී මුවා සහ රජු අතර ජංගමශීලී ක්‍රියාකාරී සිදුවීම එය නිරූපණය කර දැක්වීම සඳහා වැඩි ආකර්ෂණයක් හිමි ව ඇති බව පෙනී යනවා.

'පොසොන් පොහොය' පිළිබඳ ගොඩනැගී තිබෙන අදහස් සම්බන්ධ ව ලෝකයට අයත් තවත් වැදගත් කරුණක් වනුයේ මිහිඳු හිමි හා රජු අතර පැවැති සාකච්ඡාව. මහාවංසය නමැති ලිඛිත ඉතිහාස මූලාශ්‍රයෙහි ඇතුළත් නොයෙක් සිදුවීම්වලින් සංවාද කොතෙක් පැවතිය ද මේ 'අඹ ගස'' මූලික වූ සංවාදය පොදුජන මනස තුළ ස්ථාපිත වූවක්. ''සමනාමයං මහා රාජ..'' යන ගාථා පාඨය වන්දනා ගාථාවක් සේ ජන මනසේ නිරායාස ව පවතින්නක්.

බෞද්ධාගමික ඓතිහාසික සැමරුම්වලට අදාළ ව ගත් විට පොසොන් උත්සවය යනු දේශජ සංස්කෘතික අවස්ථාවක්. මෙරටට අදාළ ව ගත් විට අනිකුත් සියලු බෞද්ධ උත්සවවලින් කේන්ද්‍රීය අවස්ථාව දරාගත් සංස්කෘතික සලකුණ වනුයේ පොසොන් උත්සවය.

'පොසොන් උත්සවය' නමැති අදහස අද දවසේ අර්ථ ගන්වා ගත හැක්කේ කෙසේ ද? මේ ඓතිහාසික සිදුවීම සම්බන්ධ ව ජන මනසේ පෙර-සැකසුම් වී ඇති නාට්‍යානුසාරී සරල කතන්දරමය විලාසය ම මේ සිදුවීම පිළිබඳ වඩාත් පෘථුල අවලෝකනය සීමා කරවනවා. ගෙවී ගිය අතීත සමාජයක එනම් අනුරාධපුර අවධියට අයත් එක් නිශ්චිත සමාජ-දේශපාලනික අවස්ථාවක එකී සමාජ දේශපාලන සන්දර්භය ඉල්ලා සිටි 'වංශකතාව' ගොඩනැගීම නමැති බුද්ධිමය ප්‍රවේශය මෙහිදී හඳුනාගත හැකියි.

ලිඛිත ඉතිහාසයක් ගොඩනැගීමේ එම බුද්ධිමය හා බල අවශ්‍යතාවේ ප්‍රවේශය තුළ එම වංශකතාව ගොඩනගන කාල අවස්ථාවට සියවස් කිහිපයකට පූර්ව ව සිදු වූ මහින්දාගමනය නම් දේශපාලනික සිදුවීම මතක, ස්මරණ, පරිකල්පනය ඔස්සේ ලිඛිත ඉතිහාසමය බල ව්‍යූහයකට මෙහිදී රැගෙන එනවා.

නූතනවාදයෙන් පසු ව බිහි වූ දැනුම තුළ අතීතය දෙස විචාරශීලී ව බැලීමේ අවස්ථා සැලසී තිබෙනවා. නූතනවාදී අවස්ථා පසු කළ සමාජ ස්වරූප තේරුම් ගැනීමේ බුද්ධිමය ප්‍රවේශ තුළ මතු වී තිබෙන එක් ප්‍රවාදයක් වනුයේ ‘මේ වන විට මහා ආඛ්‍යාන අහෝසි වී ඇත’ යන කරුණ. තොරතුරු සන්නිවේදනය ප්‍රබල වූ වර්තමානයක ජන සමාජයේ තොරතුරු ලෝකයක් (Information world) අත්පත් කරගෙන තිබෙන අතර දැනුම නිෂ්පාදනයේ සහ සංස්කෘතික ගොඩනැගීමේ දේශජ අර්ථයෙන් ඉවත් ව ගෝලීය අර්ථයක් වෙත පැමිණ තිබෙනවා. සංඛ්‍යාංක තාක්ෂණය මානව සමාජ මත අධිනිශ්චය වීමත් සමඟ එතෙක් අතීත සමාජවල අදහස් ලෝකයේ ස්ථාපිත ව පැවති මහා ආඛ්‍යාන ප්‍රශ්න කිරීම්වලට යොමුවීම දැකිය හැකියි. එම මහා ආඛ්‍යාන දරා සිටි සමාජ බල ව්‍යුහයක් වෙනස් වීමත් සමඟ මහා ආඛ්‍යාන වෙනුවට කුඩා කුඩා ආඛ්‍යාන ගණනාවක් මතු වීම දැකිය හැකියි. නිදසුනකට මහින්දාගමනය ඓතිහාසික සිදුවීම ගත් විට එම සිදුවීම යනු කලාපීය බල දේශපාලනයට නතුවීමක්, සංස්කෘතික ආධිපත්‍යයකට නතුවීමක් ආදී ප්‍රවාද මතු ව තිබෙනවා.

ගොඩනැගී තිබෙන තවත් දැනුම් පද්ධතියක් වනුයේ මේ වංශකතා ගොඩනැගීම යනු අතීත සමාජය සතු දැනුමේ ප්‍රදේශ සංස්කෘතික උරුම ලෙසට අර්ථ ගන්වා ගැනීම. එය වර්තමාන සමාජය සතු ව පවතින උරුම වටිනාකම් බවට පත් ව තිබෙනවා. මෙරට මහාවංසය යුනෙස්කෝ ලෝක උරුමයක් බවට පත් ව ඇත්තේ මිනිස් මතකය නැමති මානව සමාජය අත්පත් කරගත් සංස්කෘතික උරුම මහිමය සැලකිල්ලට ගනිමින්.

සියවස් ගණනාවක පූර්ව අතීත සිදුවීම් දේශීය ව අර්ථ තුළ පමණක් නොව කලාපීය දේශපාලන සංසිද්ධීන් සමඟ තාර්කික ව ගළපා ගනිමින් අතීත සමාජ ඓතිහාසික ව ගොඩනැංවීම යනු සරල වූවක් නොව මහත් බුද්ධිමය සම්ප්‍රදානයක්. ඉන්දියානු පුරාවිද්‍යාත්මක කැණීම් ආශ්‍රිත ව ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමට උත්සාහ ගත් අවස්ථාවලදී ඊට මෙරට මහාවංසයේ අද වූ අවස්ථා එහි කලාපීය සංවේදීතා සඳහා නිදසුනක්.

මිහිඳු හිමි පිළිබඳ මහාවංස නිරූපණය ම සැලකිල්ලට ගතහොත් වංශකතා රචකයාගේ ජීවමය මොහොතට පූර්ව අවධියක කාල ක්‍රමික ව ගොඩනැගුණු සංස්කෘතික භූමි දර්ශනය පිළිබඳ මිහිඳු හිමි සහ රජුගේ තත්කාලීන මොහොත තුළ ඊට අතීතමය හා අනාගත සබඳතාව තාර්කික කරනවා. මේ පාඨනමය මහිමය තේරුම් ගත හැක්කේ ඒ වෙත ආත්ම මූලික ව ප්‍රවේශ වීම් තුළ නොව මානව සාරමය සංස්කෘතික ප්‍රවේශ හඳුනා ගැනීමෙන්.

ඒ අනුව ගත් විට පොසොන් උත්සවය වඩාත් දියුණු සමාජ අපේක්ෂාවක් සඳහා බුද්ධිමය කතිකාවලට එළඹීමේ හැකියාව දරා ගත්තක්. අතීත සමාජය වෙත සරලමිතික මනෝමූලික අර්ථගැන්වීම් ඉක්මවා විචාරශීලී වීම ඉල්ලා සිටින්නක්. අගතිවිරහිත මානව සමාජ වෙත දිශාගත විය හැකි වූවක්.

> ‘පොසොන් උත්සවය’ නමැති අදහස අද දවසේ අර්ථ ගන්වා ගත හැක්කේ කෙසේ ද? මේ ඓතිහාසික සිදුවීම සම්බන්ධ ව ජන මනසේ පෙර-සැකසුම් වී ඇති නාට්‍යානුසාරී සරල කතන්දරමය විලාසය ම මේ සිදුවීම පිළිබඳ වඩාත් පෘථුල අවලෝකනය සීමා කරවනවා. ගෙවී ගිය අතීත සමාජයක එනම් අනුරාධපුර අවධියට අයත් එක් නිශ්චිත සමාජ-දේශපාලනික අවස්ථාවක එකී සමාජ දේශපාලන සන්දර්භය ඉල්ලා සිටි ‘වංශකතාව’ ගොඩනැගීම නමැති බුද්ධිමය ප්‍රවේශය මෙහිදී හඳුනාගත හැකියි.







# ලෝක බලවතුන්ගේ සීතල යුද්ධය

මනෝ ප්‍රනාන්දු

ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ චීන සංචාරය (මැයි 13-15) දෙස ලෝකවාසීන් ඇස්පියන් නොගසා දැඩි විමසිල්ලෙන් බලා සිටියේ ලෝකයේ බලවත් ම නායකයන් දෙදෙනෙකුගේ හමුවීමක් නිසාත් වසර නමයකට පසු ඇමරිකානු ජනාධිපතිවරයෙකු චීනයට කෙරුණු සංචාරයක් නිසාත්. එසේ ම ට්‍රම්ප් ඉරානය ලෝක සිතියමෙන් මකා දැමීමට ක්‍රියා කරමින් සිටින තතු තුළ කරන සංචාරයක් හෙයින් වත්මන් ලෝකයේ බොහෝ දේ තීරණය කිරීමට ඉඟි කරන ලෝක බලවතුන්ගේ හමුවීමක් ලෙසත් මෙය සලකන්නට පුළුවන්.

මේ සංචාරයේදී ඇමරිකානු ජනාධිපතිවරයා කැඳවාගෙන ගියේ ලෝක ප්‍රකට විශාල ව්‍යාපාරික හා තාක්ෂණික සමාගම් හිමිකරුවන් වීම විශේෂ කාරණාවක්. ඒ කණ්ඩායමට එලෝන් මස්ක්, ටිම් කුක්, ජෙන්සන් හුවාං, ලැරි ෆින්ක්, ස්ටෙෆාන් ෂ්වාස්මන්, කැලී ඕට්බර්ග්, ලැරි කල්ප්, ඩේවිඩ් සොලමන්, ජේන් ෆ්‍රේසර්, ක්‍රිස්ටියානෝ ඇමොන්, සන්ජේ මෙහ්රොත්‍රා, බ්‍රයන් ස්කයි, චුක් රොබින්ස්, ජේකොබ් තයිසන්, මයිකල් මීබාක්, ඩයනා පවල් මැක්කෝමික්, රයන් මැකිනර්නි අයත් වුණා. මේ නම් ලැයිස්තුව අධ්‍යයනය කරන කල්හි මේ සංචාරයේදී දෙරට අතර කතාබහට ලක් වෙන්නේ 'දේශපාලන' නොව 'ආර්ථික - තාක්ෂණික' කාරණා බව පෙර දකින්නට පුළුවන්.

මෙබඳු අවශ්‍යතාවක් ඇමරිකාවට පැන නැංවීමට හේතු කිම ? කෙටියෙන් සඳහන් කරන්නේ නම් මෙය චීනය ලෝකය පුරා ප්‍රසාරණය කර ඇති වෙළෙඳාම ඇමරිකාවට බලවත් තර්ජනයක් මතු කොට ඇති හෙයින් එය වළක්වාලීම පිණිසත් ඩැහැ ගැනීම පිණිසත් වන්නක්.

සැබැවින් ම මෙය හදිසියේ පැන නැඟුණක් ද ? නැහැ. 2011 වසරේ නොවැම්බර් මාසයේදී එවකට ඇමරිකාවේ ජනාධිපතිවරයා වූ බරක් ඔබාමා විසින් ඕස්ට්‍රේලියාවේ කැන්බරා නගරයේ කරන ලද 'ආසියාවට හැරීම' නම් ප්‍රකාශයේ මෙකී පරස්පරය රැඳී තිබුණා. එහිදී ඔහුගේ මූලෝපායාත්මක සැලැස්ම වූයේ චීනය හමුදාමය ලෙස වටලා, කලාපය තුළ චීනයේ බලපෑම දුබල කොට ඇමරිකාවේ විධානයට අවනත ලෙස චීනයට බල කිරීම. මේ හේතු කොටගෙන නැගෙනහිර චීන මුහුදේ මිනිස් වාසයක් නොමැති ගල්පර දූපත් තමන්ට අයත් යැයි පවසන ජපානය, චීනය සමඟ යුද ගැටුමක් අවුළුවාලීමට ඇමරිකාව ජපානයට සහයෝගය දෙමින් මහත් වෙහෙසක් දැරුවා. එසේ ම ඇමරිකාව, ජපානය හා දකුණු කොරියාව සමඟ එක් ව නැගෙනහිර චීන මුහුදේ නොකඩවා කරමින් පවතින යුද අභ්‍යාස සඳහා ඇමරිකානු නාවික හමුදාවෙන් සියයට 60ක් පමණ භටයන් යොදවා තිබෙනවා. මීට අමතර ව ඇමරිකාව, ජපානය හා කොරියාව සමඟ එක් ව සූක්ෂ්ම මිසයිල ආරක්ෂක පද්ධතියක් ගොඩ නැඟීම ආරම්භ කළා. චීනය සමඟ ගැටුමකට යෑමේ අරමුණින් ඇමරිකාව ලෝකයේ උපායමාර්ගික මුහුදු මාර්ග අල්ලා ගැනීමේ ප්‍රයත්නයක ද යෙදී සිටිනවා.

දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ලෝක භූමියෙන් රුසියාව හා චීනය, ධනවාදයට අහිමි වූ ඇති තතු තුළ ධනවාදය නැවත පුනස්ථාපනය කිරීමේ වගකීම භාර ගත්තේ ඇමරිකාව. 1944 වසරේදී ඇමරිකාවේ මූලිකත්වයෙන් බ්‍රිටුන්වුඩ්ස් සම්මුතිය තහවුරු කෙරුණු අතර පිරිසිදු රත්‍රං අවුන්සයකට ඩොලර් 35ක් සමාන කෙරුණා. ඇමරිකාව නිල වශයෙන් 1946 වසරේදී ලෝක බැංකුව පිහිටුවා මහජන නැගිටීම් වළක්වාලීම පිණිස විවිධ රටවලට බොහෝ මුදල් පොම්ප කරනු ලැබුවත් 1971 අගෝස්තු 15 දින ඇමරිකානු ජනාධිපති රිචඩ් නික්සන් බ්‍රිටුන්වුඩ්ස් සම්මුතිය බලහත්කාරයෙන් බිඳ දැමුවා. මෙය ඇමරිකානු මූල්‍ය අර්බුදයේ නිශ්චිත ප්‍රකාශනයක්. ඇමරිකානු ගණන්බැලීම් අසාර්ථක වීමෙන් පසුව, ඇමරිකාවට දැන් අවශ්‍ය ව ඇත්තේ යුද්ධයෙන් වෙළෙඳපොළ අල්ලා ගැනීම බව හා අනෙක් බලවතුන් තම අණසක යටතේ තබා ගැනීම.

මේ පසුබිම යටතේ ඇමරිකාවේ ජනාධිපතිවරයාගේ චීන සංචාරය තේරුම් ගත යුතු වෙනවා. ඇමරිකාවේ ආර්ථිකය කඩා වැටීම ක්ෂණික බිඳ වැටීමක් නොව ණය, අසමානතාව, නිෂ්පාදන පහත වැටීම හා මූල්‍යකරණය මත ගොඩනැඟුණු දීර්ඝකාලීන අර්බුදයක්. එහි පළමු වැන්න ණය. මේ වන විට ඇමරිකාවේ ජාතික ණය ට්‍රිලියන 36ක් වන අතර ලෝකයේ විශාලතම ණය රාජ්‍යය වන්නේ ඔවුන්. වසරකට පොලී ගෙවීම සඳහා පමණක් ඇමරිකාවට ට්‍රිලියන එකක් පමණ වැය වෙනවා.

දෙවැන්න වෙළෙඳ හිඟය. 2025 වසරේදී ඇමරිකාවේ වෙළෙඳ භාණ්ඩ හිඟය ඩොලර් බිලියන සිය ගණනක්. විශේෂයෙන් චීනයට, මෙක්සිකෝවට හා ජර්මනියට විශාල වෙළෙඳ හිඟයක් පවතිනවා. මෙයින් පෙන්වන්නේ ඇමරිකාවේ නිෂ්පාදන කර්මාන්ත දුර්වල වීම, ආනයනය මත රඳා පැවතීම හා කර්මාන්ත විදේශගත වීම

(ඇමරිකාවේ තිබූ කර්මාන්ත ලාභ ශ්‍රමය සොයා වෙනත් රටවල යෑම).

තෙවැනි ව කර්මාන්ත අඩුවීම. 1970 දශකයෙන් පසු බොහෝ ඇමරිකානු කර්මාන්ත චීනය, මෙක්සිකෝව හා දකුණු ආසියාව බඳු අඩු ශ්‍රමික වැටුප් ඇති රටවල් කරා ගෙන ගියා. මේ නිසා Rest Belt (උතුරු - මධ්‍යම හා උතුරු - නැගෙනහිර ප්‍රදේශ කිහිපයක්) ලෙස හැඳින් වූ කර්මාන්ත නගර බිඳ වැටුණා. කම්කරු සංගම් සහිත රැකියා අඩු වුණා. මධ්‍යම පන්තිය දුර්වල වුණා. නිදසුන් වශයෙන් 1979 වසරේදී ඇමරිකානු නිෂ්පාදන අංශයේ රැකියා මිලියන 19කට වැඩියෙන් තිබුණත් පසුව එය මිලියන 12 දක්වා අඩු වුණා.

ඇමරිකානු ධනය සුළු පිරිසක් අතට එක් රැස් වීමයි සිව් වැනි කාරණය. ඇස්තමේන්තුව අනුව රටේ ධනයෙන් විශාල පංගුවක් 1%ක් දෙනා භාවිත කරනවා. පහළ ජන කොටස්වල සැබෑ වැටුප් වර්ධනය දශක ගණනාවක් පුරා මන්දගාමී වන අතර මෙයින් නිවාස අර්බුදය වැඩි වී ශීඝ්‍ර ණය ඉහළ ගොස් තිබෙනවා.

පස් වැනි ව ඇමරිකාවේ ජීවන වියදම හා උද්ධමනය. ආහාර මිල, නිවාස කුලී, සෞඛ්‍ය වියදම්, විදුලි ගාස්තු ඉහළ යමින් පවතින අතර මෙයට චීනය සමඟ පවතින තරගකාරිත්වය ද එක් කළ යුතු වෙනවා.

මේ පසුබිම යටතේ ඇමරිකානු ජනාධිපතිගේ කණ්ඩායමේ සංචාරයේ අරමුණු කිහිපයක් වුණා. වෙළෙඳ හිඟය අඩු කිරීම එක් අරමුණක්. ඇමරිකාව දිගු කාලයක සිට චීනයෙන් විශාල භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කරනවා. චීනය ඇමරිකානු භාණ්ඩ මිල දී ගන්නේ අඩුවෙන්. 2025 වසරේදී මේ වෙළෙඳ හිඟය ඩොලර් බිලියන සිය ගණනක්. ට්‍රම්ප්ගේ අදහස වන්නේ චීන භාණ්ඩ මත බදු වැඩි කිරීම, ඇමරිකානු කර්මාන්ත නැවත ඇමරිකාවට ගෙන ඒම හා ඇමරිකානු කෘෂිකාර්මික හා කර්මාන්ත නිෂ්පාදන වැඩියෙන් මිල දී ගන්නැයි චීනයට බල කිරීම. මෙයින් වෙළෙඳ හිඟය අවම කර ගැනීමට හැකි වෙතැයි ඇමෙරිකාව අපේක්ෂා කරනවා.

චීනයේ තාක්ෂණික නැඟීම පාලනය කිරීමත් මේ සංචාරයේ අරමුණක්. හුවාවි, බීවයිඩි හා ටෙන්සෙන්ට් බඳු චීන සමාගම් ඇමරිකාවට බලවත් තර්ජනයක්. විශේෂයෙන් ම AI තාක්ෂණය, සෙමිකන්ඩක්ටර් සිම්, 5G, විදුලි වාහන, පාරිසරික තාක්ෂණය යන ක්ෂේත්‍රවල චීනය වේගයෙන් ඉදිරියට යෑම නිසා ඇමරිකාවට සම්බාධක පැනවීම අවශ්‍ය ව තිබෙනවා.

ඩොලරය ආරක්ෂා කර ගැනීමත් ට්‍රම්ප්ගේ චීන සංචාරයේ අරමුණක්. පසුගිය කාලයේ චීනය හා රුසියාව ඩොලර් වෙනුවට චීන මුදල වන යුවාන්වලින් ගෙවීම් කිරීමට BRICS රටවල ප්‍රවර්ධනය කිරීම ඇමරිකාවේ පැවැත්මට තර්ජනයක් වුණා.

මේ සංචාරය යුද්ධමය නොවූ 'සීතල යුද්ධයකි' යි කිව හැකියි. බැලූ බැල්මට නොපෙනෙන ප්‍රධාන කාරණාව වන්නේ වෙළෙඳ යුද්ධ. එය වෙළෙඳාම, AI, චිප් තාක්ෂණය, මුහුදු බලය, තායිවානය, අභ්‍යවකාශ තාක්ෂණය හා සයිබර් ආරක්ෂාව වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ ඔඩුදුවා තිබෙනවා. එහෙයින් ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප්ගේ චීන සංචාරය සාමාන්‍ය සුහද සංචාරයක් නොව එකිනෙකාට පහර දිය යුත්තේ කෙසේදැයි සොයා බලන නැතිනම් රහසිගත අවබෝධයක් ලබා ගැනීම පිණිස වන්නක්.

මෙහිදී එක් සුවිශේෂ කරුණක් සැලකිල්ලට ගත යුතු වෙනවා. ඒ, මෙකී තාක්ෂණික මෙවලම් නිෂ්පාදනයේදී අවශ්‍ය වන්නා වූ 'දුර්ලභ භූ ඛනිජ' බොහෝ ප්‍රමාණයක් ඇත්තේ චීනයේ වීම. ඇමරිකාවේ ද මෙකී දුර්ලභ ඛනිජ යම් ප්‍රමාණයක් ඇතත් ඒවා මතුපිටට ගැනීමේදී විශාල 'පරිසර දූෂණයක්' සිදු වන හෙයින් එයට ඇමරිකාවේ පරිසරවේදීන් ඉඩ දෙන්නේ නැහැ. එහෙත් චීනයේ මේ තත්ත්වය වෙනස්. චීනයේ නිලධාරි තන්ත්‍රය දුර්ලභ ඛනිජ ගැනීමේදී සිදුවන 'පරිසර දූෂණය' ගැන හඬ නඟන්නට කිසිවෙකු නැහැ.

> ඇමරිකානු ජනාධිපතිවරයාගේ සංචාරය පිටතින් වෙළෙඳ සාකච්ඡාවක් සේ පෙනුණත් සැබවින් ම එය ලෝක ආර්ථික බලය, තාක්ෂණික නායකත්වය, ඩොලර් ආධිපත්‍යය සහ 21 වැනි සියවසේ ගෝලීය බල සැලැස්ම පිළිබඳ තියුණු තරගයක කොටසක්. ඇමරිකාවේ ට්‍රම්ප් පාලනය ගැඹුරු දේශපාලනමය, සාමාජීය හා ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටියි යන්න පැහැදිලි ව ම පෙනෙන්නක්.

මේ දුර්ලභ භූ ඛනිජ භාවිත කෙරෙන්නේ ජංගම දුරකතන හා පරිගණක, විදුලි මෝටර්, සුළං විදුලි ටර්බයින්, යුද උපකරණ හා ආරක්ෂක තාක්ෂණය, චිප් හා AI කර්මාන්තය, අභ්‍යවකාශ හා උපග්‍රහ තාක්ෂණය සඳහා. මේ සුවිශේෂ වැදගත්කම සලකා බලන විට මෙයින් ඇමරිකානු කණ්ඩායම ව්‍යාපාරිකයන්ගෙන් සමන්විත වීම අරුමයක් නැහැ. මේ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වන්නේ චීන වෙළෙඳපොළ ඔවුන්ගේ භාණ්ඩ සඳහා විවෘත කර ගැනීම. මේ දුර්ලභ භූ ඛනිජ බොහෝ ඇත්තේ චීනයේ. චීනය අවට රටවල් උසිගන්වා, එයින් කලාපයේ ආරක්ෂාව සඳහායි පවසමින් ඇමරිකාව මැදිහත් යුද්ධයට මැදිහත් වීම එක් අපේක්ෂාවක්. ඉන් ඇමරිකාවේ අධිකාරයට චීනය අවනත කර ගැනීමයි අවසාන අරමුණ.

සැබවින් ම ඩොනල්ඩ් ට්‍රම්ප් චීනයේ සංචාරය කිරීමට අපේක්ෂා කරන්නට ඇත්තේ ඉරානය සමතලා කොට යුද වීරයා වශයෙන් විය හැකියි. එවැන්නක් ඇමරිකාවේ අවසාන අරමුණ සඳහා එනම් චීනය අවනත කර ගැනීම පිණිස ගැළපෙනවා. එහෙත් එම ඉරාන සැලැස්ම මුළුමනින් ම අසාර්ථක වුණා. දැන් ඉරානයට එරෙහි ව කරන කවර යුද මෙහෙයවීමකදී වුව චීනයේ මැදිහත් වීම වැළැක්වීමට උපරිමය වෑයමක් ඇමරිකාව ගනු ඇති. අනෙක් අතට තායිවානය සම්බන්ධයෙන් ඇමරිකාවේ මැදිහත් වීම පිළිබඳ ව චීනය තදින් ම විරුද්ධත්වය ප්‍රකාශ කොට තිබෙනවා.

මේ සියල්ල ම සලකා බැලූ කල්හි ඇමරිකානු ජනාධිපතිවරයාගේ සංචාරය පිටතින් වෙළෙඳ සාකච්ඡාවක් සේ පෙනුණත් සැබවින් ම එය ලෝක ආර්ථික බලය, තාක්ෂණික නායකත්වය, ඩොලර් ආධිපත්‍යය සහ 21 වැනි සියවසේ ගෝලීය බල සැලැස්ම පිළිබඳ තියුණු තරගයක කොටසක්. ඇමරිකාවේ ට්‍රම්ප් පාලනය ගැඹුරු දේශපාලනමය, සාමාජීය හා ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටියි යන්න පැහැදිලි ව ම පෙනෙන්නක්.

# නළුකම හා දේශපාලනය



**නිහාල් පීරිස්**

දෙමළ සිනමා රසික රසිකාවියන්ගේ වීරයෙකු වී සිටි ජනප්‍රිය ඉන්දීය නළු තලපති විජේ (චන්ද්‍රසේකරන් ජෝසප් විජේ) නොබෝදා දේශපාලන ක්ෂේත්‍රයේත් වීරයෙකු බවට පත් වුණා. ඒ, අප්‍රේල් මාසයේ පවත්වන ලද තමිල්නාඩුවේ ප්‍රාන්ත මැතිවරණයෙන් ඔහු සහ ඔහුගේ දේශපාලන පක්ෂය සුවිශේෂ ජයග්‍රහණයක් හිමි කර ගැනීමත් සමඟ. විජේ සහ ඔහුගේ පක්ෂය වන තමිලග වෙට්රි කෂාගම් (TVK) මේ ජයග්‍රහණය හිමි කර ගත්තේ දීර්ඝ කාලයක් තිස්සේ තමිල්නාඩුවේ ආධිපත්‍යය දරමින් සිටි ප්‍රධාන පක්ෂ පරාජයට පත්කරමින් වීම විශේෂත්වයක්. ඒ අනුව 51 හැවිරිදි විජේ තමිල්නාඩු ප්‍රාන්තයේ මහ ඇමැති ධුරයටත් පත් වුණා.



විජේ මහ ඇමැති ලෙස දිවුරුම් දෙමින්

මෙවර තමිල්නාඩු ප්‍රාන්ත මැතිවරණය ගැන ශ්‍රී ලංකාවේ බොහෝ දෙනාගේත් විශේෂ අවධානයක් යොමු ව තිබෙනවා. විජේ මෙවර මැතිවරණයට තරග කිරීම ඊට හේතුවක්. ඔහු වීරත්වයෙන් සලකන සිනමාලෝලීන් රැසක් මෙරටත් සිටින බව නොරහසක්. ශ්‍රී ලංකාවට අයත් කච්චතිවු දූපත සම්බන්ධයෙන් මැතිවරණ ව්‍යාපාරයේදී ඔහු කළ ප්‍රකාශත් මෙරට ජනතාවගේ අවධානයට ලක් වුණා. කච්චතිවු දූපත නැවත ඉන්දියාවට පවරා ගත යුතු බවයි ඔහු සිය දේශපාලන රැස්වීම්වලදී ප්‍රකාශ කළේ. කච්චතිවු අවට මුහුදු කලාපයේදී තමිල්නාඩු ධීවරයන් මුහුණදෙන ගැටලු විසඳීමට නම් මේ දූපත ඉන්දියාවට පවරා ගත යුතු බවයි ඔහු සඳහන් කළේ. ඒ වෙනුවෙන් පියවර නොගැනීම ගැන විජේ, අගමැති නරේන්ද්‍ර මෝදිගේ මධ්‍යම ආණ්ඩුවටත් හිටපු මහ ඇමති එම්.කේ. ස්ටාලින්ගේ තමිල්නාඩු ආණ්ඩුවටත් චෝදනා කළා. ඔහු ප්‍රාන්තයේ මහ ඇමැති ධුරයට පත් ව සිටින පසුබිමක කච්චතිවු දූපත සම්බන්ධයෙන් කවර පියවරක් ගනු ඇත් ද යන්න කුතුහලය දනවන කාරණයක්.

කාලයක් තිස්සේ මාරුවෙන් මාරුවට තමිල්නාඩු ප්‍රාන්තයේ බලය හොබවමින් සිටියේ ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් (DMK) සහ ඕල් ඉන්ඩියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් (AIADMK) යන පක්ෂ දෙක. මෙවර මැතිවරණයට පෙර ආණ්ඩු බලය හෙබ වූ ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් පක්ෂය එම්. කරුණානිධි වැනි දැවැන්ත චරිත නායකත්වය දැරූ පක්ෂයක්. මේ වනවිට එහි නායකත්වය දරන ස්ටාලින් කරුණානිධිගේ පුත්‍රයෙකු වෙනවා.

අනෙක් ප්‍රධාන පක්ෂය වන ඕල් ඉන්ඩියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් පක්ෂය කලකට පෙර එම්.ජී. රාමචන්ද්‍රන්

(එම්.ජී.ආර්), ජයරාම් ජයලලිතා වැනි ප්‍රබලයන් නායකත්වය දැරූ පක්ෂයක් බව රහසක් නොවෙයි. එසේ වුවත් තමිල්නාඩුවේ හොඳින් මුල් අල්ලා තිබූ මේ පක්ෂ පරාජය කිරීමට විජේගේ තමිලග වෙට්රි කෂාගම් නැමැති අලුත් පක්ෂයට හැකි වුණා.

විජේ සිනමා නළුවෙකු ලෙස ගොඩනගාගෙන සිටි ජනප්‍රිය වීර ප්‍රතිරූපයත් ඔහුගේ ආකර්ෂණීය දේශපාලන පොරොන්දුත් මේ





එම්. කේ. ස්ටාලින්

ජයග්‍රහණයට ප්‍රධාන වශයෙන් හේතු වූ බව පෙනෙනවා. විජේ ඔහුගේ පක්ෂය පිහිටුවූයේ 2024 පෙබරවාරි මාසයේ. එය තමිල්නාඩුවේ බලය ඇල්ලුවේ ඉතා කෙටි කලක් ඇතුළත.

තමිල්නාඩු ප්‍රාන්ත සභාව ආසන 234කින් සමන්විත ප්‍රාන්ත සභාවක්. එයින් ආසන 108ක් ම දිනාගන්නට තමිලග වෙට්රි කෂාගම් පක්ෂයට හැකි වුණා. එතෙක් ආණ්ඩු බලය හෙබ වූ ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් පක්ෂය හිමි කර ගත්තේ ආසන 59ක් පමණයි. ඔවුන් පසුගිය මැතිවරණයේදී ආසන 133ක් දිනාගෙන තිබූ අතර මෙවර එයින් භාගයක්වත් දිනා ගන්නට හැකි වුණේ නැහැ. ඕල් ඉන්ඩියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කෂාගම් පක්ෂය දිනාගත්තේ ආසන 47ක්.

විජේ මේ මැතිවරණයේදී ආසන දෙකක් වෙනුවෙන් තරග කළා. ඒ, පෙරම්බූර් සහ තිරුචිරප්පල්ලි යන ආසන වෙනුවෙන්. මේ ආසන දෙක ම ඔහු ඉහළින් ම ජය ගන්නට සමත් වුණා. පසුගිය කාලයේ මහ ඇමැති ධුරය දැරූ ස්ටාලින්ට ඔහු තරග කළ කොලතූර් ආසනයවත් රැක ගැනීමට නොහැකි වූ අතර ඔහු පරාජය වූයේ විජේගේ පක්ෂයෙන් තරග කළ අපේක්ෂකයකුට. කොලතූර් යනු ස්ටාලින් කාලයක් තිස්සේ බලය හෙබ වූ ආසනයක්.

2024 වසරේ සිය දේශපාලන පක්ෂය පිහිටුවීමෙන් පසු විජේ පූර්ණකාලීන ව දේශපාලනය වෙනුවෙන් කැපවීම සඳහා සිනමා රංගනයෙන් ද ඉවත් වුණා. ඔහු රඟ පෑ අවසන් චිත්‍රපටය වූයේ 'ජන නායගන්' නැමැති චිත්‍රපටය. එය තවමත් ප්‍රදර්ශනය වී නැහැ. විජේ ලැබූ දේශපාලන ජයග්‍රහණයත් සමඟ 'ජන නායගන්' ආදායම් වාර්තා තබමින් තිරගත වනු ඇති බව බොහෝ දෙනාගේ විශ්වාසය වුණා. දෙමළ සිනමාවේ ජනප්‍රිය නළු කමල් හාසන් ද පසුගිය කාලයේ දේශපාලන පක්ෂයක් පිහිටුවාගෙන මැතිවරණවලට තරග කළත් ඔහුට විජේ මෙන් ජයග්‍රහණ හිමි කරගන්නට හැකි වුණේ නැහැ. කමල්ගේ දේශපාලන පක්ෂය වන මක්කල් නීති මයියාම් 2019 පාර්ලිමේන්තු මැතිවරණයටත් 2021 තමිල්නාඩු ප්‍රාන්ත මැතිවරණයටත් ඉදිරිපත් වුණා. එහෙත් එකදු ආසනයක්වත් දිනා ගැනීමට ඊට හැකි වුණේ නැහැ. 2021 මැතිවරණයේදී කමල් හාසන් තරග කළ ආසනය පවා දිනා ගැනීමට ඔහුට නොහැකි වුණා. විජේ සහ ඔහුගේ පක්ෂය මෙවර ලැබූ ජයග්‍රහණය කැපී පෙනෙන්නේ එවැනි පසුබිමක.

විජේගේ මේ සුවිසල් ජයග්‍රහණයට හේතු වූ කාරණා ගැනත් දේශපාලන විශ්ලේෂකයන් මත පළ කර තිබෙනවා. සිනමා තරුවක් ලෙස ඔහුට ආරෝපණය වී ඇති වීරත්වය මේ ජයග්‍රහණයට ප්‍රධාන හේතුවක්. ඊට අමතර ව දීර්ඝ කාලයක් තිස්සේ තමිල්නාඩු ප්‍රාන්තය පාලනය කළ ප්‍රධාන පක්ෂ දෙක ගැන ඡන්දදායකයන් යම් කලකිරීමකින් පසුවීමත් තවත් ප්‍රබල හේතුවක් ලෙස සැලකෙනවා. තමන්ට විශ්වාසය තැබිය හැකි අලුත් නායකයකු එනතුරු ඔවුන් බලා සිටි ආකාරයකුයි පෙනෙන්නේ.

විජේගේ මැතිවරණ ව්‍යාපාරයේදී විශේෂයෙන් තරුණ සහ කාන්තා ඡන්දදායකයන් ඉලක්ක කළ ආකාරයක් ද දැකිය හැකි වුණා. තමිල්නාඩුව තරුණ ඡන්දදායකයන් විශාල සංඛ්‍යාවක් සිටින ප්‍රාන්තයක්. එහි සමස්ත ඡන්දදායකයන්ගෙන් 42%කට ආසන්න සංඛ්‍යාවක් අවුරුදු 18-39 අතර වයස්වල අය බව පැවසෙනවා. මේ පිරිස දිනා ගැනීම සඳහා විජේ ඔවුන්ට සමීප සමාජ මාධ්‍ය වැනි වේදිකා ශූර ලෙස භාවිත කර තිබුණා. තරුණ පරපුරට විශාල වශයෙන් බලපාන රැකියා ප්‍රශ්න, අධ්‍යාපනය සම්බන්ධ ගැටලු ආදිය විසඳීම සඳහා ඔහු බොහෝ පොරොන්දු දී තිබෙනු දැකිය හැකි වුණා. රජයේ රැකියා ලක්ෂ 5ක් ඇති කරන බවත් පෞද්ගලික අංශයේ ද වෘත්තීය පුහුණුව සඳහා විශාල වශයෙන් අවස්ථා විවර කරන බවත් ඔහු පැවසුවා. රැකියා විරහිත උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් වැනි අයට මාසික දීමනා ලබා දෙන බවටත් විජේ පොරොන්දු වුණා.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිරත වන දිළිඳු පවුල්වල තරුණ තරුණියන්ට ඇප නොතබා ශිෂ්‍ය ණය ගත හැකි වැඩපිළිවෙළක් ඇති කරන බව ඔහුගේ තවත් පොරොන්දුවක්. අලුතෙන් ව්‍යාපාර ආරම්භ කරන තරුණ තරුණියන්ටත් ලක්ෂ ගණනින් ණය ආධාර ලබා දීමට විජේ පොරොන්දු වී තිබෙනවා.

පවුල්වල ගෘහ මූලිකත්වය දරන කාන්තාවන්ට මාසික මූල්‍ය දීමනාවක් ලබා දෙන බවට ද ප්‍රාන්තයේ පොදු ප්‍රවාහන සේවාවල කාන්තාවන්ට නොමිලේ ගමන් කිරීමට ඉඩ දෙන බවට ද විජේ පොරොන්දු වුණා. මධ්‍යම සහ අඩු ආදායම් ලබන පවුල්වලට වසරකට ගෑස් සිලින්ඩර 6ක් නොමිලේ ලබාදෙන බවක් ද ඔහු පැවසුවා.

විජේට මේ පොරොන්දු ඉටු කිරීමට හැකි වේවි ද? තමිල්නාඩු ඡන්දදායකයන් මෙන් ම විජේගේ දේශපාලන ගමන ගැන උනන්දුව දක්වන බොහෝදෙනා ද දැන් කුතුහලයෙන් යුතු ව බලා සිටින්නේ මේ ගැන.

# ලෝක සැරිසර

**චන්දන මාරසිංහ**



## සඳ මත කඳවුරක්

සඳ මත ස්ථිර කඳවුරක් ගොඩනැඟීම සඳහා වන නාසා ආයතනයේ සැලසුම්වල තවත් පියවරක් එළි දක්වා තිබෙනවා. රොබෝ ගොඩ බෑමේ යානා සහ ඩ්‍රෝන යානා ඇතුළු සඳට යැවීමට සැලසුම් කර ඇති වාහන පිළිබඳ තොරතුරු එසේ ප්‍රකාශයට පත් කළා. 2032 වසර වන විට සඳේ දකුණු ධ්‍රැවයෙහි න්‍යෂ්ටික හා සූර්ය බලයෙන් බලගැන්වෙන ස්ථිර කඳවුරක් ඉදිකිරීම නාසා ආයතනයේ අරමුණ වී තිබෙනවා. ඒ සඳහා ඔවුන් ප්‍රකාශයට පත් කළේ ඩොලර් බිලියන 20ක වැඩසටහනක්. නාසා ආයතනය සඳහන් කළේ Blue origin, Intuitive machines සහ astrobotic යන ආයතනවලට යානා නිෂ්පාදනය සඳහා කොන්ත්‍රාත් භාර දී ඇති බව. මෙට්‍රික් ටොන් 04ක භාණ්ඩ සඳට රැගෙන යාමටත් සැලසුම් කර තිබෙනවා. ඒ අනුව 2032 වසර වන විට මිනිසුන්ට සඳේ අර්ධ ස්ථිර නිවාසවල ජීවත් වීමට අවකාශ සැලසීමයි අරමුණ. රෝවර් යානාවලින් ගගනගාමීන්ට සඳේ පාෂාණමය මතුපිට ගමන් කිරීමටත් හැකි වනු ඇති. මේ සැලසුම් සාර්ථක වනු ඇත්තේ මිනිසුන් ආරක්ෂිත ව සඳ මතට ගෙන යා හැකි යානයක් නිෂ්පාදනය කිරීමෙන්.




## දින 88ක විරාමය

දින 88කට පසුව ඉරානය යළිත් අන්තර්ජාල සේවා ක්‍රියාත්මක කර තිබෙනවා. ඇමරිකාව හා ඊශ්‍රායලය ඒකාබද්ධ ව ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කළ දින (පෙබරවාරි 28 දින සිට) පටන් ඉරානය අන්තර්ජාල ප්‍රවේශය අවහිර කර තිබුණා. ක්‍රමානුකූල ව එම සේවා යථාතත්ත්වයට පත්වන බව NetBlocks ආයතනය සඳහන් කළා. ඔත්තු බැලීම හා සයිබර් ප්‍රහාර වැළැක්වීමේ අරමුණින් අන්තර්ජාලය කපා හැරිය බවයි ඉරාන බලධාරීන් පවසන්නේ. මෙය ලොව පුරා වාර්තා වූ දීර්ඝතම අන්තර්ජාල කපා හැරීම්වලින් එකක්. මේ සේවා යළි ලැබීමෙන් බොහෝ පිරිස පිරිසකට ආදායම් උත්පාදන මාර්ග විවෘත වුවත් අඛණ්ඩ ව මේ සේවා ලැබේ ද? යන්න පිළිබඳ ගැටලු පවතින බව NetBlocks ආයතනය සඳහන් කරනවා. තවමත් ඉරාන රජයේ පෙරහන් ජාල ක්‍රියාත්මක වන අතර WhatsApp සඳහා සීමා පවතිනවා.



## හමුදා අංශ ප්‍රධානී මරුට

හමාස් සංවිධාන හමුදා අංශ ප්‍රධානී Mohammed Odeh ඝාතනය කළ බව ඊශ්‍රායලය සඳහන් කළා. ඔහුගේ පූර්ව ගාමියා ප්‍රහාරයකින් මිය ගොස් දින කිහිපයකට පසුවයි මේ ප්‍රහාරය එල්ල වී තිබෙන්නේ. ඒ, ගාසා නගරයේ කාර්යබහුල ම වෙළෙඳපොළ ප්‍රදේශයක නේවාසික ගොඩනැගිල්ලක සිටියදී. හමුදා ප්‍රධානියා සැඟවුණු ස්ථානයක් ලෙසටයි එය සැලකෙන්නේ. මේ ගොඩනැගිල්ලේ ඔහුගේ චලන නිරීක්ෂණය කළ බව ඊශ්‍රායලය සඳහන් කළා. දින ගණනාවක සිට ලැබුණු බුද්ධි තොරතුරු විශ්ලේෂණය කරමින් මේ මෙහෙයුම සිදු කර තිබෙනවා.

ප්‍රහාරයෙන් පසුව ගලවා ගැනීමේ කණ්ඩායම් ළඟා වුව ද අදාළ ස්ථානවලට ප්‍රවේශ වීමට ඔවුන්ට නොහැකි වුණා. ඊශ්‍රායල ආරක්ෂක අංශ එල්ල කළ එම ප්‍රහාරයෙන් සිවිල් වැසියන් පිරිසක් ද මිය ගියා. ඒ අනුව මානුෂීය අර්බුදය ඉහළ ගොස් ඇති බවයි සහන කණ්ඩායම් පවසන්නේ.



## මානුෂීය මෙහෙයුම

ලාඕසයට බලපෑ ගංවතුර හේතුවෙන් ගුහාවක සිර වී සිටි හත්දෙනෙකු බේරා ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක වුණා. ඉන් පස්දෙනකු බේරාගත් අතර අනෙක් දෙදෙනා අතුරුදහන් වී ඇති බවයි සහන කණ්ඩායම් සඳහන් කළේ. සතියක පමණ කාලයක් ඔවුන් ගුහාවේ සිර වී සිටියා. මේ පිරිස රත්තරන් සහ වන සතුන් සෙවීම සඳහා ගුහාවට ගොස් ඇති අතර වර්ෂාව හා නාය යාම් හේතුවෙන් ගුහාවේ දොරටුව අවහිරවීම නිසා ඉන් පිටතට පැමිණීමට නොහැකි වී තිබෙනවා. කිමිදුම්කරුවන් ජලයෙන් යට වී ඇති පටු මාර්ග ඔස්සේ සෝදිසි මෙහෙයුම්වල නිරත වුණා. 2018 වසරේදී තායිලන්තයේ ගුහාවක සිර වී සිටි යොවුන් පාපන්දු ක්‍රීඩකයන් පිරිසක් බේරා ගැනීමට සම්බන්ධ වූ විශේෂඥයන් කිහිපදෙනෙකු මේ ගලවා ගැනීමේ මෙහෙයුමට ද එක්වුණා. එම ගලවා ගැනීමේ මෙහෙයුම් පදනම් කරගනිමින් චිත්‍රපට කිහිපයක් ද නිර්මාණය වී තිබෙනවා.



## එවරස්ට් නව වාර්තාවක්

දිනකදී කඳු නගින්නන් 274 දෙනකු එවරස්ට් කඳුමුදුන තරණය කරමින් නව වාර්තාවක් පිහිටුවා තිබෙනවා. එය කන්දේ දකුණු පාර්ශ්වයේ සිට දිනකදී කඳු මුදුනට ළඟා වූ වැඩි ම පිරිස ලෙසයි සැලකෙන්නේ. මීට පෙර 2019 වසරේ මැයි 22 දින 223 දෙනෙකු එකවර කන්ද තරණය කර තිබෙනවා. කඳු නගින්නන් වැඩි පිරිසක් එවරස්ට් කන්ද තරණයට උත්සාහ කරන්නේ මැයි මාසයේදී. ඊට හේතුව වන්නේ සුළඟේ දැඩි සීතල අවම වීම හා කඳු නගින්නන්ට සුළඟේ සහාය ද ලැබෙන බැවින්. අයිස් නිර්මාණය වීම නිසා කන්ද තරණය කරන්නන්ට බාධා මතු වූ අවස්ථා පවතිනවා. 2026 වසරේ ගත වූ කාලයේදී නේපාලය කඳු නගින්නන් සඳහා නිකුත් කර තිබෙන්නේ අවසර පත්‍ර 500කට ආසන්න සංඛ්‍යාවක්.



## මාර්ගය හසුරුවන කෘත්‍රිම බුද්ධිය

බංගලි දේශයේ ඩකා අගනුවර මාර්ග තදබදය අවම කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය මත ක්‍රියාත්මක වන රථවාහන අධීක්ෂණ පද්ධතියක් හඳුන්වා තිබෙනවා. රතු සංඥා නිකුත් කිරීම, නීති විරෝධී වාහන නතර කිරීම සහ මං තීරු උල්ලංඝනය වැනි වැරදි හඳුනා ගැනීමට හැකි වීම ආදිය ඊට අයත්. නව යන්ත්‍ර ක්‍රියාත්මක වීමත් සමඟ රියදුරන් වඩාත් විනයගරුක වී ඇති බවයි බංගලි දේශ පොලිසිය පවසන්නේ. ඇමරිකාවේ ජාතික ආර්ථික පර්යේෂණ කාර්යාංශය කළ අධ්‍යයනයකදී ලෝකයේ මන්දගාමී ම නගරයක් ලෙස ඩකා ශ්‍රේණිගත කර තිබෙනවා. එහි සාමාන්‍ය රථවාහන වේගය වූයේ පැයට කිලෝමීටර් 4.8ක් පමණ. එය ඇවිදීමේ වේගයටත් වඩා මන්දගාමී බවයි බලධාරින් පවසන්නේ. මේ අනුව කෘත්‍රිම බුද්ධිය සහිත නිරීක්ෂණ කැමරාවලින් උසස් ප්‍රතිඵල ලැබී තිබෙනවා



## ඇමරිකාවේ සිදු වන වෙනස

වසර 2050 පමණ වන විට ඇමරිකාවේ ප්‍රාන්ත කිහිපයක සුදු ජාතික ජනගහනය 50%ට වඩා අඩු විය හැකි බව පුරෝකථනය කර තිබෙනවා. Newyork post ඒ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කළා. ජාත්‍යන්තර සංක්‍රමණ, ගෘහස්ථ ජනගහන පාලනය හා උපත් අනුපාතය පහත වැටීම ආදී කරුණු පදනම් කරගෙන මේ ජන විකාශ වෙනස්කම් සිදු විය හැකියි. 1980 වසර වන විට 80%ක් වූ ඇමරිකාවේ සමස්ත සුදු ජාතික ජනගහනය 2050 වසර වන විට 47% දක්වා අඩුවිය හැකි බවටයි ඇත්තමේන්තුගත කර තිබෙන්නේ. එම ප්‍රාන්ත අතර නිව්යෝක්, නිව්ජර්සි, ෆ්ලොරිඩා, ජෝර්ජියා, ඇරිසෝනා ද වනවා. කැලිෆෝනියාව සහ ටෙක්සාස්හි ද එම ජනගහනය තියුණු පහත වැටීමක් සිදු විය හැකි බව සඳහන්. ඇතැම් ප්‍රාන්තවල සුදු ජාතික ජනගහනය ඉහළ අගයක් ගනු ඇති බවත් පුරෝකථනය කර තිබෙනවා. වර්ජිනියාවේ එය 86%ක් පමණ වනවා. රටේ විශාලතම ප්‍රාන්ත කිහිපයක ජන විකාශ පදනමේ පුළුල් වෙනස්කම් විය හැකි බවත් වාර්තා වන්නක්. 2060 වසර පමණ වන විට තවත් ප්‍රාන්ත කිහිපයක සුදු ජාතික ජනගහනය අඩුවිය හැකි බවත් පුරෝකතනය කර තිබෙන්නක්.



## නව ආයුධ රැසක්

උතුරු කොරියාව නව ආයුධ රැසක් අත්හදා බලා තිබෙනවා. නවීන යුද්ධවලට උපයෝගි කර ගැනීම වෙනුවෙන් උපායශීලී බැලැස්ටික් මිසයිල, කාලතුවක්කු, රොකට් සහ කෘත්‍රිම බුද්ධි මාර්ගෝපදේශ මගින් කෘෘස් මිසයිල අත්හදා බලා ඇති බව උතුරු කොරියානු මාධ්‍ය වාර්තා කළා.

ලොව වඩාත් ම උපායමාර්ගික ව වැදගත් වන ජල මාර්ගයක් වසා දැමීම නිසා චීනයට විශ්වාසදායක ගොඩබිම් ප්‍රවාහනයක් ලෙසයි රුසියාව සැලකෙන්නේ. සතියක් තුළ ඇමරිකා ජනාධිපතිවරයාට සහ රුසියා ජනාධිපතිවරයාට සත්කාරකත්වය සැපයීම චීනයේ දේශපාලන භූමිකාව ගැන අදහසක් ලබා ගැනීමට ඉතා වැදගත්. මේ දෙරට නායකයන් නිරන්තර විදෙස් සංචාරවල නිරත වන්නේ නැහැ. එහෙත් 2022 වසරේදී රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කරනු ලැබීමෙන් අනතුරුවයි චීනය සමඟ පැවති සම්බන්ධතා වඩාත් වර්ධනය වී තිබෙන්නේ.

දිගු දුර බැලන්ස්ටික් මිසයිල සහ න්‍යෂ්ටික අවි වැඩිදියුණු කිරීමෙන් අනතුරුවයි මේ නව අත්හදා බැලීම් සිදුකර තිබෙන්නේ. ඒ අනුව ඔවුන් උපායශීලී සහ සාම්ප්‍රදායික අවි ගබඩා වැඩිදියුණු කර තිබෙනවා. නවීන යුද්ධයක් ඇතිවුවහොත් ඊට සාර්ථක ව මුහුණදීමට මේ වැඩසටහන් සිදුකරන බවයි උතුරු කොරියාව පවසන්නේ. දකුණු කොරියාවේ දේශ සීමා ආශ්‍රිත ව කාලතුවක්කු ඒකකවල යොදවන කෲස් මිසයිල සඳහා කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීමයි ඔවුන්ගේ අරමුණ. කෘත්‍රිම බුද්ධි මාර්ගෝපදේශවලින් පාලනය වන මිසයිලවලින් කිලෝ මීටර 100ක් දුරින් පිහිටි ඉලක්කවලට පහර දිය හැකියි. දකුණු කොරියාවේ අගනුවර පවා ඉන් තර්ජනයට ලක්වනවා. ඩිජිටල් මාර්ගෝපදේශ පද්ධතියක් තාක්ෂණය සමඟ ඒකාබද්ධ කර මේ ආරක්ෂක ක්‍රමවේදය සකස් කර තිබුණත් එහි නවීනත්වය ගැන ස්වාධීන මත පළ වී නැහැ.

ඊශ්‍රායලය සිදුකරන මෙහෙයුම් අතරතුර ගාසා තීරයේ විවාහ මංගලෝත්සවයක් පැවැත්වුණා. එහිදී යුවළ 50ක් විවාහ දිවියට එළඹ තිබෙනවා. මානවීය සහන පදනම සංවිධාන කළ එම සමූහ මංගලෝත්සවය ගාසා තීරයට ආධාර කිරීමේ තවත් වැඩපිළිවෙළක් ලෙස සැලකෙනවා. 2026 මැයි 11 දින ගාසා තීරයේ ජනතාවට එයින් ලැබී තිබෙන්නේ මහත් විනෝදාත්මක අත්දැකීමක්. ජනතාව එය නර්තනයෙන් සැමරූ බවයි මාධ්‍ය වාර්තා කරන්නේ.

අග්‍රාමාත්‍යවරයා එරට ආරක්ෂක අංශවලට උපදෙස් ලබා දී තිබෙන්නේ. වරින් වර සිදු කරන මෙහෙයුම් හේතුවෙන් ජනතාවගේ මූලික අයිතීන් පවා උල්ලංඝනය වන බවයි සහන කණ්ඩායම් පෙන්වා දෙන්නේ.

ගැන අදහසක් ලබා ගැනීමට ඉතා වැදගත්. මේ දෙරට නායකයන් නිරන්තර විදෙස් සංචාරවල නිරත වන්නේ නැහැ. එහෙත් 2022 වසරේදී රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කරනු ලැබීමෙන් අනතුරුවයි චීනය සමඟ පැවති සම්බන්ධතා වඩාත් වර්ධනය වී තිබෙන්නේ.



## ගාසාවේ මංගල සීනු

ඊශ්‍රායලය සිදුකරන මෙහෙයුම් අතරතුර ගාසා තීරයේ විවාහ මංගලෝත්සවයක් පැවැත්වුණා. එහිදී යුවළ 50ක් විවාහ දිවියට එළඹ තිබෙනවා. මානවීය සහන පදනම සංවිධාන කළ එම සමූහ මංගලෝත්සවය ගාසා තීරයට ආධාර කිරීමේ තවත් වැඩපිළිවෙළක් ලෙස සැලකෙනවා. 2026 මැයි 11 දින ගාසා තීරයේ ජනතාවට එයින් ලැබී තිබෙන්නේ මහත් විනෝදාත්මක අත්දැකීමක්. ජනතාව එය නර්තනයෙන් සැමරූ බවයි මාධ්‍ය වාර්තා කරන්නේ. මීට පෙර අවස්ථා කිහිපයකදී ම ගාසා තීරයේ සමූහ විවාහ මංගලෝත්සව පවත්වා තිබෙනවා. දැඩි අර්බුදකාරී වාතාවරණයක් පවතින ගාසා තීරයෙන් 70%ක ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට කටයුතු කරන ලෙසයි ඊශ්‍රායල



## චීන - රුසියා සබඳතා

රුසියා ජනාධිපති Vladimir Putin චීනයේ සංචාරයක නිරත වුණා. ඇමරිකා ජනාධිපතිවරයා චීනයෙන් පිට ව ගොස් දින කිහිපයකට පසුවයි, රුසියා ජනාධිපතිවරයාගේ සංචාරය සිදු වුණේ. වසරකටත් අඩු කාලයකදී Vladimir Putin සහ Xi Jinping දෙරට නායකයන් දෙදෙනා හමු වූ දෙවැනි අවස්ථාවයි මේ. ඇමරිකාව සමඟ රුසියාව සහ චීනය උපායමාර්ගික සම්බන්ධතා පවත්වන අතර යුක්රේන යුද්ධය මෙන් ම හෝමූස් වසා තැබීමෙන් ඇති වන බලපෑම් හමුවේ රුසියාව සහ චීනය තවදුරටත් සමීප වී තිබෙනවා. ලොව වඩාත් ම උපායමාර්ගික ව වැදගත් වන ජල මාර්ගයක් වසා දැමීම නිසා චීනයට විශ්වාසදායක ගොඩබිම් ප්‍රවාහනයක් ලෙසයි රුසියාව සැලකෙන්නේ. සතියක් තුළ ඇමරිකා ජනාධිපතිවරයාට සහ රුසියා ජනාධිපතිවරයාට සත්කාරකත්වය සැපයීම චීනයේ දේශපාලන භූමිකාව



## හිටපු ජනාධිපතිට චෝදනා

කියුබාවේ හිටපු ජනාධිපති Raúl Castroට ඇමරිකාව මිනී මැරීමේ චෝදනා එල්ල කළා. ඒ, 1996 වසරේදී ගුවන්යානා දෙකක් බිඳ හෙළීමෙන් ඇමරිකන් ජාතිකයන් ඝාතනය කළ බවට. එහිදී පුද්ගලයන් 04 දෙනකු ඝාතනය කර ඇති බවයි ඇමරිකාව පවසන්නේ. කියුබාව සහ ෆ්ලෝරිඩාව අතර ගමන් කරමින් තිබූ යානා දෙකකට වෙඩි තැබීමෙන් මේ අනතුර සිදුකර තිබෙනවා. මෙහිදී හිටපු ජනාධිපතිවරයා ඇතුළු 05 දෙනෙකුට චෝදනා එල්ල වුණා. කියුබා-ඇමරිකා විරෝධී කණ්ඩායමක් වන Brothers to the Rescue ප්‍රහාරය මෙහෙයවා ඇති බවටයි තොරතුරු හෙළි වුණේ. වර්තමාන කියුබා ජනපති Miguel Díaz-Canel පවසන්නේ මෙය කිසිදු නීතිමය පදනමක් නොමැති දේශපාලන ප්‍රකාශයක් බව. රුසියාව හා චීනය ද මේ ප්‍රකාශය හෙළා දැක තිබෙනවා. ඒ අතර ඇමරිකා රාජ්‍ය ලේකම් Marco Rubio සඳහන් කළේ ඇමරිකාවට කියුබාව තර්ජනයක් බව. ජනාධිපති Donald Trump මීට පෙර සඳහන් කර තිබුණේ කියුබාව ත්‍රස්තවාදී හිතවාදී රටක් බව. ඇමරිකාව රාජ්‍ය තාන්ත්‍රික විසඳුම්වලට කැමති බවත් එසේ නැතිනම් ඕනෑ ම තර්ජනයකින් රට ආරක්ෂා කිරීමට ජනපති Trumpට අයිතියක් ඇති බවත් මෙහිදී ලේකම්වරයා සඳහන් කර තිබෙනවා.

# සොබාදහමේ ඉකිබිඳුම



**ශාලික විමලසේන**

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් ලෝක පරිසර දිනය **Urgent Climate Action** යන ගෝලීය තේමාව යටතේ මෙවර සමරන්නේ 54 වැනි වරට. එක්සත් ජාතීන්ගේ මහාසභාව විසින් ගන්නා ලද තීරණයකට අනුව ජුනි 05 දින ලෝක පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් කෙරුණා. එතැන් සිට දශක පහකට වැඩි කාලයක් කාලීන පාරිසරික තේමා ඔස්සේ මෙය සමරන්නේ පරිසරය සංරක්ෂණය පිළිබඳ ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමටත් ගෝලීය පාරිසරික ගැටලු පිළිබඳ ලෝක නායකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කරලීමටත්. ශ්‍රී ලංකාව මේ සඳහා ප්‍රවේශය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ ‘දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමට ක්‍රියාත්මක වෙමු’ යන දේශීය තේමාව අනුව යමින්. එබැවින් මෙවර දෙසතිය කවරයේ කතාවේ කතාබහ සිදු වන්නේ මේ සම්බන්ධ ව අවධානය යොමු කරමින්.

“උඹ බොරුකාරයෙක්. උඹලාගේ විදුලිය අපට එපා. අපේ ගංගාවන්ට නිදහසේ ගලන්නට ඉඩ දීපල්ලා. උඹලාටත් අපිටත් ජීවත් වන්නට ලැබෙන්නේ එවිටයි. එහෙම නොවුණොත් අපි ඔක්කොටම පණ පිටින් මිය යන්නට සිදු වෙනවා. ඒත් උඹලාට ඒක තේරෙන්නෙ නෑ. උඹලා අන්ධ මිනිස්සු. උඹලාගේ මේ යන්ත්‍ර-සූත්‍රත් අරගෙන වහා ම පිටවෙයල්ලා.”

මේ තර්ජනය කරන ලද්දේ ඇමසෝන් වනාන්තරයේ ආදිවාසී නායිකාවක් විසින්. කයාපෝ ආදිවාසී සමූහයේ ටුහිරා කයාපෝ මේ ආකාරයට තර්ජනය කරන ලද්දේ ඇමසෝනය හරහා ගලන ෂිංගු ගංගාවේ ජලය හරස් කරමින් දැවැන්ත වේල්ලක් තනා, ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමට පැමිණි ඇමරිකාව ප්‍රමුඛ කරගත් දැවැන්ත සමාගමක ප්‍රධාන ඉංජිනේරුවරයාට. අන්තර්ජාතික මාධ්‍ය ඉදිරියේ ඇය කළ මේ තර්ජනය ලෝකය පුරා බහුජාතික සමාගම් සලිත කරන්නට සමත් වුණා.

ඇමසෝනයේ තවත් සටනකට මුල්වන්නේ වරෝනි ආදිවාසී ජනතාව. ලෝකයේ විශාලතම තෙල් සමාගමකට එරෙහි ව නඩු කී ඔවුන් 2019 ජූලි මාසයේදී නඩුවෙන් දිනුවා. අක්කර මිලියන හතක් පුරා පැතිරුණු තෙල් නිධි කට්ටි 20කට ආසන්න සංඛ්‍යාවක් අදාළ සමාගමට පවරා දීම නීතිවිරෝධී බවට අධිකරණය තීන්දු කළේ ආදිවාසීන් ඉදිරියේ ඉක්වදෝර ආණ්ඩුව අන්ත පරාජයකට පත්කරමින්. මෙය 2012 වසරේ සිට ඇදි-ඇදී තිබුණු නඩුවක්. ඉක්වදෝර් ආණ්ඩුව අවස්ථා දෙකකදී මීට එරෙහි ව අභියාචනා ගොනු කළත් ඵලක් වී නැහැ.

නඩුව දිනූ පසු වරෝනි ආදිවාසී නායක නෙමොන්තේ මෙසේ කියා තිබුණා.

“වැසි වනාන්තර කියන්නේ අපේ ජීවිතය. අපේ ජීවිතය රැඳිලා තිබෙන වැසි වනාන්තරවල සිද්ධ වෙන්නේ මොකක් ද? කරන්න ඕනෙ මොනව ද? කියලා තීරණය කරන්නෙ අපි. අපේ භූමිය තෙල් සමාගම්වලට විකුණලා, විනාශ කරන්න අපට කිසි ම අදහසක් නැහැ. ආණ්ඩුව අපේ අනුදැනුමකින් තොර ව, රහසිගත ව මේ සම්පත

> වැසි වනාන්තර කියන්නේ අපේ ජීවිතය. අපේ ජීවිතය රැඳිලා තිබෙන වැසි වනාන්තරවල සිද්ධ වෙන්නේ මොකක් ද? කරන්න ඕනෙ මොනව ද? කියලා තීරණය කරන්නෙ අපි. අපේ භූමිය තෙල් සමාගම්වලට විකුණලා, විනාශ කරන්න අපට කිසි ම අදහසක් නැහැ. ආණ්ඩුව අපේ අනුදැනුමකින් තොර ව, රහසිගත ව මේ සම්පත සමාගම්වලට විකුණන්නයි සූදානම් වුණේ.

සමාගම්වලට විකුණන්නයි සූදානම් වුණේ. අද උසාවිය තීරණය කරලා තිබෙනවා, වරෝනි ජනතාව ඇතුළු සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු බව. ඒක ඉතා ම වැදගත්.”

ඉන්දියාවේ මුන්ඩ්‍රා ප්‍රදේශයේ ඉදිකරන්නට සූදානම් වූ ගල් අඟුරු බලාගාරයට එරෙහි ව එරට පරිසර සංවිධාන අවුරුදු හයක් තිස්සේ කී නඩුවෙන් ලෝක බැංකුව පැරදුණා. මුන්ඩ්‍රා පරිසර පද්ධතිය දිනුවා. ශ්‍රී ලංකාවේ චුන්නාකම් තාප බලාගාරය නිසා ජනතාවට බොන්නට තිබූ ජලය සම්පූර්ණයෙන් ම විනාශ වුණා. ඊට එරෙහි ව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ නඩුවෙන් ජනතාව දිනූ අතර අධිකරණය නියෝග කළේ තාප බලාගාරයේ කටයුතු වහා ම නතර කිරීමටත් ජනතාවට වන්දි ලබාදීමටත්. දූෂකයා ගෙවීමේ මූලධර්මය ලංකාවේදී භාවිත වූ තීරණාත්මක නඩුවක් එය.

භික්ෂූන් වහන්සේ දෙනමක් එක් ව දේශපාලනඥයන්ගේ, පොලිස් නිලධාරින්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහායෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාකොළගනේ, ඊරියාව, ඇතිනිමලේ, පාලුකඩවල, මානක්කුලියාගම, දිවුල්වැව හා කැලේගම යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි අලි - ඇතුන්ගේ වාසස්ථාන හා වැව්වල ජලපෝෂක ප්‍රදේශ ලෙස පැවති රජයේ වනාන්තර ඉඩම් ඇතුළු ව ජනතාවගේ වගා බිම් අක්කර 2000කට වැඩි ප්‍රමාණයක් බලහත්කාරයෙන් අත්පත් කරගෙන නාකොළගනේ රජමහා විහාරයට අයත් නින්දගම් ඉඩම් යැයි සඳහන් කර ව්‍යාපාරිකයන්ට හා විවිධ සමාග ම්වලට බදු දීමේ දැවැන්ත ජාවාරමක් ක්‍රියාත්මක වුණා. එක් දීර්ඝ වාක්‍යයකට මේ කතාව සාරාංශ කර දැක්වූයේ මේ කතාව කොතරම් බරපතළ ද යන්න ඔබට වැටහීමක් ඇතිකර දීමට. කෙසේ වෙතත් ප්‍රදේශවාසීන්ගේ, පරිසරවේදීන්ගේ, පරිසර යුක්ති කේන්ද්‍රයේ දීර්ඝකාලීන මැදිහත්වීමකින් පසු මේ ජාවාරමට එරෙහි ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරුණා. SC/FR/ 351/2022 අංක දරන මේ මූලික අයිතිවාසිකම් නඩුවේදී ඉදිරිපත් වූ සියලු කරුණු සලකා බැලීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය අවධාරණය කළේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 (f) වගන්තිය යටතේ ස්වභාවධර්මය සුරැකීම සෑම පුරවැසියෙකුගේ ම වගකීමක් බව. විහාර හා දේවාලගම් පනත සහ සන්නස පිළිබඳ මෙහිදී අධිකරණය වැදගත් නිරීක්ෂණයක් ඉදිරිපත් කළා. ඒ, සන්නසකින් ඉඩම් පූජා කර ඇත්තේ ආගමික කටයුතු සහ විහාරස්ථානයේ නඩත්තුව සඳහා මිස පෞද්ගලික වාසියට හෝ පරිසරය විනාශ කිරීමට හෝ නොවන බව.

උදාහරණ සිය ගණනක් අතරින් මේ උදාහරණ කිහිපය මුලින් ම ගොනු කළේ ජනතාවගේ ක්‍රියාකාරකම් නිසා අහිමි වන පරිසර පද්ධති, ජනතාව විසින් ම කරනු ලබන අරගලවලින් ආරක්ෂා




මෑතකාලීන ව වැඩි ම ගෝලීය උෂ්ණත්වය වාර්තා වූයේ 2016 වසරේදී. එම අගය 1.28°Cක්. එතෙක් ගෝලීය වශයෙන් වැඩි ම උෂ්ණත්වය ලෙස වාර්තා මගින් දැක්වූයේ පූර්ව කාර්මීකරණ යුගය වන අතර දැන් පර්යේෂකයන් පවසන්නේ එම අගය ශීඝ්‍රයෙන් ඉක්මවා යමින් තිබෙන බව. 2027 වසරට පෙර එය සිදුවන බවයි ඔවුන්ගේ 98%ක් ම විශ්වාස.



කරගනිමින් සිටින බව පෙන්වීමට. එනම් මෙය සාමූහික ක්‍රියාවලියක්.

## සාමූහික සටන් ලෝකය මුදාගනියි ද?

ලෝකයේ බිලියන 03කට අධික ජනතාවකට 2070 වසර වන විට ජීවත් විය නොහැකි උෂ්ණත්වයක් සහිත ස්ථානවල වාසය කිරීමට සිදුවන බව අධ්‍යයනයකින් හෙළි වී තිබෙන කරුණක්. හරිතාගාර වායු විමෝචනය අවම නොවන්නේ නම්, ඉදිරි වසර කිහිපයේ විශාල පිරිසකට සාමාන්‍ය උෂ්ණත්වය වන 29°Cකට වඩා වැඩි උෂ්ණත්වයක් සහිත දේශගුණයක ජීවත්වීමට සිදු වනු ඇති බව ද එම අධ්‍යයනය පෙන්වා දෙනවා. එංගලන්තයේ එක්සෙටර් විශ්වවිද්‍යාලයේ දේශගුණික විශේෂඥ සහ ගෝලීය පද්ධති ආයතනයේ අධ්‍යක්ෂ Tim Lenton විනයේ, එක්සත් ජනපදයේ සහ යුරෝපයේ විද්‍යාඥයන් සමග එක් ව මේ අධ්‍යයනය සිදු කර තිබෙන්නේ එක්සත් ජාතීන්ගේ ජනගහන ප්‍රක්ෂේපණ සහ 3°Cකින් ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම යන දත්ත එකතුව පදනම් කරගෙන. පැරිස් දේශගුණික ගිවිසුමට අනුව ක්‍රියාකරන රටවල පවා උෂ්ණත්වය 3°Cකින් ඉහළ යෑමේ දැඩි නැඹුරුවක් පවතින බව එක්සත් ජාතීන්ගේ නවතම වාර්තාවක දැක්වෙනවා.

අධ්‍යක්ෂ Tim Lenton රොයිටර් සහ බීබීසී වෙත මෙසේ පවසා තිබුණා." භූමිය සාගරයට වඩා වේගයෙන් උණුසුම් වන බැවින් භූමිය 3°Cකට වඩා උණුසුම් වෙනවා. මේක සරල ව සැලකීම ම මිනිසා ඇතුළු ජීවීන්ට කරන විශාල හානියක්. මිනිසුන් උණුසුම් ස්ථානවලට ව්‍යාප්ත වීමත් සමග ඔවුන්ගේ උෂ්ණත්වයත් වැඩිවෙනවා. භූමියේ උෂ්ණත්වය 1°Cකින් ඉහළ යන විට දළ වශයෙන් බිලියනයක පමණ ජනතාවකට එය බලපාන බව පර්යේෂණ දත්තවලින් පෙනෙනවා. එම නිසා 1°Cකින් හෝ භූමිය උණුසුම් වීම වළක්වා ගතහොත් අපට මිනිසුන්ගේ ජීවිතයේ විශාල වෙනසක් සිදුකරන්න පුළුවන්."

පර්යේෂකයන් පවසන්නේ 2027 වසර අවසානය වන විට ගෝලීය උෂ්ණත්ව මට්ටම 1.5°Cකින් ඉහළ යෑමට 66%ක සම්භාවිතාවක් පවතින බව. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන වායු විමෝචන සහ එල්-නිනෝ (El-nino) කාලගුණ රටාව හේතුවෙන් ඊට ඇති ඉඩකඩ දිනෙන්-දින ඉහළ යමින් පවතිනවා. එල්නිනෝ යනු පැසිෆික් සාගරයේ මතුපිට ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් ඇති වන ක්‍රියාවලියක්. පසුගිය වසර කිහිපයේදී ලෝකය අත්දුටු ලා-නිනා (La-nino) සංසිද්ධිය දේශගුණික උණුසුම යම් තරමකට අඩු කිරීමට හේතු වුණා. එහෙත් එල්-නිනෝ මගින් පැසිෆික් සාගරයේ මතුපිටට ගෙන එන අමතර උණුසුම ගෝලීය උෂ්ණත්වයට දැඩි බලපෑම් එල්ල කරනවා. වර්තමානයේ ශ්‍රී ලංකාවට ද බලපෑම් කරනු ඇතැයි අනාවැකි පළ වී ඇත්තේ මේ එල්නිනෝ තත්ත්වය.

මෑතකාලීන ව වැඩි ම ගෝලීය උෂ්ණත්වය වාර්තා වූයේ 2016 වසරේදී. එම අගය 1.28°Ck. එතෙක් ගෝලීය වශයෙන් වැඩි ම උෂ්ණත්වය ලෙස වාර්තා මගින් දැක්වූයේ පූර්ව කාර්මීකරණ යුගය වන අතර දැන් පර්යේෂකයන් පවසන්නේ එම අගය ශීඝ්‍රයෙන් ඉක්මවා යමින් තිබෙන බව. 2027 වසරට පෙර එය සිදුවන බවයි ඔවුන්ගේ 98%ක් ම විශ්වාස.

2050 වසර වන විට කාබන් විමෝචනය බිංදුව දක්වා (net zero) ගෙන ඒමට බොහෝ රටවල් ප්‍රතිඥා දී තිබෙනවා. මෙයින් අදහස් කරන්නේ හරිතාගාර වායු විමෝචනය හැකිතාක් අවම කිරීම සහ ඉතිරි විමෝචනයට සමාන ප්‍රමාණයක් වායුගෝලයෙන් අවශෝෂණය කර සමතුලිත කිරීම. මෙය ළඟා කරගත හැකි ඉලක්කයක් ලෙස විශේෂඥයන් පැවසුවත් ඒ සඳහා රාජ්‍යවල කැපවීම අනිවාර්ය වෙනවා.

## ලංකාව තිබුණේ කොතැනද?

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් කොටසෙහි 27(14) උප ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කර සුරක්ෂිත කර වැඩිදියුණු කළ යුතු බව සඳහන්. එහෙත් කාලයක් පුරා සිදු කර ඇත්තේ ජනතාවට ජීවත් වීමට ඇති අයිතිය අහිමි කරමින් පරිසරය විනාශ කර පරිසර සුරක්ෂිතතාව බිඳ දැමීමට වනාන්තර හා තෘණ භූමි සමාගම්වලට ලබාදීම. මේ නිසා උල්ලංඝනය කර

ඇත්තේ ආණ්ඩුවල වුවමනාව මත රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම.

2009 අංක 65 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ (කැළෑ ආඥා පනත) 20 වැනි වගන්තියෙන් රක්ෂිත නොවන, අනාගතයේදී රක්ෂිත ලෙස ප්‍රකාශයට පත්කිරීමට යෝජිත වනාන්තර විශාල ප්‍රමාණයක් රජයට අයත් වෙනත් කැළෑ වශයෙන් ආරක්ෂා කර තිබුණා. මේවා රක්ෂිත වනාන්තර අතර සම්බන්ධතාව ඇති කරන, වැව් හා ජලාශවල ජලපෝෂක ලෙස ක්‍රියාත්මක වන, වඳවීමේ තර්ජනයට දරුණු ලෙස මුහුණ පා සිටින ඉතා ම දුර්ලභ හා ආවේණික ජීවී විශේෂ බොහොමයකට වාසස්ථාන සපයන, අලි-ඇතුන්ගේ ප්‍රධාන වාසස්ථාන හා අලි මංකඩ ලෙස ක්‍රියාත්මක වන සුවිශේෂ වනාන්තර පද්ධති. මේ වනාන්තර පද්ධතිවල ආරක්ෂාව තහවුරු කර ඇති පනතේ 20 වැනි වගන්තිය සංශෝධනය කිරීමට අවස්ථා ගණනාවකදී උත්සාහ දැරුවා.

2024 මාර්තු 4 දින කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත්තේ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ හා ව්‍යවස්ථාපිත ආයතන සතු ඉඩම්, විධිමත් ලෙස බැහැර කිරීම සඳහා ඉඩම් කළමනාකරණ භාරයක් ස්ථාපිත කිරීමට. මීට ප්‍රථම දීර්ඝකාලීන බදු පදනම මත වවුනියාව දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 72,000ක් උක් වගා කිරීම සඳහා තායිලන්තයේ සුවෙක් ඉංජිනියරින් පුද්ගලික සමාගමට ලබාදීමට 2023 ජූනි 26 දින කැබිනට් අනුමැතිය ලබා ගැනුණා. අවුරා ලංකා හර්බල් පුද්ගලික සමාගමට අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අක්කර 104,000ක් ලබාදීමට 2021 අගෝස්තු 30 දින කැබිනට් අනුමැතිය ලබා දී තිබෙනවා. මෙවැනි උදාහරණ කොපමණක් ද? වන සංරක්ෂණ ආඥා පනතේ 20 වගන්තිය මේ සියල්ල නිදහසේ සිදුකිරීමට බාධා කළ එක් ප්‍රතිපාදනයක්.

මීට පෙර වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 2020 නොවැම්බර් 04 දින 01/2020 චක්‍රලේඛය මගින් රක්ෂිත නොවන රජයේ වනාන්තර ඉඩම් සියල්ල ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් යටතට පත්කර ගැනීමට උත්සාහ ගැනුණා. ඉන්පසු ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ආර්. ඒ. ඒ. කේ. රණවක විසින් රජයේ ඉඩම් මැන වෙන් කිරීම යන ශීර්ෂය යටතේ 2021 අගෝස්තු 6 දින අංක 02/2021 දරන චක්‍රලේඛය මගින් ඉහත චක්‍රලේඛයෙන් වෙන් කර ගත් රජයේ වනාන්තර, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 8 වැනි වගන්තියට අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධිවිධානවලට යටත් ව ප්‍රාදේශීය ලේකම්වරුන්ට මැන වෙන් කළ හැකි බැවින් විවිධ සංවර්ධන කටයුතු, ගම් පුළුල් කිරීම හා අනාගත සංවර්ධන කටයුතු සඳහා ආරක්ෂා කිරීමට මැනීම් කර වෙන්කර ගැනීමට උත්සාහ කෙරුණා. එහෙත් මේ චක්‍රලේඛ, වන සංරක්ෂණ ආඥා පනතේ 20 වැනි වගන්තිය උල්ලංඝනය කරන බව ඔප්පු කිරීම නිසා අධිකරණය මගින් ඒවා ක්‍රියාත්මක වීම වළක්වා ගත හැකි වුණා.

පර්යේෂකයන් පවසන්නේ 2027 වසර අවසානය වන විට ගෝලීය උෂ්ණත්ව මට්ටම 1.5°Cකින් ඉහළ යෑමට 66%ක සම්භාවිතාවක් පවතින බව. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන වායු විමෝචන සහ එල්-නිනෝ (El-nino) කාලගුණ රටාව හේතුවෙන් ඊට ඇති ඉඩකඩ දිනෙන්-දින ඉහළ යමින් පවතිනවා. එල්නිනෝ යනු පැසිෆික් සාගරයේ මතුපිට ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් ඇති වන ක්‍රියාවලියක්. පසුගිය වසර කිහිපයේදී ලෝකය අත්දුටු ලා-නිනා (La-nino) සංසිද්ධිය දේශගුණික උණුසුම යම් තරමකට අඩු කිරීමට හේතු වුණා.

මීට පෙර මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූයේ 05/2001 චක්‍රලේඛය. රජයට අයත් සියලු ම කැළෑ කළමනාකරණය සහ පාලනය සඳහා 2001 වසරේදී නිකුත් කරන ලද එම චක්‍රලේඛය අහෝසි කිරීමයි මෙයින් සිදු වුණේ. 2001 වසරේ චක්‍රලේඛයට අනුව රජයේ කැළෑ ඉඩමක් ආයෝජන ව්‍යාපෘතියක් සඳහා පවරන්නේ නම් ඒ සඳහා වන සංරක්ෂණ, පරිසර, වනජීවී, ඉඩම්



ඇතුළු ආයතන ගණනාවකින් විධිමත් අනුමැතියක් ලබාගැනීම අනිවාර්ය වුණා. එහෙත් 2020 ජූලි 01 දින කැබිනට් මණ්ඩලය අනුමත කළ උපදෙස් මත නිකුත් කෙරුණු 01/2020 චක්‍රලේඛයට අනුව එසේ අදාළ ඉඩම් පැවරීමේදී ආයතන ගණනාවකින් අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය නොවන බව සඳහන්. එය දිස්ත්‍රික් ලේකම්වරයාට සහ ප්‍රාදේශීය ලේකම්වරයාට තනි ව කළ හැකි කරුණක් ලෙස දක්වා තිබුණා.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ව තිබූ වන රක්ෂිත භූමි හෙක්ටයාර 134,362.15ක් (අක්කර 331,874. 51ක්) 2021, 2022 යන වසරවලදී පමණක් විවිධ පෞද්ගලික ව්‍යාපෘති සඳහා ලබා දී තිබුණේ මේ ආවරණය යටතේ. මේ බව හෙළි වුණේ ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව හමුවට ඉදිරිපත් වූ වාර්තාවකින්.

## දුප්පත් රටක සිට පොහොසත් රටක් දක්වා

වර්ෂ 2010දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ අවසන් විධිමත් වනාන්තර සංගණනයට අනුව මෙරට සමස්ත වනාන්තර ආවරණය හෙක්ටයාර 19,51,473ක්. එය මෙරට සමස්ත භූමි ප්‍රමාණයෙන් 29.7%ක්. මේ වනාන්තර ආවරණයට තෙත්, අතරමැදි, වියළි හා ශුෂ්ක කලාපවල පිහිටි ඝන වනාන්තර මෙන් ම විවෘත වනාන්තර, කටු පඳුරු සහිත ලඳු කැළෑ, කඩොලාන වනාන්තර හා තෘණ භූමි අයත්. මේ අතරින් පහතරට වැසි වනාන්තර ඉතිරි වී ඇත්තේ 1.9%ක්. එනම් හෙක්ටයාර 1,23,302ක්. ඉහළ කඳුකර වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 44,758ක් (0.7%ක්). උප කඳුකර වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 28,513ක් (0.4%ක්). වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර හෙක්ටයාර 11,21,392ක් නැතහොත් 17.1%ක ප්‍රමාණයක් පවතිනවා. කඩොලාන වනාන්තර තිබෙන්නේ 0.2%ක් නැතහොත් හෙක්ටයාර 15,670ක්.



ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණය වන වර්ග කිලෝමීටර 65,610න් වර්ග කිලෝමීටර් 59,217ක් පුරා ගංගා ද්‍රෝණි තිබෙන්නේ 103ක්. වර්ග කිලෝමීටර් 6,393ක මතුපිට ජල ද්‍රෝණි කිසිවක් නැහැ. වර්ග කිලෝමීටර් 100ක පමණ පවතින්නේ වර්ෂා කාලයේදී පමණක් සක්‍රිය වන ජල ද්‍රෝණි. මේ සියල්ලේ ම පැවැත්ම වනාන්තර. ජාතික භෞතික සැලැස්ම සහ ඊට අදාළ පරිසර සංරක්ෂණ දත්ත වාර්තා මෙන් ම ජල සම්පත් කළමනාකරණය සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා පෙන්වා දෙන ආකාරයට ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය හෙක්ටයාර් මීටර් මිලියන 12ක් වන අතර ඉන් 55%කට වැඩි ජල ප්‍රමාණයක් වාෂ්පීකරණය හා ශාකවලින් උත්ස්වේදනය නිසා ඉවත් වෙනවා. 15%ක පමණ ජල ප්‍රමාණයක් භූගත ජලය ලෙස තැන්පත් වෙනවා. වාරි කර්මාන්තය ඇතුළු අනෙකුත් සියලු කාර්ය සඳහා ඉතිරි වන්නේ 30%ක ජල ප්‍රමාණයක්. එනම් හෙක්ටයාර් මිලියන 3.5ක ජල පරිමාවක්. මෙරට භූමි-ජල අනුපාතය වර්ග කිලෝමීටරයකට (හෙක්ටයාර් 100කට) හෙක්ටයාර් 3ක් වන අතර එය ලෝකයේ රටවල් අතර ඇති ඉහළ ම අගයක්. මෙරට මිරිදිය පවතින මතුපිට භූමි පැතිරුම හෙක්ටයාර් 2,60,000ක් ලෙස සඳහන්. වසරේ කිසිදු දිනක නොසිඳෙන ජලාශ හා වැව්වල මතුපිට ජල පැතිරුම හෙක්ටයාර් 1,55,000ක්. සෘතුමය වශයෙන් පිරී යන වැව්වල මතුපිට ජල පැතිරුම හෙක්ටයාර් 1,00,000ක්. ජල ගැලුම් නිම්නය වැනි විල්ලු පරිසර පද්ධතිවල ජල පැතිරුම හෙක්ටයාර් 5,000ක්. මේ ආකාරයෙන් පවතින මතුපිට ජලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය හා ජල විදුලිබල උත්පාදනය සඳහායි භාවිත වන්නේ. අද වන විට භූගත ජලයෙන් විශාල ප්‍රමාණයක් පානීය ජල බෝතල් සඳහා සහ කර්මාන්ත ශාලාවල භාවිතය සඳහා යොදා ගැනෙනවා.

1977න් පසු බලයට පත්වූ සියලු ආණ්ඩු අඩු-වැඩි වශයෙන් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තියක් වන්නේ රටේ සමස්ත ජීවීන්ගේ සියලු පොදු ස්වාභාවික සම්පත් ඔවුන්ට අහිමි කිරීමේ ප්‍රතිපත්තිය. 1996 වසරේදී මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා සකස් කළ Sri Lanka Nonplantation Crop Sector Policy Alternatives නම් වාර්තාවේ සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ගොවියන් සිදු කරන කුඩා පරිමාණ, පරිසර හිතැති කෘෂිකර්මාන්තය අවාසිසහගත බැවින් ඒ සඳහා විකල්පයක් ලෙස මහා පරිමාණ වාණිජ වගා සඳහා පිවිසීම වැදගත් වන බව. පොහොසත් රටක් දිළිඳු බවට අප පත්කර ගත්තේ එලෙස.

එම දිළිඳු බව විසින් දිට්වා සුළි කුණාටුවේදී සිදු කරන ලද විනාශය ගැන අමුතුවෙන් කියන්නට අවශ්‍ය නැහැ. එය අප දෑසින් දුටු මෑතකාලීන මතකය. ස්වාභාවික ආපදා වැළැක්විය නොහැකි වුවත් ඒ ආපදාවේ විනාශය වැළැක්විය හැකියි. ඒ සඳහා නිවැරදි, අනාගත දැක්මක් සහිත සැලසුම් ක්‍රියාත්මක විය යුතු වෙනවා. ජාතික පාරිසරික පනත බලධාරීන්ගේ සහ ජනතාවගේ යන දෙපාර්ශ්වයේ ම වගකීම් පිළිබඳ නීති සකස් කරමින් සංශෝධනය වන්නේ එවැනි තත්ත්වයක් යටතේ. අවශ්‍ය වන්නේ නිශ්චිත, දීර්ඝකාලීන සැලසුම් සහිත ආණ්ඩු මාරු වන විට වෙනස් නොවන තිරසර පරිසර ප්‍රතිපත්තියක්. රටේ හෙට දවස පොහොසත් වන්නේත් ජනතාවට ලස්සන ජීවිතයක් උරුම වන්නේත් ඒ පාරේ ගිය විට.



# සියලු රාජ්‍ය ආයතන ඒකාබද්ධ වැඩපිළිවෙළක්

ආචාර්ය **රවීන්ද්‍ර කාරියවසම්**
ජ්‍යේෂ්ඨ උපදේශක, පරිසර අමාත්‍යාංශය

දේශගුණික විපර්යාස අවම කරන්නට මැදිහත් වීම මෙන් ම එය විධිමත් පිළිවෙළකට සිදුකිරීමයි අපට තිබෙන අභියෝගය. 2025 පරිසර දිනයේදී ජනාධිපති අනුර කුමාර දිසානායක ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කරගන්නට, පරිසර විනාශය අවම කරන්න අවශ්‍ය සියලු පියවර ගන්නා බව පැහැදිලි ව පැවසුවා. වත්මන් ආණ්ඩුවේ පරිසර ප්‍රතිපත්තියට අනුව ජනාධිපතිවරයාගේ උපදෙස් මත සිට පරිසර ප්‍රශ්න, පරිසරය සුරක්ෂිත කරන යෝජනා අමාත්‍යාංශය දක්වා ගෙන ඒම අපේ ඉලක්කයක්. තිරසර වශයෙන් රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කරන්නේ කෙසේ ද? ඒවා අනාගත දැක්මක් සහිත ව සැලසුම් කරන්නේ කෙසේ ද? යන්න විශේෂඥයන් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. ඊට අදාළ වැඩපිළිවෙළ දැනටමත් සකස් කරමිනුයි පවතින්නේ. දෙපාර්තමේන්තුවට වාහන මිල දී ගැනීම්, අලි වැට නඩත්තුකරුවන් බඳවා ගැනීම් අප වේගවත් කරමින් යනවා. ඔවුන් පහසුකම් පිළිබඳ ඉදිරිපත් කරන ප්‍රශ්න සාධාරණයි. ඒවා විසඳූ පසු අදාළ කටයුතු කරන්න හැකි විය යුතුයි. තිරසර දියවර ව්‍යාපෘතියෙන් සිදු වන්නේ ශ්‍රී ලංකාවේ ජල උල්පත් ආරක්ෂා කිරීම. මේ සඳහා ජල සිතියමක් සකස් කර තිබෙනවා. මෙය ජලය සුරක්ෂිත කිරීමේ සැලසුමක්. හම්බන්තොට, වීරකැටිය, කුඩා බිබුල ජල උල්පත සංරක්ෂිත ප්‍රදේශයක් කිරීම මෙහි ආරම්භක පියවරක්.

**2025 වසරේ සිට මේ දක්වා කැළෑ 82ක් රක්ෂිත බවට පත්කරන්නට හැකි වුණා. නිල්ගල මෙතැනදී විශේෂයෙන් සඳහන් කළ යුතුයි. රිටිගල අධි ස්වාභාවික රක්ෂිතය වටේ තිබෙන හෙක්ටයාර් 2000කට ආසන්න අලින්ගේ ස්ථිර වාසස්ථාන වන, අලි ගැවසෙන කැළෑ සියල්ල 2026 වසරේ රක්ෂිත කරනවා.**

මීට අදාළ කාර්ය රැසක් අප වේගවත් කළා.

ජාතික පාරිසරික පනත සංශෝධනයට පියවර ගැනීම ඒ අතරින් විශේෂයි. වර්තමානයට ගැළපෙන විදිහට මේ පනත් සංශෝධනය කළ යුතුයි. පරිසරයට අදාළ සියලු රාජ්‍ය ආයතන එක් අමාත්‍යාංශයක් යටතට ගන්නට අපට හැකි වුණා. එය අභ්‍යන්තර කාර්යවලදී පහසුවක්.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ම නියෝජිතයෙක් පත් කිරීම ආරම්භ කර තිබෙනවා. ප්‍රාදේශීය මට්ටමේ

2025 වසරේ සිට මේ දක්වා කැළෑ 82ක් රක්ෂිත බවට පත්කරන්නට හැකි වුණා. නිල්ගල මෙතැනදී විශේෂයෙන් සඳහන් කළ යුතුයි. රිටිගල අධි ස්වාභාවික රක්ෂිතය වටේ තිබෙන හෙක්ටයාර් 2000කට ආසන්න අලින්ගේ ස්ථිර වාසස්ථාන වන, අලි ගැවසෙන කැළෑ සියල්ල 2026 වසරේ රක්ෂිත කරනවා. අලිමංකඩ පිළිබඳ විධිමත් ලැයිස්තුවක් දී තිබුණත් මෙතරම් කාලයක් ඒවා ආරක්ෂා කරන්න කිසිම පියවරක් ගෙන නැහැ.

වැටහිරියාකන්ද, රිටිගල, නිල්ගල අලිමංකඩවල තිබෙන සියලු අනවසර අප අයින් කරනවා. ඒ, ජනතාවට හානියක් නොවෙන්න සහ නීතිමය ක්‍රියාවලිය යටතේ. අලි-මිනිස් ගැටුම සමනය කරන්න ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබුණා. ඒක නැවත ප්‍රතිසංස්කරණය කර, නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න සැලසුම් කර තිබෙනවා. වනජීවී

මධ්‍යම කඳුකරයේ අවම පීඩනයකින් ජනාවාස පවත්වාගෙන යාම අවශ්‍යතාවක්. 2004 වසරේ සුනාමි ආවා. 2025 වසරේ දිට්වා ආවා. ඊළඟ ව්‍යසනයට මෙතරම් කාල පරතරයක් තියෙන්නේ නැහැ පවතින දේශගුණික විපර්යාස නිසා. මෙවැනි පසුබිමක ඊට අදාළ වැඩපිළිවෙළක් සකස් කර, සියලු ක්ෂේත්‍ර දේශගුණ විපර්යාසවලට අනුහුරු කරන්නේ කෙසේ ද? යන්න සැලසුම් හදමින් සහ ඒ පිළිබඳ අධ්‍යයනය කරමින් සිටිනවා. ජාතික පාරිසරික පනත සංශෝධනය පමණක් නොව වෙරළ සම්පත් පනත, ජාතික සත්ත්වෝද්‍යාන පනත, සමුද්‍ර දූෂණ වැළැක්වීමේ ආඥා පනත යන මේ සියල්ල නව තත්ත්වයට ගැළපෙන විදිහට සංශෝධනය කරන්න අවශ්‍ය මූලික පියවර ගෙන අවසන්.

# පොහොසත් ජෛව විවිධත්වයක් අප සතුයි



**මෙලනි ගුණතිලක**
පරිසර හා දේශපාලන ක්‍රියාකාරී

දූපතක් විදිහට ඉහළ වටිනාකමක් සහිත අපේ පරිසර පද්ධතිය නිවැරදි ව කළමනාකරණය කරගෙන තිබෙනවා ද? අනාගතයේදී එය කළමනාකරණය කරන්නට සිතනවා ද? යන්න ගැන අවධානය යොමු කිරීම වැදගත්. ශ්‍රී ලංකාව යනු දේශගුණික විපර්යාසවලට වැඩියෙන් ම මුහුණදෙන රටක්. දේශගුණික විපර්යාසවලට වැඩියෙන් ම හේතු වන හරිතාගාර වායු විමෝචනවලට අඩුවෙන් ම දායක වෙන රටක්.



හරිතාගාර වායු විමෝචනය වැඩි වීමෙන් වායුගෝලයේ උෂ්ණත්වය දිනෙන් දින වැඩි වෙනවා. මේ තරම් කාලයක් අප අනාවැකි කියූ, අප අපේක්ෂා නොකළ ආකාරයේ දරුණු නියං තත්ත්ව, ක්ෂණික ගංවතුර වැනි අනිසි විපාකවලට මුහුණදෙන්නට පුළුවන්. ලෝකයේ ජෛව විවිධත්වය අතින් උණුසුම් ම ස්ථාන (Biodiversity Hotspots) 35න් එක් ස්ථානයක් ශ්‍රී ලංකාව. ඒ තරම් පොහොසත් ජෛව විවිධත්වයක් අප සතුයි. අපට ආවේණික සතුන් සහ ශාක, නිරිත දිග හා ඊසාන දිග මෝසම් වර්ෂාව යන මේ වටිනාකම් සමඟ භූගෝලීය පිහිටීම අපට ලෝකයේ සුවිශේෂ වටිනාකමක් එකතු කර තිබෙනවා. ඒ නිසා ම ශ්‍රී ලංකාව ගැන ලෝක අවධානය තිබෙන්නේ ඉහළ තැනක.

මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා ප්ලාස්ටික් ඇතුළු පරිසර දූෂණය ශීඝ්‍රයෙන් වැඩිවෙලා. මිනිස් ශරීරයෙන් ප්ලාස්ටික් සොයා ගන්නවා. මේ සියල්ල සමඟයි අප පරිසරය සංරක්ෂණය කරන්නේ කෙසේ ද? යන්න කතාබහ සිදු කළ යුත්තේ. බොහෝදුරට යටත්විජිතකරණයත් සමඟ හඳුන්වා දුන් සංරක්ෂණ ක්‍රමවේද, පරිසරය සංරක්ෂණ උපායමාර්ග ගැනයි අප දැනුවත් ව සිටින්නේ. එහෙත් අප එහිදී සිතිය යුතුයි සංවේදී පරිසර පද්ධති, ජෛව විවිධත්වය ආරක්ෂා කරන නව ක්‍රමවේද සහ පර්යේෂණ දත්ත පිළිබඳ ව.

**මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා ප්ලාස්ටික් ඇතුළු පරිසර දූෂණය ශීඝ්‍රයෙන් වැඩිවෙලා. මිනිස් ශරීරයෙන් ප්ලාස්ටික් සොයා ගන්නවා. මේ සියල්ල සමඟයි අප පරිසරය සංරක්ෂණය කරන්නේ කෙසේ ද? යන්න කතාබහ සිදු කළ යුත්තේ. බොහෝදුරට යටත්විජිතකරණයත් සමඟ හඳුන්වා දුන් සංරක්ෂණ ක්‍රමවේද, පරිසරය සංරක්ෂණ උපායමාර්ග ගැනයි අප දැනුවත් ව සිටින්නේ. එහෙත් අප එහිදී සිතිය යුතුයි සංවේදී පරිසර පද්ධති, ජෛව විවිධත්වය ආරක්ෂා කරන නව ක්‍රමවේද සහ පර්යේෂණ දත්ත පිළිබඳ ව.**

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවක් සිටිනවා. දීර්ඝකාලීන ආහාර පුරුදු, ඒ සමඟ බැඳුණු සංස්කෘතික පුරුදු අපට තිබෙනවා. පරිසරයට හානියක් නොකළ ආහාර සංස්කෘතියක් අපට තිබුණා. ලෝක අවධානය අප වෙත යොමු කරන්නේ ආහාර නිෂ්පාදනය, සංරක්ෂණය සඳහා නවීන තාක්ෂණය භාවිත කළ යුතු බවට. එහෙත් වසර 50-100කට එහා මහ පොළොවත් සමඟ බද්ධ ව තිබූ ආහාර රටා, පරිසර සංරක්ෂණ රටා ගැන සොයා බැලීම වැදගත් බව මා සිතනවා. අප ඒවා ප්‍රායෝගික තලයට ගෙන ආ යුතුයි. එතැනදී යම්-යම් සීමා තිබිය හැකි නිසා ඒවා ඒ විදිහට යොදා ගන්නට නොහැකි වේවි. එහෙත් දැනුම, පර්යේෂණ, තාක්ෂණය අපට තිබෙන නිසා සුදුසු ආකාරයට මේ සියල්ල යොදා ගන්නට හැකියාව තිබෙනවා.

මිනිසාගෙන්, සතුන්ගෙන් වියුක්ත ව ලාභය ගැන පමණක් සිතා ගෙනෙන සංරක්ෂණ ක්‍රමවේද කඩිනමින් වෙනස් කළ යුතුයි. සංරක්ෂණයට ඉඩම් වෙන් කර, ව්‍යාපෘතිවලට දෙන බව දන්නා කරුණක්. එහෙත් සැබවින් ම අප පරිසර සංරක්ෂණය සිදු කරන්නේ කවුරුන් වෙනුවෙන් ද යන්න අප මෙහිදී සිතිය යුතුයි



# සුවපත් දිවියට මානසික සුවතාව

**පුෂ්පා රණසිංහ**
ජ්‍යෙෂ්ඨ විශේෂඥ මනෝවෛද්‍ය
ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය

මානසික සුවතාව පුද්ගලයාගේ පැවැත්ම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරනවා. සියදිවි හානි කර ගැනීමකට පුද්ගලයෙකු පෙළඹෙන්නේ මේ මානසික සුවතාව බිඳ වැටීමේ ප්‍රතිඵලයක් විදිහට. සාමාන්‍යයෙන් සියදිවි නසා ගැනීමක්, සමාජයෙන් වසන් වී කල්වේලා ගෙන වඩාත් සැලසුමක් ඇති ව සිදු කරගන්නක් විදිහට බොහෝ විට සලකන්න පුළුවන්. එය සාමාන්‍ය තත්ත්වයකින් බැහැර වූ මානසික මට්ටමක් නිසා සිදුවන්නක්. ඒ සඳහා බලපාන්න පුළුවන් හේතු ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන් ආතතිය, විෂාදය වැනි මානසික ව්‍යාධියක් පවතින ඇතැම් පුද්ගලයන් සිය දිවි නසා ගැනීමට යොමු වන්න පුළුවන්. තමන්ට ඇති වන ප්‍රශ්නයක් ආවේගශීලී ව විසඳා ගැනීමට යාමේ ප්‍රතිඵලයක් විදිහටත් සියදිවි නසා ගැනීම තෝරා ගන්නවා. මෙහිදී ප්‍රශ්නවලට මුහුණදෙන සෑම අයෙකු ම සියදිවි නසා ගන්නේ නැහැ. කොතරම් සංකීර්ණ ගැටලුවක් පැමිණියත් පුද්ගලයන් ඒවා විසඳා ගැනීමට අවශ්‍ය ශක්තිය තමන් තුළින් ම ඇති කර ගන්නා අවස්ථා තිබෙනවා. ඔවුන් මෙවැනි ම සංකීර්ණ ප්‍රශ්නවලට මීට කලින් මුහුණ දී තිබෙන්නට පුළුවන්. එවැනි පුද්ගලයන්ට පෙර අත්දැකීම් සමඟ පවතින අවබෝධය නිසා ඒවායින් මිදීමේ හැකියාව වැඩියි. එහෙත් ඇතැමෙකු එවැනි සංකීර්ණ ප්‍රශ්නයක් හෝ ව්‍යාකූලත්වයක් හෝ පළමු වතාවට අත්විඳින විටෙකදී එය විසඳා ගැනීමට ක්‍රමයක් නොමැති වීමෙන් එක ම විකල්පය විදිහට සියදිවි හානි කර ගැනීමට පෙළඹෙන්න පුළුවන්. තමන් පිළිබඳ ව දැනෙන අසරණකමක්, වරදකාරී හැඟීමක්, පසුතැවිල්ලක්, අපේක්ෂා භංගත්වයක්, අධික කනගාටුවක් ඇති වූ විට සහ පීඩනය මනසින් සිතා යටපත් කර ගැනීමට හෝ නිවැරදි තීරණයකට එළඹීමට අවශ්‍ය මානසික අවකාශය ඇහිරී තිබෙන අවස්ථාවකදී හෝ පුද්ගලයෙකුට සියදිවි හානි කර ගැනීමට සිතෙන්න පුළුවන්. එලෙසින් ගන්නා ක්‍රියාමාර්ගය නිසා තමන්ගේ ජීවිතයට අහිමි වෙයි යන සිතුවිල්ල ඇතමෙකුට ඇති නොවෙන්න පුළුවන්. විශේෂයෙන් මත්ද්‍රව්‍ය භාවිත කර ඇති අවස්ථාවක මෙවැනි තත්ත්වයකට යොමු වුවහොත් එම පුද්ගලයාට මිය යාමට ඇති හැකියාව වැඩියි. ඊට ප්‍රධානතම හේතුව වන්නේ දිවි හානි කරගන්න කටයුතු කරන අතරතුර එම අදහස වෙනස් වුවත් ඊට ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය මානසික හා කායික ශක්තිය, ශරීරගත ව තිබෙන මත්ද්‍රව්‍ය නිසා අඩපණ වී තිබීම. වෙනත් අයෙකුට බලපෑම් කිරීමේ හෝ බිය වැද්දීමේ හෝ ක්‍රමයක් විදිහට සියදිවි හානි කරගන්නා බව පෙන්වීමට ගොස් එය වැරදී තවත් අය තමන්ගේ ජීවිත අහිමි කර ගන්නවා. සුව කළ නොහැකි දරුණු පිළිකා, ස්නායු ආබාධ වැනි රෝගවලින් වේදනා විඳින පුද්ගලයන් ද මෙවැන්නකට යොමු වන අවස්ථා ද තිබෙනවා.

අද සමාජයේ තරුණ හා නව යොවුන් වියේ පසුවන දරුවන් ආවේගය පාලනය කර ගැනීමේ නොහැකියාව නිසා සියදිවි හානි කර ගැනීම්වලට පෙළඹෙන අවස්ථා වැඩියි. සාමාන්‍යයෙන් පරිණත තීරණවලට එළඹීමට අවශ්‍ය පූර්ව මස්තිෂ්කයේ වර්ධනය සම්පූර්ණ වීමට නම් වයස අවුරුදු 25 - 35ක කාලයක් ගත විය යුතුයි. එහෙත් නව යොවුන් හා තරුණ වියේදී මේ තත්ත්වය බොහෝදුරකට අඩු වීමත් හෝමෝනවල ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පැවතීමත් නිසා තමන් තුළ ඇතිවන ආවේග එලෙසින් ම ක්‍රියාත්මක කිරීමට යාම තරුණ වයස්වල සියදිවි නසා ගැනීම් වැඩිවීමට හේතු වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ සියදිවි හානි කරගැනීම්වලින් 80%ක් පමණ සිදු වන්නේ පිරිමින්ගෙන්. ඔවුන් සියදිවි හානි කර ගැනීමේදී ඒ සඳහා තවකෙකුට තමන් ව බේරා ගැනීමට නොහැකි වන වඩා දරුණු ක්‍රම අනුගමනය කිරීමත් බොහෝ විට මත්ද්‍රව්‍ය භාවිත කර සිටීමත් ඊට බලපා තිබෙනවා. කාන්තාවන් වැඩි වශයෙන් සියදිවි නසා ගැනීම්වලට පෙළඹෙන්නේ නව යොවුන් වියේ අනවශ්‍ය ගැබ් ගැනීම්, සබඳතා බිඳ වැටීම්, ලිංගික අතවර යනාදී කාරණා මුල්කරගෙන. මේ වයස් සීමාවෙන් පසු ව කාන්තාවන් දිවි තොර ගැනීම් වාර්තා වන්නේ ඉතා අඩුවෙන්. එහෙත් තරුණ වයසේදී කාන්තාවන් හා සමාන මරණ ප්‍රතිශතයක් පෙන්වන පිරිමි සියදිවි හානි කර ගැනීම් කාලයක් සමඟ අඩු වී වයස අවුරුදු 40 සීමාවට පැමිණෙන විට මේ තත්ත්වය නැවතත් වැඩි වන ස්වභාවයක් දැකගන්න පුළුවන්. මෙහිදී වඩාත් අවදානම්සහගත වන්නේ රැකියාවෙන් විශ්‍රාමික ව ගත වන වයස අවුරුදු 60 වයස් මට්ටම. ඒ අනුව වයස්ගත පිරිමින් වැඩි වශයෙන් සිය දිවි හානි කර ගන්නා බව වාර්තා වෙනවා.

90 දශකයේ මැදභාගයේදී පමණ ශ්‍රී ලංකාවේ සියදිවි හානි කර ගැනීම් සම්බන්ධ මරණ 60,000ක්, එනම් ලක්ෂයකට මරණ 45ක ඉහළ මට්ටමකින් පැවතුණා. පසුව මේ සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද කමිටුවෙන් එකල ආනයනය කරන ලද අධික විෂ සාන්ද්‍රණයක් යුත්

වල්නාශක පානය කිරීම් මරණවලට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ බව අනාවරණය වුණා. එහෙත් වර්තමානය වන විට සමස්තයක් වශයෙන් මෙරට සිදුවන සියදිවි නසා ගැනීම් 3,000ක්, එනම් ලක්ෂයකට මරණ 14.5ක් දක්වා අඩු වී තිබෙනවා. විශේෂයෙන් පසුකාලීන ව පර්යන්ත රෝහල්වල පහසුකම් දියුණු වීම, හදිසි අවස්ථාවකදී සුළු වේලාවක් ඇතුළත රෝගියා ව ප්‍රදේශයේ සමීප රෝහලක් වෙත ගෙන යාමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සකස් වී තිබීම වැනි කාරණා ඒ සඳහා බලපා තිබෙනවා.

වර්තමානයේ සියදිවි හානි කර ගැනීම අපරාධමය වරදක් විදිහට සලකන්නේ නැහැ. ඒ වෙනුවට දිවි තොර කර ගැනීමකට උත්සාහ කර බේරා ගැනීමට හැකි වුවහොත් එම පුද්ගලයා ව අනිවාර්යයෙන් ම මනෝචිකිත්සක වෛද්‍යවරයෙකු වෙත යොමු කර අවශ්‍ය මානසික උපදේශන සපයා දෙනවා.

රැකියාව නිසා ඇතිවන මානසික පීඩන තත්ත්ව නිසා සියදිවි නසා ගැනීම්වලට යොමු වීම් වර්තමානයේදී අසන්නට, දකින්නට ලැබෙන ප්‍රවණතාව වැඩියි. සැබවින් ම උගත්කම, දැනුම, අත්දැකීම් මේ සියල්ල තිබුණත් වෘත්තීමය වශයෙන් පුද්ගලයාට ඇති වන පීඩනය නිසි පරිදි කළමනාකරණය කරගැනීමට අවශ්‍ය මානසික ශක්තිමත්භාවය නොමැතිකම මීට ප්‍රධාන වශයෙන් බලපානවා. විශේෂයෙන් තමන් සතු දක්ෂතාවට, හැකියාවට, දැනුමට පරිබාහිර ක්ෂේත්‍රයක රැකියාවක් හෝ වගකීමක් හෝ උසුලන්නට සිදුවීමත් වෘත්තිකයාගේ උපරිම ශ්‍රම විභවතාව ඉක්මවා සේවය කිරීමට සිදුවීමත් වෘත්තීය හා පෞද්ගලික ජීවිතයේ සමබරතාව පවත්වාගෙන යාමට අපහසු වීමත් පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව වැඩි වීම හෝ සාමාජිකයෙකු රෝගාතුර වීම වැනි එදිනෙදා අවශ්‍යතාවල වැඩි වීමත් නිසා වෘත්තිකයාගේ මානසික සුවතාව අඩාළ වීමට පුළුවන්. තමන්ට ඇතිවන මානසික පීඩාව තවකෙකු සමඟ බෙදා ගැනීමට තරම් ශක්තිමත් සම්බන්ධතා වෘත්තීමය පරිසරයේ නිර්මාණය නොවීමත් ගැටලුවක්. මේ නිසා රැකියා පරිසරයේ තමන්ට විශ්වාසවන්ත, එකිනෙකා වෙනුවෙන් උදව් කරගන්නා, සුහද හා මිත්‍රශීලී පරිසරයක අවශ්‍යතාව වෘත්තිකයාට සපුරාලීම වැදගත්. වෘත්තිකයන්ට මුහුණපෑමට සිදුවන ගැටලු, ප්‍රශ්න, සිත් පීඩාදියට සවන් දීමට හා මානසික සුවතාව වෙනුවෙන් උපදෙස් ලබා ගැනීමට හැකි 'දුක්ගන්නාරාළ' භූමිකාවක් වෘත්තිකයා වෙනුවෙන් ආයතනයේ ම ස්ථාපිත කිරීමේ හැකියාවත් පවතිනවා. එයින් ආයතනයේ සේවකයන්ගේ යම්කිසි හැසිරීම්වල වෙනස්කම්, අනවශ්‍ය අයුරින් මානසික හෝ කායික හිරිහැරවලට ලක්වීම්, රැකියාවේ තෘප්තිය නැති වී යාම් ආදිය නිරීක්ෂණය වුවහොත් ඊට මැදිහත් වී වෘත්තිකයා වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුයි.

රැකියා පරිසරයේ තමන්ට විශ්වාසවන්ත, එකිනෙකා වෙනුවෙන් උදව් කරගන්නා, සුහද හා මිත්‍රශීලී පරිසරයක අවශ්‍යතාව වෘත්තිකයාට සපුරාලීම වැදගත්. වෘත්තිකයන්ට මුහුණපෑමට සිදුවන ගැටලු, ප්‍රශ්න, සිත් පීඩාදියට සවන් දීමට හා මානසික සුවතාව වෙනුවෙන් උපදෙස් ලබා ගැනීමට හැකි 'දුක්ගන්නාරාළ' භූමිකාවක් වෘත්තිකයා වෙනුවෙන් ආයතනයේ ම ස්ථාපිත කිරීමේ හැකියාවත් පවතිනවා. එයින් ආයතනයේ සේවකයන්ගේ යම්කිසි හැසිරීම්වල වෙනස්කම්, අනවශ්‍ය අයුරින් මානසික හෝ කායික හිරිහැරවලට ලක්වීම්, රැකියාවේ තෘප්තිය නැති වී යාම් ආදිය නිරීක්ෂණය වුවහොත් ඊට මැදිහත් වී වෘත්තිකයා වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුයි.

මීට අන්‍යාකාරයෙන් මාධ්‍යයත් බලපානවා. බොහෝ විට පුද්ගලයා ප්‍රශ්නයක් විසඳා ගැනීමට යාමේදී පවා තවකෙකු අනුකරණය කිරීමට වැඩි නැඹුරුතාවක් පෙන්වනවා. එහිදී මාධ්‍ය ඔස්සේ සියදිවි නසා ගැනීම් උත්කර්ෂයට නංවා, නාට්‍යානුසාරයෙන් හා අනුකම්පාව දිනා ගන්නා ආකාරයට වාර්තා කිරීමෙන් ඒවා තවකෙකු තමන්ට ඇති ප්‍රශ්නයකින් පලා යාමේ විකල්පයක් විදිහට උපයෝගි කර ගැනීමට, අනුකරණයට පෙළඹෙන්න පුළුවන්. සියදිවි හානි කර ගැනීම සම්බන්ධයෙන් පවතින සමාජ ආකල්පය මේ නිසා සාමාන්‍යකරණයට ලක් වෙනවා. එවැන්නකට යොමුවන පුද්ගලයාට ඒ වෙනුවෙන් කොතරම් වේදනාවක් දරා ගන්නට සිදු වෙනවා ද යන්න වෙනුවට එය ප්‍රශ්නයකින් පලා යාමට ඇති සිහින විකල්පය බවට පත් වීම වඩාත් බරපතළ තත්ත්වයක්. සමාජ මාධ්‍ය පුද්ගල මනසට හුරු කරන නොඉවසිලිවන්තකම, එක් අරමුණක වැඩි කාලයක් රැඳී සිටීමට ඇති අපහසුව, මාධ්‍ය පදීතයෙන් ඔබ්බට යමක් පිළිබඳ ව සිතීමට ඇති හැකියාව හා පරිකල්පනය ලඝු වීම, ක්ෂණික ව සියල්ල ලබා ගැනීමට හෝ අත්පත් කර ගැනීමට හෝ ඇතිවන දැඩි වුවමනා හා එය නොලැබීම නිසා ඇතිවන දරුණු මානසික පීඩනයත් වක්‍රාකාරයකින් හෝ වර්තමානයේදී සියදිවි නසා ගැනීම්වලට උදව් වන බව පෙනී යනවා.

බොහෝ දෙනෙක් තමන්ට ඇතිවන මානසික පීඩාව වළක්වා ගැනීමට අවශ්‍ය ආධාර උපකාර ලබා ගැනීමට, නිසි උපදේශනයක් ලබා ගැනීමට හැකි විශ්වසනීය හා ආරක්ෂිත ක්‍රමවේද පිළිබඳ නිසි දැනුවත් බවක් පෙන්වන්නේ නැහැ. ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ, පැය 24 ම ක්‍රියාත්මක ජාතික මානසික සෞඛ්‍ය උපකාරක සේවාව සමඟ 1926 ක්ෂණික දුරකතන අංකයට හෝ 075 555 1926 යන WhatsApp අංකයට ඇමතුමක් හෝ කෙටි පණිඩයක් යොමු කිරීමෙන් ඒ සඳහා අවශ්‍ය පහසුකම් ඕනෑ ම අයෙකුට ලබා ගත හැකියි. මේ සේවාව විමධ්‍යගත කර දිස්ත්‍රික්ක මට්ටමින් ද (දැනට රාත්‍රී කාලයේදී හැර) ක්‍රියාත්මක වෙනවා. ඒ අයුරින් සම්බන්ධ වන පුද්ගලයාට නිසි සෞඛ්‍ය උපදේශනයක් ලබා දීමට අවශ්‍ය අංශ වෙත අප යොමු කරනවා. මානසික පීඩනයෙන් මිදීමට අවශ්‍ය නිසි පියවර හා මඟ පෙන්වීමටත් මනස සැහැල්ලු කරන ව්‍යායාම්, මානසික ව ඇතිවන විවිධ හිරිහැර, සයිබර් හිංසන යානාදියට එරෙහි ව ගත හැකි නෛතික ආරක්ෂාව පිළිබඳ ව දැනුවත් කිරීමටත් මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම්වලින් මිදීමට මගපෙන්වීම් ආදී මානසික සෞඛ්‍ය සුවපත් කිරීමට අවශ්‍ය විවිධ අංශ ගණනාවක සේවා මෙහිදී ලබා ගැනීමේ හැකියාව පවතිනවා. අවශ්‍යතාව හා පහසුව පිළිබඳ සලකා තමන්ට ආසන්න මානසික සෞඛ්‍ය විද්‍යායතනයට අනුබද්ධ රෝහලකින් අවශ්‍ය සායන පහසුකම් ලබා ගැනීමට ද හැකියි.

සාකච්ඡාව හා සටහන
**බිනූ දිලාරා ගමගේ**

# නිහඬ අරගලයක කාව්‍යමය සිනමා ප්‍රකාශනය

**කැලුම් ජයවීර**

බොහෝ චිත්‍රපට කතාන්දර කීම මෙන් ම විනෝදය ලබා දෙන අතර ඇතැම් චිත්‍රපට ප්‍රේක්ෂකයා ඈතකට පා කර හරිනවා. ඉතා කලාතුරකින් චිත්‍රපටයක් කාව්‍යයක් සේ නිහඬව ම හිතට ඇවිත් ඉතිරි කර යන්නේ මහා බරක්. 'චන්ද්‍රරේගේ වයිෆ්' එවැනි සිනමා අත්දැකීමක් ලබා දෙන චිත්‍රපටයක්. මෙය හුදු පවුලේ කතාවක් ම නොවෙයි. ශ්‍රී ලංකාවේ කාන්තාවගේ නොපෙනෙන ශ්‍රමය, මවකගේ දරා ගැනීම, පුරුෂාධිපති සමාජය සහ අසාර්ථක වූ දේශපාලන සිහින ගැන ලියැවුණු දෘශ්‍ය කාව්‍යයක්. සංබාරා, කර්ම, 28, සංසාරේ දඩයක්කාරයා වැනි චිත්‍රපට නිර්මාණය කළ ප්‍රසන්න ජයකොඩිගේ නවතම සිනමා කෘතිය වන්නේ චන්ද්‍රරේගේ වයිෆ්.

චරිත, වචනවලින් පමණක් කතා නොකිරීම ප්‍රසන්න ජයකොඩිගේ සිනමාවේ විශේෂත්වයක්. එහිදී නිහඬතාව, බැල්ම, ආලෝකය සහ අවකාශය පවා දෙබස් බවට පරිවර්තනය වෙනවා. මේ චිත්‍රපටය නරඹන විට ඇති වන්නේ දෘශ්‍ය නවකතාවක් (Visual novel) හෝ කෙටි කවි එකින් එක අමුණා ඇති දිග කවියක් කියවනවා වැනි හැඟීමක්. ඇතැම් චරිතවල තිබෙන්නේ දැඩි නිහඬතාවක්. ඒ නිසා මේ චිත්‍රපටය නැරඹීමට ඉවසීම (patience) තිබිය යුතු යි. ඒ නිහඬතාවේයි මේ චිත්‍රපටයේ ගැඹුරු ම දේශපාලනය තිබෙන්නේ.

චන්ද්‍රරේ වෘත්තීය සමිති නායකයෙක්. කම්කරු පන්තියේ අයිතිවාසිකම් වෙනුවෙන් පාරට බැස සටන් කරන, ඒ වෙනුවෙන් ජීවිතය කැප කරන මිනිසෙක්. ඔහුගේ ලෝකය ගොඩනැගී තිබෙන්නේ සාමූහික අරගලයක් (collective struggle) ගැන. පීඩිත පන්තිය වෙනුවෙන් සටන් කිරීම ගැන. රතු සහ කළු පාටවල දේශපාලනය ගැන.

චන්ද්‍රරේ වැඩ කරන උක් කර්මාන්ත ශාලාවේ ප්‍රධානියාගේ ඝාතනයට ඔහු සම්බන්ධ බවට චෝදනා ලැබීමෙන් පසු චන්ද්‍රරේ හිරේ යනවා. එතැනින් පසු මේ චිත්‍රපටයේ ගලා යාම චන්ද්‍රරේගේ කතාවක් නොව ගංගාගේ කතාවක් බවටයි පත් වන්නේ.

චිත්‍රපටය නරඹන විට ඇති වන්නේ දෘශ්‍ය නවකතාවක් (Visual novel) හෝ කෙටි කවි එකින් එක අමුණා ඇති දිග කවියක් කියවනවා වැනි හැඟීමක්. ඇතැම් චරිතවල තිබෙන්නේ දැඩි නිහඬතාවක්. ඒ නිසා මේ චිත්‍රපටය නැරඹීමට ඉවසීම (patience) තිබිය යුතු යි. ඒ නිහඬතාවේයි මේ චිත්‍රපටයේ ගැඹුරු ම දේශපාලනය තිබෙන්නේ.

චන්ද්‍රරේ අත්අඩංගුවට පත්වීමත් සමඟ තනි වූ මවක් ලෙස ඇයට සිදුවෙනවා විවිධ වයස්වල පොඩි ගැහැනු දරුවන් තුන්දෙනෙකු සමඟ ජීවිතය ගැටගසා ගැනීමට. ඒ අතරේ චන්ද්‍රරේගේ දරුවෙක් යැයි කියමින් සුදු මහත්තයා නම් තවත් පොඩි කොල්ලෙක් මේ නිවසට ඇයගේ ආච්චි අම්මා රැගෙන එනවා. එවිට කුසගින්න, ණය සහ අසරණකම් අතර ජීවිතය ගෙවන නිවසකට ඇති වන ජීවන බර කෙතෙක්දැයි සිතාගන්නට පුළුවන්.

'ගංගා' යනු පුද්ගල චරිතයක් පමණක් නොව ශ්‍රී ලාංකික හෝ දකුණු ආසියාතික හෝ කාන්තාවගේ ආදර්ශ රූපයක්. ඇය ඇඟලුම් කර්මාන්ත ශාලාවල පැය ගණන් රෙදි මහන ගැහැනියක්. මැදපෙරදිග ගෘහ සේවයට යන මවක්. කඳුකරයේ වැස්සත් මීදුමත් මැද තේ දලු නෙළන කාන්තාවක්. මෙරට ආර්ථිකය උසුලාගෙන යන්නේ කාන්තාවන්ගේ ශ්‍රමය. රටට ඩොලර් ගෙනෙන්නේ ඔවුන්. එහෙත් ඒ ශ්‍රමය ගැන සමාජය කතා කරන්නේ අඩුවෙන්. Marx පැවසූ විදිහට සමාජයේ පවතින්නේ (survive) කම්කරු ශ්‍රමය මත. එහෙත් ඒ ශ්‍රමය බොහෝ විට දෘශ්‍යමාන නැහැ. මේ චිත්‍රපටය ඒ නොපෙනෙන ශ්‍රමය අපට දෘශ්‍යමාන කරවනවා.

'ගංගා' යනු පොළොව වැනි චරිතයක්. පොළොව කොපමණ පීඩනය දරාගෙන මිනිස්සුන්ට ජීවිතය දෙනවා ද? එමෙන් ම මව තමන්ගේ දුක මත්තේ නොනැසී, දරුවන් ජීවත් කරවනවා. ඒ නිහඬ දරාගැනීමේ ම මේ චිත්‍රපටයේ විප්ලවීය මානය තිබෙනවා.

චිත්‍රපටයේ ඉතා ප්‍රබල පැතිකඩක් වන්නේ, චන්ද්‍රරේ අත්අඩංගුවට පත් වූ පසු ගංගා දෙස පිරිමින් බලන ආකාරය. උදව් කරන මුවාවෙන්, ආරක්ෂාව දෙන මුවාවෙන් ඇයගේ අසරණකම භාවිත කරන්නට උත්සාහ කරන පිරිමි චරිත සමාජයේ දක්නට ලැබෙනවා. මෙය ශ්‍රී ලංකාවේ තනිවුණු කාන්තාවන් මුහුණ දෙන සැබෑ ම සමාජ යථාර්ථය. කාන්තාවන්ට අත්වන මේ පීඩනය නිවස තුළ පමණක් නොවෙයි එය ආර්ථිකය, බලය සහ සමාජ පද්ධතියේත් ක්‍රියාත්මක වෙනවා.

එහෙත් 'ගංගා' කඩා වැටෙන්නේ නැහැ. ඇය කෑගසන්නේ නැහැ. සටන් පාඨ කියන්නෙත් නැහැ. එහෙත් ජීවත් වෙනවා. දරුවන් ජීවත් කරවනවා. සැබවින් ම එය දේශපාලන රංගනයක්.

ශ්‍රී ලංකාවත් අද සිටින්නේ එවැනි සංක්‍රාන්තික මොහොතක. දශක ගණනාවක් බලය, පවුල් වාදය සහ පුරුෂ කේන්ද්‍රීය දේශපාලනය විසින් පාලනය



# චන්දරේගෙ Wife

කරන ලද සමාජයක සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත, විශේෂයෙන් කාන්තාවන්ගේ ජීවිත බොහෝවිට අදෘශ්‍යමාන වුණා. එහෙත් අද සමාජයේ විශාල පිරිසක් වෙනස් ආකාරයේ දේශපාලනයක් ගැන බලාපොරොත්තු තබන්නට පටන් අරගෙන.

චිත්‍රපටයේ ගැඹුරු ම සංකේතයක් වන්නේ චන්දරේගේ රතු සහ කළු ඇඳුම් ගංගා දරුවන්ගේ ඇගලුම් බවට මහන දර්ශනය. රතු සහ කළු යනු කම්කරු දේශපාලනයේ සහ විප්ලවයේ පාට. චන්දරේ ඒ පාට ඇඳගෙන පාරේ සටන් කළා. එහෙත් ඇය ඒ රෙදි දරුවන්ගේ ඇඳුම් බවටයි පරිවර්තනය කරනවා.

එතැන තිබෙන්නේ ඉතා ගැඹුරු අදහසක්. මතවාදයක් (Ideology) මිනිසුන්ගේ ජීවිතයට වැඩක් නොකරනවා නම් එය සම්පූර්ණ නැහැ. විප්ලවයක් සටන් පාඨවලින් පමණක් නොවෙයි රැකවරණය (care), පැවැත්ම (survivial) සහ සාමූහික වගකීම (collective responsibility) ඔස්සේ මැනිය යුතුයි යන අදහස මේ රූප දර්ශනයේ තිබෙනවා.

චිත්‍රපටයේ නාමකරණයත් ඉතා වැදගත්. ප්‍රධාන චරිතයේ නම 'ගංගා'. ඇයට අනන්‍යතාවක් තිබෙනවා. එහෙත් චිත්‍රපටයේ නම 'චන්දරේගේ වයිෆ්'. එතැනින් ම පුරුෂ කේන්ද්‍රීය සමාජයේ භාෂාව ක්‍රියා කරන ආකාරය අපට අධ්‍යක්ෂවරයා පෙන්වනවා. ගැහැනියකගේ අනන්‍යතාව මැකී, ඇය 'කෙනෙකුගේ බිරිඳ' බවට පමණක් නම ඔස්සේ පත්වෙනවා.

සමාජයේ 'අම්මා' යන නාමය පවා ඇතැම් විට ගෞරවයක් ලෙස පෙනුණත් එය කාන්තාවක් නිශ්චිත භූමිකාවක සිර කරන සංස්කෘතික උගුලක් විදිහටත් ක්‍රියාත්මක වෙනවා. ඇයගේ සිහින, ආශාවන් සහ අනන්‍යතාව අතුරුදහන් වෙනවා. ඉතිරි වන්නේ භූමිකාව පමණයි.

එහෙත් ප්‍රසන්න ජයකොඩි මේ නම භාවිත කරන්නේ ඒ වෙනස්කම හෙළිදරව් කරන්නට. ඒ, චිත්‍රපටයේ ඉදිරියට යන අපට පැහැදිලි වන්නේ සැබවින් ම බර උසුලාගෙන යන්නේ චන්දරේ නොව ගංගා නිසා.

'චන්දරේ' යන නමත් ශ්‍රී ලාංකික සිනමාවේ ඉතිහාසයත් සමඟ බැඳී තිබෙන්නක්. ධර්මසේන පතිරාජගේ 'පාර දිගේ' චිත්‍රපටයෙන් අපට හමුවන චන්දරේ, පද්ධතියට එරෙහි ව යන විප්ලවීය තරුණයෙක්. එහෙත් අඛණ්ඩතාව (continuity) අනුව බැලුවහොත් 'චන්දරේගේ වයිෆ්' යනු 'චන්දරේගේ වයිෆ්ගේ' කතාව.

සමාජයේ 'අම්මා' යන
නාමය පවා ඇතැම්
විට ගෞරවයක් ලෙස
පෙනුණත් එය කාන්තාවක්
නිශ්චිත භූමිකාවක සිර
කරන සංස්කෘතික උගුලක්
විදිහටත් ක්‍රියාත්මක
වෙනවා. ඇයගේ සිහින,
ආශාවන් සහ අනන්‍යතාව
අතුරුදහන් වෙනවා.
ඉතිරි වන්නේ භූමිකාව
පමණයි.

මේ චිත්‍රපටයෙන් සිදු කරන විශාල ම පෙරළිය වන්නේ විප්ලවවාදියා කවුද යන අදහස ම වෙනස් කිරීම. පාරේ කෑ ගසන මිනිසා ද විප්ලවවාදියා? නැත්නම් බඩගින්න, අපහාසය, අසරණකම සහ සමාජ පීඩනය දරාගෙන දරුවන්ට ආදරය පුදන සහ ඒ වෙනුවෙන් කිසිවක් ම නොඉල්ලා සිටින සැබෑවට ම ඔවුන් ජීවත් කරවන ගැහැනිය ද විප්ලවවාදියා?

අවසානයේ මේ චිත්‍රපටය පවසන්නේ ඉතා සරල නමුත් ගැඹුරු කාරණයක්. සැබෑ විප්ලවය බොහෝ විට සිදුවන්නේ පාරේ විතරක් ම නොවෙයි නිවස තුළත්. මවකගේ නිහඬ දරා ගැනීම තුළ එය සිදුවෙනවා. ගංගා කියන්නේ 'චන්දරේගේ වයිෆ්' පමණක් නොවෙයි. ඇය තවත් විප්ලවවාදිනියක්. එහෙත් ඉතිහාසය බොහෝ විට නාම නොදෙන, නිහඬ ව ඉවසීම ප්‍රගුණ කරගත්, ජීවිතය උසුලාගෙන යන විප්ලවවාදිනියක්. ඇයත් මැක්සිම් ගෝර්කිගේ අතින් නිමැවුණු පාවෙල් කොරචාගින්ගේ මව වැනියි.

චිත්‍රපටයේ නම මෙන් ම එහි ප්‍රධාන ම සංකේතය වන්නේ 'ගංගා' චරිතය. ඒ චරිතයට පණ පොවන්නේ නදීශා හේමමාලි. ඇයට ආකර්ෂණය, මතභේදාත්මක රූගත කිරීම් සහ ජනප්‍රිය සංස්කෘතිය තුළ වෙන ම ප්‍රතිරූපයක් තිබෙනවා. එවැනි රංගන ශිල්පිනියක් අතිශය සාමාන්‍ය ගැමි ගැහැනියකගේ චරිතයකින් කිසිම අලංකාරයක් නැති යථාර්ථවාදී පෙනුමකින් තිරයට පැමිණීම ප්‍රේක්ෂකයාට වෙනස් ම අත්දැකීමක්. මේ නිසා ඇයගේ රංගනය චිත්‍රපටයේ ශක්තියක්. ඇස්වලින් කරන කතාව, බය, අසරණකම, දරාගැනීම, ආදරය යන සියල්ල ඇය අතිශය නිහඬ ව, එහෙත් ගැඹුරින් ප්‍රකාශ කරනවා. ඇතැම් විට ඇය කතා නොකරන නිහඬ මොහොතක් ම දිගු දෙබසකට වඩා බලවත්.

දිලූපා කොදාගොඩ, සෞම්‍ය ලියනගේ, සරත් කොතලාවල, දුලීකා මාරපන, ජෙහාන් අප්පුහාමි ඇතුළු සෙසු රංගන ශිල්පීන් ද චරිතවලට ඉටු කරන්නේ සාධාරණයක්. විශේෂයෙන් ළමා චරිත රඟපාන කණ්ඩායම අතිශය ස්වාභාවිකයි. ඔවුන්ගේ හැසිරීම්, කතාබහ, නිහඬතාව ඇතුළු සියල්ල තුළ දැනෙන්නේ ජීවිතය ඇත්ත ඇති සැටියෙන් ම.

ලාල් ආනන්ද අබේධීර



# මිහිමත සදාතනික රසාභිව්‍යක්තිය

# ආශා බෝන්ස්ලේ

සහසක් රසාභිලාෂ ස්වකීය ස්වනිතයෙන් ද ස්වරිතයෙන් ද අප හද දැල් වූ ආශා බෝන්ස්ලේ නොබෝදා (අප්‍රේල් 12) ජීවන මඬලින් නික්ම ගියා. එහෙත් ඈ මිහිමත සදාතනික රසාභිව්‍යක්තියක්. ඒ, චිරාගත භාරතීය සුභාවිත ලබ්ධිය හා සාම්ප්‍රදායික රීතික මායිම් උඩු යටිකුරු කරන්නට ඇගේ කටහඬට හැකි වූ හෙයින්. ආශා බෝන්ස්ලේ මනුෂ්‍ය හැඟුම් විද්‍යාව දත් පොළෝ ගායිකාවක්. ඇයට ඒ ත්‍යාගය හිමිවන්නේ ඇයගේ පියා වන සංගීතඥ දිනනාත් මංගේෂ්කාර්ගෙන් හෝ ඇයගේ දෙටු සොයුරිය වන භාරතීය මහා ගායිකා ලතා මංගේෂ්කාර්ගෙන් හෝ නොවෙයි. ඔවුන් ඇරඹුමේදී ප්‍රබල අභිප්‍රේරණයක් වූවාට සැක නැහැ. එහෙත් ආශා බෝන්ස්ලේ නම් ගායිකාව තුළ දිදුලන විස්මිත තානමය ස්වාත්මීකාරය (Great tonal crystallization and Identifycation) ඇයට හිමිවන්නේ ඇයගේ ම ජීවිතය තුළින්.

ඇයගේ ජීවිතය කඳුළේ පාව යන මොහොතක, නොනිමි වේදනාවේ දෝංකාරය සිය ආත්මය දවන මොහොතක ඇයට ඇයගේ කටහඬේ ජනක වියමන (geno- text) හමු වුණා. ගීතයක ඇතුළාන්තයෙන් මතුවන භාවික ඥානික ගුණ මෙන් ම සාරමය රීත්‍යනුලීලය කලාවේ ආත්මීය සාධක (Subjective factors) සමඟ ගළපා ගැනීමත් එය අවියෝජනීය ලෙස ඒකාර්ථයක් කොට ගැනීමත් මෙහි හාස්කම වුණා. මෙය ශාස්ත්‍රාලීය ප්‍රවේශයකින්, ශිල්පීය අභ්‍යාසයකින් ලැබෙන්නක් නොව යමෙකුගේ ජීවිතය තුළ අන්තර්ඥානය පුබුදුවා ගැනීමෙන් ලැබෙන නිර්මාණාත්මක ප්‍රතිඵලයකැයි භාරතීය සංගීතඥ නෛෂාඪ් පවසනවා. සංජානනය (Perception) ආත්මීය සාධකයන්හි

කේන්ද්‍රීය සංකල්පය වන නිසා ඇයගේ සංගීතමය මනස (Musical mind) සංගීතාත්මකභාවය (Musicallity), සංගීතවේදීමය බව (Musicanship) යන සංගීතයට අදාළ සියලු කරුණු සමෝසමේ ඇයගේ ජීවන චරිතායනය සමඟ ම වැඩුණා. කොටින් ම කියතොත් ඇයගේ සංගීතාත්මක චරිතායනය වීමත් (Musical Characteristization) ජීවිතයත් දෙකක් නොව එකක් ම වුණා. ඒ නිසා ම ඇය භාරතීය සිනමා ගීතයේ සමාජානුයෝජනීය ගුණ ප්‍රසාරණය කළ සංස්කෘතියක මානව විද්‍යාත්මක පර්වලෝක මත විග්‍රහ කළ හැකි ගායිකාවකැයි විචාරකයන් පවසනවා. අනුක්‍රමයෙන් සිනමා ගායිකාවක් ලෙස ඇ සුහුඹුල් ව වැඩෙද්දී එක් කරුණක් පැහැදිලි ව ම වටහා ගත්තා. එනම් ලොවෙහි ඇත්තේ තුලනාත්මක ව ආකල්පයක් මත පිහිටා වටහා ගත යුතු සංගීත මාදිලි සමූහයක් බව. (How to define diverse music cultures with the comparative thinking) ඒ නිසා ම භාරතීය රාගධාරී සංගීතයේ මුඛ්‍ය ශාස්ත්‍රීය ධාරණාව සමඟ හෝ එහි උප ශාස්ත්‍රයේ එන ගසල්, ධුම්රි, ඛ්‍යායාල්, ක්ව්වාලි ආදී ආකෘති සමඟ මෙන් ම Afro American සංගීතය සමඟත් Afro cuban සමඟත් ඈ අචල ප්‍රේමාදරයකින් ඓන්ද්‍රිය ව බද්ධ වූවා. ඒ නිසා ම ඇය විරාගත භාරතීය සෞන්දර්ය සංකල්ප සමඟත් අපරදිග රෝමාන්තිකවාදයේත් නූතනවාදයේත් පශ්චාත් නූතනවාදයේත් අපූර්ව නියෝජනයක් ලෙස සිය ස්වර කණිකාවන් (grain of voice) තීව්‍ර කළ, සමස්ත විශ්වය සමඟ ම හුස්ගැනීමේ ගී කලාවක් (global art of respiration) බිහි කළ මානවවංශ සංගීත කථාවේ සුහුරුතම ගායනවේදිනියැකැයි (Smarterst vocal performar) වෙසෙසා දැක්වීම ඇයට පිදෙන ඉමහත් ම රසෝපහාරයක්.

චිත්‍රපට ගීත දොළොස් දහසක් පමණ ගයා ඇති ඇයට ඇයගේ ජීවිතයේ හමු වූ බොහෝ සංගීතවේදීන් තමාගේ ආත්මයට රසාවේශ වී ගැයිය හැකි ගී රැසක් නිර්මාණය කොට දුන් බව පවසන්නේ බැතිබර හදින්. නෞෂාඩ්, ශන්කර් ජායිකිෂන්, කයාම්, ලක්ෂ්මීකාන්ත් ප්‍යාරේ ලාල් ඇයට තනාදුන් ගී රැසක් හින්දි සිනමාවේ සදාතනික මතක සටහන් බවට පත් ව තිබෙනවා. මේ අතුරින් සංගීතඥ රවිගේ ගී තුළ මතු වන සුන්දාර්ථවාහී මනෝභාවික සමතාව ආශා බෝන්ස්ලේ ඉතා ප්‍රිය කරන්නක්. එහෙත් තමාගේ ජීවිතයේ සැඟවගත් අපමණ සෙනෙහෙ ප්‍රාර්ථනා මියැසි බසින් සුසර කළ සංගීතඥයා නම් ඕ. පී. නයියාර් බවයි ඇය පවසනවා. හින්දි සිනමාවේ හමුවන ගතික වර්ගයේ සංගීතඥයෙක් වන ඕ.පී නයියාර්ගේ ගී තනු ඇයට සුපුල් භාව භාෂණයක්. එහෙත් භාරතයෙන් ඔබ්බට ඇගේ කටහඬ කැඳවාගෙන යන නව තානිකත්වයක් (New performing tonality) ඇයට ලබා දුන්නේ ආර් ඩී. බර්මන්. ඔහු, ඇයට ඉතා ම නූතන ධ්වනි ප්‍රේක්ෂාවලියක් (modern tonal spectrum) තනා දුන්නා. එය භාරතීය සිනමාරූපී ගී වංශයේ හැරවුම් ලක්ෂයක් වුණා.

චිත්‍රපට ගීත දොළොස් දහසක් පමණ ගයා ඇති ඇයට ඇයගේ ජීවිතයේ හමු වූ බොහෝ සංගීතවේදීන් තමාගේ ආත්මයට රසාවේශ වී ගැයිය හැකි ගී රැසක් නිර්මාණය කොට දුන් බව පවසන්නේ බැතිබර හදින්. නෞෂාඩ්, ශන්කර් ජායිකිෂන්, කයාම්, ලක්ෂ්මීකාන්ත් ප්‍යාරේ ලාල් ඇයට තනාදුන් ගී රැසක් හින්දි සිනමාවේ සදාතනික මතක සටහන් බවට පත් ව තිබෙනවා.

1950 දශකයේ ඇයගේ ගායන ජීවිතය ඇරඹුමේදී ම ඇයගේ ගායන අනන්‍යතාව තුළ වූ ඉතා ස්නිග්ධ ශෘති සූක්ෂ්මතා (microtonality and inspiration), අනුප්‍රාණ හා රසාවේශ ඉසියුම් ව හඳුනාගත් සංගීතවේදීන් ගණනාවක් වුණා. ඒ අතර සජාඩ් හුසේන්, සර්දාර් මලික්, ගුලාම් මොහොමඩ්, එස් මොහින්දිර්, ඒ. ආර් කුරේෂි සහ මදන් මෝහන් ප්‍රමුඛ වෙනවා. ඔවුන් ඇයගේ හඬෙහි වූ උත්තර භාරතීය රාගධාරී සංගීතයෙන් ශික්ෂිත භාවජනනීය රසානුරාගය මැනවින් අවබෝධ කොට ගත්තා. එය ඇයගේ දෙටු සොයුරිය වන මහා ගායනවේදිනිය ලතා මංගේෂ්කාර්ගේ ගායන විලාසයෙන් වෙන් ව නැගෙන චාරුත්වයේ කෝමල රේඛාවක් ලෙස ම ඔවුන් පසක් කොට ගත්තා. ශාරංගදේවයන්ගේ 'සංගීත් රත්නාකාරය' කෘතියේ විශිෂ්ට ගායකයා හෝ ගායිකාව හෝ යනු රසික, රංජක, භාවක, අනුකාර හා ශික්ෂාකාර යන පංචවිධ චරිතයන්ගෙන් ම පූර්ණත්වයට පත්වන ශිල්පියා හෝ ශිල්පිණිය. ආශා බෝන්ස්ලේ යනු වදනෙහි පරිසමාප්ත අරුතින් ම මෙකී පස්විධ භාවාංගයන්ගෙන් නිසැක ව ම ආඪ්‍යත්වයට පත් වූ ගායනවේදිනියකැයි සංගීතඥ හේමන්ත් කුමාර් වරෙක පවසා ඇත්තේ මේ නිසා.

ඇයගේ සොයුරියගේ ගැයුම් ප්‍රභාවෙන් මෙන් ම ගීතා දත්, ශම්ෂාඩ් බේගම් ආදී භාරතීය පූර්වගාමීන්ගේ ගායනාවලින් ද ආශා නිරන්තර ව ම රසානුභාවය ලැබුවා. එපමණක් නොව ඇය එල්විස් ප්‍රෙස්ලි, බිල් හැලේ ආදී විචිත්‍ර බටහිර ගායනවේදීන්ගේ ශෘංගාරෝත්පාදනීය අභිවහනයත් (Romantic playfulness) බ්ලූස් හා ජෑස් ගායිකාවක වූ කෝරාවෝල්ටන් (කොකෝකෝ ටේලර්ගේ) ගායන ශෛලිය තුළත් වූ උද්වේගකර නාටකීයත්වය (provacative dramatization) හා බැඳුණු තානමය ශිල්පෝපක්‍රමත් (Tonal techniques) මනාව අධ්‍යයනය කළා. පසුකලෙක නන්විධ සංගීත ශානර රැසක් සමඟ අතිශය ආත්මබද්ධ ව ගයන ආශා බෝන්ස්ලේ කෙනෙකු අපට හමුවන්නේ මේ නිසා.

මේවා වියරණමය බසින් පසුකලෙක වෛෂයික ස්වරූපයෙන් ඇය තුළ බල ගැන්වූයේ ජීවිතය යළි අරඹද්දී ඇයට හමු වන ප්‍රේමවන්තයා වූ සංගීතඥ රාහුල් දේව් බර්මන්. සම්මත විරාගත භාරතීය තානිකත්වයෙන් ඔබ්බට ඇයගේ කටහඬ බහුතානිකත්වය (polytonality) කරා ඔහු කැඳවාගෙන ගියා. 'karavan' වැනි චිත්‍රපට ඊට කදිම නිදසුන්.

හින්දි සිනමාවට ඇය පළ කළ අතුල්‍ය භාවවාහී සම්ප්‍රදායට වෙනුවෙන් හත්වතාවක් ම ඇයට Filmfare සම්මානය පිරිනැමුණා. එමෙන් ම ආශා Dadasaheb Phalke සම්මානයෙන් ද පිදුම් ලැබුවා. ඒ වෙනුවෙන් භාරතීය මහා රංගධර දිලීප් කුමාර් පැවසුවේ බහුරූපී සංගීත සංස්කෘති රැසක අනුනාදය භාරතීය සිනමා සෞන්දර්යට යම් න්‍යායික සුජාත බවකින් පිරිනැමීමේ මහරු කාර්යය ඇයගෙන් සොඳුරු ලෙස ඉටු ව ඇති බව.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු), මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

කාර්යක්ෂමතා කඩඉම් හා උසස්වීම් විභාග සඳහා ද අත්වැලක් සපයමින් පාඨක දැනුම් කෙත අස්වද්දන්නට 'දෙසතිය' ගන්නා වූ වෑයමේ මේ තවත් දිගහැරුමකි. විශේෂයෙන් ජුනි මාසයේ රාජ්‍ය සේවයේ තනතුරු කිහිපයකට ම අදාළ ව කඩඉම් විභාග පැවැත්වෙන බැවින් ඒවාට සූදානම් වන්නන්ටත් පොදුවේ මේ ලිපි මාලාවෙන් තම වෘත්තීය ජීවිතය සාර්ථක කරගැනීමට දැනුම එකතු කරගන්නා සැමටත් මේ ප්‍රශ්නෝත්තර මාලාව ස්වකීය අරමුණට අත්වැලක් වනු ඇත.

**01) කාර්යාලයක් 'සැලසුම් කිරීම' යන්නට අදාළ වන ප්‍රධාන පියවර 03ක් ලියන්න.**

- කාර්යාලය පිහිටන ස්ථානය තීරණය කිරීම
- කාර්යාලයේ අභ්‍යන්තර පරිසරය සැකසීම
- කාර්යාල පිරිසැකැස්ම (Lay out) සැකසීම

**02) කාර්යාලයක කටයුතු කිරීමේදී 'ලිපි ගොනු' අනිවාර්යයෙන් ම වැදගත් වේ. 100%ක් ම ලිපි ගොනු රහිත කාර්යාලයක් නොමැති වුවත් නූතන තාක්ෂණය උපයෝගි කරගනිමින් ඒ කාර්යය ම වඩාත් ඵලදායී ව හා කාර්යක්ෂම ව සිදු කිරීමට වෙනත් ක්‍රියාමාර්ග කෙරෙහි ද වර්තමානයේ අවධානය යොමු වෙමින් පවතී. කෙසේ වෙතත් තවමත් කාර්යාලයක 'ලිපි ගොනු' යනු අත්‍යවශ්‍ය ම මෙවලමකි. හොඳ ලිපි ගොනු ක්‍රමයක දැක ගත හැකි ගුණාංග 05ක් ලියන්න.**

- සංක්ෂිප්ත බව (අනවශ්‍ය පරිදි විශාල නොවීම)
- භාවිතය පහසුවීම
- ලියකියවිලිවල ආරක්ෂාව හොඳින් තිබීම
- පහසුවෙන් සොයා ගත හැකි වීම
- නම්‍යශීලී වීම

**03. රජයේ නිලධාරියෙක් සම්බන්ධයෙන් පවත්වාගෙන යන චර්යා සටහන් පත්‍රය වෙනුවෙන් භාවිත කරන පොදු ආකෘති වර්ග කිහිපයක් ඇත. පහත සඳහන් එක් එක් පොදු ආකෘතිය භාවිත කරන්නේ කවුරුන් වෙනුවෙන් ද යන වග වෙන වෙන ම දක්වන්න**

- පොදු 53 අ - විශ්‍රාම වැටුප් හිමි ස්ථිර නිලධාරීන්
- පොදු 234 - මාසික වැටුප් ලබන නිලධාරීන්
- පොදු 226 අ - දෛනික වැටුප් නිලධාරීන්

**04. රජයේ නිලධාරියෙකුට ප්‍රශංසා සහ දෝෂ දර්ශන නිකුත් කිරීමේදී ඒ සඳහා යොදා ගත හැකි පොදු ආකෘති පත්‍රය කුමක්ද?**

- පොදු 230 ආ

**05. රජයේ නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපි ගොනුවක් තබා ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු ප්‍රධාන බලධාරීන් වර්ග දෙක නම් කරන්න.**

- නිලධාරියා පත් කරන බලධාරියා
- නිලධාරියා සේවය යොදවන බලධාරියා

**06. විශ්‍රාම යාම නිසා හෝ සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීම නිසා හෝ රජයේ සේවයෙන් ඉවත් ව යන නිලධාරියකුට නිකුත් කළ හැකි සේවා සහතිකයක අඩංගු විය යුතු කරුණු හතරක් ලියන්න**

- නිලධාරියාගේ නම
- රජය යටතේ සේවය කළ කාලසීමාව/ සේවය කළ කාලපරිච්ඡේද
- දැරූ තනතුර හෝ තනතුරු
- සේවය කළ දෙපාර්තමේන්තු හා ආයතන
- රජයේ සේවයෙන් ඉවත්වීමට හේතුව
- සාමාන්‍ය කාර්යක්ෂමතාව
- සාමාන්‍ය හැසිරීම

**07. රජයේ නිලධාරීන් සිදුකරන වැරදි ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට ගොනු කළ හැකි ය. ඒ මොනවාද?**

- පළමු උපලේඛනයේ වැරදි (බරපතළ වැරදි)
- දෙවන උපලේඛනයේ වැරදි (සුළු වැරදි)

**08. රජයේ නිවාස ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදිය හැකි ය. ඒ මොනවාද?**

- උපලේඛනගත නිවාස
- පොදු සේවා නිවාස

**09. රජයේ නිලධරයෙකුට ඉකුත් නිවාඩු ලබාගත හැකි අවස්ථා ලියන්න.**

- නිලධාරියාගේ අසනීපයකට
- පවුලේ අයකුගේ අසනීපයකට
- පවුලේ අයකුගේ මරණයට
- ඉහත කුමක් හෝ වෙනුවෙන් වන ආගමික උත්සවයකට

- නිලධරයාගේ විවාහයට
- පවුලේ අයෙකුට බෝවන රෝගයක් වැලඳීම
- රාජකාරි නොවන කටයුත්තකට සිතාසි පිට උසාවි යාමට

**10. ආශ්‍රය ගොනු (Reference File) වර්ග 05ක් ලියන්න.**

- ප්‍රතිපත්ති ගොනු
- චක්‍රලේඛ හා උපදෙස් ගොනු
- පූර්වාදර්ශ ගොනු
- කාර්ය පටිපාටි ගොනු
- තොරතුරු හා වාර්තා ගොනු

**11. පූර්වාදර්ශ ගොනු යනු මොනවා ද?**

- කිසියම් විෂයයක් සම්බන්ධයෙන් විශේෂ අවස්ථාවලදී ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳ සඳහන් කර ඇති ගොනු

**12. අය වැය ඇස්තමේන්තුවක (මුදල් වර්ෂයක් සඳහා) ඇතුළත් දෑ මොනවා ද?**

- ආදායම් පිළිබඳ ඇස්තමේන්තු
- වියදම් පිළිබඳ පොදු ඇස්තමේන්තු
- අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ ඇස්තමේන්තු
- රාජ්‍ය සේවක වැටුප් පරිමාණ

**13 වීරමොං ක්‍රියා පටිපාටිය තුළ භාවිත වන පොදු ආකෘති පත්‍ර වර්ග 02ක් ලියන්න.**

- පොදු 271
- පොදු 233

**14. ආයතන සංග්‍රහය භාවිතයේදී ඇති වන අර්ථ නිරූපණ ගැටලු හෝ සැක උපදවන තැන් හා වෙනත් ගැටලු හෝ කවුරුන් වෙත යොමු කළ යුතු ද?**

- ආයතන අධ්‍යක්ෂ ජනරාල්

**15. රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබ, ආයතනයක සේවයට වාර්තා කළ නවක නිලධරයකු සම්බන්ධ ව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා කළ යුතු මූලික ම කාර්ය අතරින් 03ක් ලියන්න.**

- එම නිලධරයා යම් අංශයකට හෝ ඒකකයකට හෝ අනුයුක්ත කිරීම
- එම නිලධරයාට රාජකාරි ලැයිස්තුවක් ලබා දීම
- එම නිලධරයා සම්බන්ධ ව පෞද්ගලික ලිපි ගොනුව ආරම්භ කිරීම

**16 රජයේ කාර්යාලයක විනාශ කරන එක් එක් ලේඛන සම්බන්ධ ව පවත්වාගෙන යන ලේඛනයක අඩංගු විය යුතු කරුණු මොනවා ද?**

- ලේඛනය නොහොත් ලිපි ගොනුවේ අංකය හා දිනය
- විෂයය
- ඊට අදාළ කාල පරිච්ඡේදය
- එහි අඩංගු කරුණු එදිනෙදා කාර්ය පිළිබඳ ඒවා නොවේ නම් ඒ පිළිබඳ සාරාංශයක්
- විනාශ කර යැවීමට බලය දුන් ලිපි ගොනුව
- විනාශ කර දැමූ පිළිවෙළ
- විනාශ කර දැමූ දිනය

**17. ලිපි ගොනු පවත්වාගෙන යන ස්ථානය අනුව වර්ග කළ හැකි ආකාර**

- මධ්‍යගත ලිපි ගොනුකරණය
- විමධ්‍යගත ලිපි ගොනුකරණය

**18. මධ්‍යගත ලිපි ගොනුකරණයේ වාසි හා අවාසි**

**වාසි**

- විශේෂඥතාව වැඩිදියුණු වන පරිදි කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට පහසු වීම.
- එක ම කරුණට දෙතුන් වරක් ගොනු විවෘත කිරීමට සිදු වන අවස්ථා මඟ හැරීම.
- පුනරුත්දෝෂ වළක්වා ගත හැකි වීම.
- එක ම ආකාරයකට ගොනු පවත්වාගෙන යා හැකි වීම.
- අධීක්ෂණය පහසු වීම.
- ස්ථානගත කිරීම හා සොයා ගැනීම පහසු වීම.

**අවාසි**

- වෙන වෙන ම ගොනු අවශ්‍ය විටදී පරිහරණය අපහසු වීම.
- එක ම ස්ථානයක පවත්වාගෙන යන නිසා අමතර කාලයක් ගත වීම.
- කනිෂ්ඨ සේවකයන්ට පුහුණුවක් ලැබීමට අවස්ථාව මඟහැරීම.
- වෙන ම කාර්ය මණ්ඩලයක් යෙදවීමට සිදු වීම.
- ආයතන විශාලවත්ම ගොනු මධ්‍යගත ස්ථානයක තිබීම කාර්යාලයීය වැඩ කටයුතු කරගෙන යාමේදී දැඩි දුෂ්කරතාවලට හේතු වීම.

**19. විමධ්‍යගත ලිපි ගොනුකරණයේ වාසි හා අවාසි**

**වාසි**

- එක් එක් ශාඛා හෝ අදාළ අංශයේ ම හෝ විෂය භාර නිලධරයන් ලිපි ගොනු පවත්වාගෙන යාම නිසා කාලය ඉතිරි වීම.
- ලිපි ගොනු පරිහරණය පහසු වීම.
- නිවැරදි ව ලිපි ගොනු පවත්වාගෙන යාමට ඉඩකඩ ලැබීම.
- පහසුවෙන් අවශ්‍ය අවස්ථාවලදී සොයා ගත හැකි වීම.
- ලබා ගැනීම පහසු වීම.
- වෙන ම කාර්ය මණ්ඩලයක් අවශ්‍ය නොවන නිසා පිරිවැය අඩු වීම.
- කනිෂ්ඨ නිලධාරින්ට ද ලිපි ගොනුකරණය පිළිබඳ දැනුමක් ලබා ගැනීමට අවස්ථාව ලැබීම.

**අවාසි**

- එක ම කරුණට නැවත නැවත ලිපි ගොනු විවෘත කිරීම සිදුවීම. එනම් පුනරුත්දෝෂ ඇති වීම.
- ප්‍රමිතියකට අනුව ලිපි ගොනු පවත්වාගෙන යාමට ඇති ඉඩකඩ සීමිත වීම.
- විශේෂඥතාව ලැබීමට ඇති අවස්ථා මඟ හැරීම.
- අනවශ්‍ය පරිදි වාර්තා පවත්වාගෙන යාමට සිදු වීම.
- අධීක්ෂණය හා පාලනය අපහසු වීම.



# මතක හිටින පරිවර්තනයක්

රා. මු. නිශ්ශංක

ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනයට නව පරිවර්තන කමිටුවක් පත් වී තිබෙනවා. එයට පැවරී තිබෙන්නේ පිටතින් පෙනෙන වගකීම් සහ පිටතින් නොපෙනෙන වගකීම් භාර ක්‍රියාවලියක්. සනාථ නොවුණු චෝදනා රැසක් වැරදි හැටියට ගෙන හිටපු පරිපාලනයට එල්ල කළ චෝදනාවල සත්‍ය අසත්‍යතාව විමසා බැලීම සහ හෙළිදරව් කිරීමයි ඊට පැවරී ඇති ප්‍රධාන වගකීම.

පැවති පරිපාලනය යටතේ සම්පත් බෙදී යාම පැවතුණේ විමධ්‍යගත ව. ඒ නිසා ම අලුත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලයට විවිධ පළාත්වලින් පොම්ප කරමින් තිබුණා. මේ යථාර්ථය මත පිහිටා ගමට යොමු ව ඇති ගමේ ක්‍රීඩක නියෝජනයට අමතර ව ඡන්ද බලය අඩු කරන්නට තිබෙන යෝජනාවෙන් ගමට පරිපාලනය යාමේ ඉඩ තවදුරටත් අඩු කරනවා ද යන්න පරිවර්තන කමිටුව කල්පනාවට ගත යුතු කාරණයක්. ගම පදනම් කරගෙන සහ ගමේ පහළ මට්ටමේ සමාජ නියෝජනයේ බලාපොරොත්තු පදනම් කර ගනිමින් ක්‍රියාත්මක ආණ්ඩුවකට ද මේ මොහොතේ පොළොවේ ක්‍රිකට් තිබෙන හැටි, පරිවර්තන කමිටුවට ඒ සඳහා කරන බලපෑම නොසලකා හරින්නට බැහැ.

මේවා ගැන සැලකිල්ල යොමු කරන විට ක්‍රිකට් පරිවර්තන කමිටුවට පැවරෙන වගකීම පහසු නැහැ. ඊට පත් කර තිබෙන කණ්ඩායමේ සංයුතිය බෙදා දැක්වීම සිදු වී තිබුණේ ද අපූරු ආකාරයකට. සභාපති එරාන් වික්‍රමරත්නගේ ක්‍රිකට් ගැහිල්ල ගැන කතා කළ ද එය අයත් වන්නේ 70 දශකයට. එහෙත් ඔහු කළමනාකරණයේදී සිටින්නේ නවමු මානයන් සම්බන්ධ ඉවක් ඇති ව. ඒ නිසා ක්‍රිකට් රහ සමඟ අවසාන පරිපාලන තීන්දුව සකස් කිරීමට එරාන්ට පැවරෙනු ඇති. එහි සභාපති පදවිය ඔහුට හිමිවීමෙන් සංකේත වන්නේ ද එය. එම කාර්යයේදී ප්‍රකාශ් පාස්ටර්ට හිමි වන්නේ ද වැදගත් වැඩ කොටසක්.

උපුල් කුමාරප්පෙරුම සහ ඩිනාල් පිලිප්ස් මෙහිදී නීතිමය වශයෙන් මේ වෙනස්කම් සමාජගත කරන්නට අවශ්‍ය නීතිමය තත්ත්වය සාකච්ඡාවට ගන්නවා ඇති. මෙහිදී උපුල් කුමාරප්පෙරුම යනු දේශපාලනික ව ද සමාජය කියවාගෙන ඇති, වෘත්තීය මට්ටමෙන් ඉහළ සමාජ සංස්ථාවත් දේශපාලන භාවිතාවේදී සමාජයේ සෑම ස්ථරයක්මත් ස්පර්ශ කර ඇති අයෙක්. මෙහි ඇති පුද්ගල සම්බන්ධතා පිළිබඳ ගැටලු ආදිය නිසා නව වෙනස්කම් නීතිය ඉදිරියේ ගැටෙන්නට ඇති අවස්ථා සහ රාජ්‍ය දේශපාලනය ඉදිරියේ ගැටෙන්නට හැකි අවස්ථා පාලනය කිරීමේ වගකීමේදී කුමාරප්පෙරුමට පැවරෙන්නේ විශාල වගකීමක්.

තුසිර රූඳල්ල සහ අවන්ති කොළඹගේගේ පත්කිරීම් වැදගත් වන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් යනු යම් ආකාරයකින් රටේ ක්‍රීඩා පනතට වගකීමට බැඳුණ ද එය සමාගම් පනත යටතේ ද ආයතනයක් ලෙස ක්‍රියා කරන බැවින්. මෙහිදී වඩා

වැදගත් කොටස පැවරෙනු ඇත්තේ සිදත් වෙත්තමුනි, කුමාර් සංගක්කාර සහ රොෂාන් මහානාම යටතට. ඒ, ක්‍රීඩාව ගුණාත්මක සංවර්ධනයක් කරා යොමු කරන්නේ කෙසේද යන්න සිතා බැලීමට. ඔවුන් තිදෙනාට ම ක්‍රීඩකයන් ලෙස ක්‍රීඩාවේ නියැළීමේදී උපයාගත් අත්දැකීම වැදගත් වනු ඇති. සිදත් ක්‍රීඩා කරන කාලයේ සිදු වූ දකුණු අප්‍රිකානු ක්‍රීඩා සංචාරය නිසා එවකට ශ්‍රී ලංකාවේ සිටි ප්‍රබල ක්‍රීඩකයෙක් ඔහු. එවකට පරිපාලනය සහ ක්‍රීඩාව අතර තිබුණු සබඳතාවල බිඳුණු තැන දන්නේ ද ඔහු.

රොෂාන් මහානාම 96 ලෝක ශූරතාව දිනූ කණ්ඩායමේ සාමාජිකයෙක්. ජාත්‍යන්තර තරග තීරකයෙකු ව සිටි අත්දැකීම් ආදිය පසෙකට කර බලන විට මහානාම සතු ව ඇති වැදගත් ම කාරණය වන්නේ ඔහුගේ ක්‍රීඩා කාලයේ කණ්ඩායම් ඇතුළත ක්‍රීඩකයන් පවත්වාගෙන ගිය අධිකාරිය මෙන් ම පරිපාලනය පවත්වාගෙන ගිය ක්‍රියාවන් ද ගත් විට ඒවා ක්‍රිකට්වලට බල පෑ ආකාරය. 96 ජයේ සිට 99 ඛේදනීය පරාජය ගැන අත්දැකීම් ඊට බෙහෙවින් බලපානු ඇති.

සංගක්කාර ලෝක අනුශූරතාව ලැබූ කණ්ඩායමක නායකයා මෙන් ම ලෝක ශූරතාව දිනූ කණ්ඩායමක සාමාජිකයෙක්. එම අවස්ථාවල පරිපාලනය කළ කී දේ ද ඔහු දන්නවා. ලෝක ශූරතාවක් පැවත් වූ රටක පරිපාලනය වැටුප් ගෙවා ගන්න නොහැකි තත්ත්වයට පත්වන හැටි ඔහු විඳ ඇති. ඊට සපේක්ෂ ව බැලුවහොත් මූල්‍යමය තත්ත්වය යහපත් ආයතනයක් තිබීම සහ එය නිවැරදි ව කළමනාකරණය කරන හැටි, ක්‍රිකට් ක්‍රීඩාව කළමනාකරණය කරන හැටි යෝජනා කිරීමට ලැබීම ද එක්තරා ආකාරයක යහපත් තත්ත්වයක් ය යන්න සංගක්කාරට කල්පනා වනු ඇති. එසේ ම මහනුවරින් පැමිණි ක්‍රීඩකයෙකු ලෙස ක්‍රිකට් දෙස බැලීමේදී මහනුවර ක්‍රීඩකයෙකුට පමණක් නොව වෙනත් පළාතක ක්‍රිකට් ක්‍රීඩකයෙකුට, ක්‍රීඩිකාවකට ද ජාතික කණ්ඩායමට එන්නට තිබෙන මඟ පුළුල් ව තිබෙන බව ඔහු තේරුම් ගනු ඇති.

එහෙත් සංගක්කාරගේ කාලයේ මෙන් ඉහළ මට්ටමේ ක්‍රීඩා කරන්නට කොළඹ එන්නට සිදු වීම වළක්වා ගන්නේ කෙසේ ද? යන්න සහ පරිපාලනමය වශයෙන් වගකීමක් වන ඡන්ද බලය සහ පරිපාලන භූමිකා ජාතික මට්ටමෙන් ගමට හැරවෙන ඉඩ මදි බව ද ඔහුට පෙන්වා දිය හැකියි. ඒ, ඔහුගේ කාලය මෙන් ම ඊට පෙර කාලය ද වර්තමානය ද සැලකිල්ලට ගනිමින්.

'කොළඹින් බැහැර ක්‍රිකට් සුවිශේෂ වන තැනක්' යන්න ක්‍රිකට් පරිවර්තනයේදී කමිටුවට අත් නොහැරිය හැකි තැනකට පත් ව තිබෙන බව අවිවාදිතයි. එහි පෙනුම වඩා තාර්කික ව කල්පනා කර 'ගමේ ක්‍රිකට්වලට වඩා පොහොසත් සහ වැදගත් පෙනුමක් ලබා දෙන තැනක්'ලෙස එය පරිවර්තනය කරන්නේ කෙසේද යන්නත් හෙට දවසේ ක්‍රිකට්හි පැවත්මට අතිශයින් වැදගත්.

**පැවති පරිපාලනය යටතේ සම්පත් බෙදී යාම පැවතුණේ විමධ්‍යගත ව. ඒ නිසා ම අලුත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලයට විවිධ පළාත්වලින් පොම්ප කරමින් තිබුණා. මේ යථාර්ථය මත පිහිටා ගමට යොමු ව ඇති ගමේ ක්‍රීඩක නියෝජනයට අමතර ව ඡන්ද බලය අඩු කරන්නට තිබෙන යෝජනාවෙන් ගමට පරිපාලනය යාමේ ඉඩ තවදුරටත් අඩු කරනවා ද යන්න පරිවර්තන කමිටුව කල්පනාවට ගත යුතු කාරණයක්.**

ශ්‍රී ලංකා අවුරුදු 19න් පහළ කාන්තා කණ්ඩායම ඕස්ට්‍රේලියාවේ සංචාරය කරන ලද අතර එහිදී ජයග්‍රාහී දස්කම් දැක් වූ ශ්‍රී ලංකා කණ්ඩායමට පළාත් අටකින් ක්‍රීඩිකාවන් තේරී පත් ව සිටියා. එහිදී කාන්තා ජාතික කණ්ඩායමට කන්තලේ රජඇලෙන් එක් වූ මිතලි අයෝධ්‍යා ද සම්පත් බෙදී යාම සහ දක්ෂයාට විවෘත ව රටේ ක්‍රිකට් පවතින බවට හොඳ උදහරණයක්.

නව පරිපාලනය ස්ථාපිත වීමත් සමඟ මේ ගැන ක්‍රියා කරන්නට සහ එහි අඩුපාඩු ඇත්නම් නිවැරදි කර දියුණු කරන්නට පෙළඹවීම වෙනුවට නව පෙළඹවීමක් ඇති කරමින් මේ ව්‍යුහයේ විවෘතභාවය හකුළා දමන්නට සීමා මායිම් ලකුණු කරමින් සිටින බව පෙනෙන්නට තිබෙනවා. එය පරිවර්තන කමිටුව නොමඟ යවන්නට, ඊට සොඳුරු ආකාරයට වැරදි බලපෑමක් කරන්නට උත්සාහ දරන අසුන්දර වැඩපිළිවෙළක්.

වර්තමානයේ රටේ ක්‍රිකට්හි ඉහළ ස්ථරය සහ පුහුණුව වැනි කරුණු අපට කියවා ගන්නට වන්නේ මීට දශක දෙකකට ආසන්න අතීතයට බලපාන පරිදි. එහිදී එකල දක්ෂයාට, ක්‍රිකට් නැණවතාට මේ තරම් ලෝකයට විවෘත වන්නට ඉඩ සැකසී තිබුණේ නැහැ. ඔවුන් තුළ තිබෙන දක්ෂතාවේ යථාර්ථය ක්‍රීඩක භූමිකාවක් ලෙස නොවී වෙනත් වෘත්තීන් ලෙස පිටට එමින් තිබෙන බවක් සහ ඔවුන්ට ලෝකය විවර වෙන බවක් දකින්නට තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩිකාවන් නිර්මාණය කරන ගමේ පුහුණුකරුවන්, ක්‍රිකට් පහසුකම් සහ අවස්ථා නොමැති ව ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදුණු එස්. කේ. රංජිත් කුමාර් නම් තරුණයෙකු මඟ පෙන්වන්නෙක් වෙමින් ලෝකයට හඳුන්වා දුන් ඒෂාන් මාලිංග ඊට උදාහරණ. අද රංජිත් රත්නපුර ක්‍රිකට් උප සභාපතිවරයෙක්. එවැනි තත්ත්ව නොසලකා ඒ පළාත්වල ද වගකීමක් දරන්නට පළමු පෙළ ක්‍රිකට් අවශ්‍ය වන බවට පරිවර්තන කමිටුවෙන් පරිවර්තනයක් කර ගන්නට ද ඇතැමුන් උත්සාහ කරමින් සිටිනවා.

මේ නිසා ඇතැම් පිරිස් යම් පංතිමය සීමාවක ක්‍රිකට් අයිතිය සහ වගකීම රඳවා ගැනීමේ උත්සාහය ද ක්‍රිකට් ක්‍රීඩාව ගමට ගියත් සම්පූර්ණයෙන් පාලනය ගමට නොගිය ප්‍රභූ නියෝජනයේ බලපෑම ද පරිවර්තන කමිටුවට බලපෑමක් වන්නට පුළුවන්. චිත්‍රසිරි කමිටුව යෝජනා ඉදිරිපත් කරන්නේ කුමන ශානරයක අදහස් විමසා බැලීමෙන් ද යන්න මෙහිදී විමසිල්ලට ගත යුතු වෙනවා. මේ සියල්ල සලකා බලා ක්‍රිකට් පරිවර්තනයට යාමෙන් මෙපිට ක්‍රිකට් අලුත් වීම නොව පරණ වීම ද සිදු විය හැකියි. ඒ නිසා කල්පනාවෙන්, වුවමනාවෙන් මේ කාරණය වෙනස් වීම මෙන් ම අලුත් වීම ද සිදු විය යුතු අතර ඒ, අලුත් මුහුණුවල දීප්තිය පිටියට මෙන් ම පිටියෙන් පිටතට ද එකතු වන ව්‍යුහයක.

# ඇල් දිය උණු බොර දිය සන

අප දැස් ඉදිරියෙන් ගලා බසින නිල් වන් දිය දහර බොර පැහැ ගැන්වෙන්නේ නම් එහි වරද ඇත්තේ අහසින් ඇද වැටෙන වැස්සේ පමණක් වන්නට බැහැ. කඳු මුදුන් කපා, හෙළා කෙරෙන අනවසර ඉදි කිරීම්, සංවර්ධනයේ මුවාවෙන් කාලයක් තිස්සේ කරන ලද අවිධිමත් හා තිරසර නොවූ වැඩසටහන් පවා එකී නිල් දිය අවපැහැ ගැන්වීමට හේතු වූවා විය හැකියි. දිගු කාලයක් තිස්සේ මහ පොළොව මත කරන ලද අනිසි අභ්‍යාස අත්හිටු වූ පමණින් අද දවසේ අත්දකින ඒවායේ ප්‍රතිවිපාක අතුරුදහන් නොවනු ඇති. රැයකින් සියල්ල වෙනස් නොවනු ඇති. එහෙත් මේ මොහොතේ සාධනීය හෙට දවසක් වෙනුවෙන් පළමු පියවර තැබිය හැකියි.

මහපොළොව, අහස, ඉර-හඳ-තරු, ගහ-කොළ, ඇළ-දොළ, සතා-සිවුපාවුන් යනු තනි පුද්ගල අයිතියට පවරා දෙන්නට බැහැ. ඒ කිසිවක් ස්වායත්ත වන්නේ ද නැහැ. අප එකිනෙකා මත යැපෙන හා පවතින පද්ධතියක් පමණයි. විටෙක සමස්ත පද්ධතියේ සංඝටකයක් පමණක් වන අප තවත් විටෙක කේන්ද්‍රයේ තාවකාලික භාරකරුවන් ද විය හැකියි. වෙනස එපමණයි.

ඡායාරූපය සහ සටහන
**ප්‍රියාන් ආර් විජේබණ්ඩාර**




දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-